සම සෞඛ්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ 8 වන පීඨය ලෙස 2019 දී ආරම්භ කරන ලදී. වෛද්‍ය විද්‍යා පීඨයේ සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය යටතේ වසර 15 කට ආසන්න කාලයක් තිස්සේ පවත්වන ලද උපාධි පාඨමාලා මේ වන විට අලුතින් පිහිටුව ලද මෙම පීඨය යටතේ පවත්වා ගෙන යනු ලබයි. හෙද හා වින්නඹු මාතා, ඖෂධවේද හා වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශ මේ යටතේ පිහිටුවා ඇත. අනාගතයේ දී සම සෞඛ්‍ය විද්‍යා පීඨයට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ඉහල නැන්වීමටත් නව පාඨමාලා හඳුන්වා දීමටත් බලාපොරොත්තුවේ. දෘෂ්ටි වේදය එවැනි නව උපාධි පාඨමාලාවකි විද්‍යා වේදී දෘෂ්ටිවේදය පළමු වරට රාජ්‍ය විශ්ව විද්‍යාලයක් විසින් ලබා දෙන දෘෂ්ටි විද්‍යාව පිළිබඳ උපාධියයි.

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වර්තමාන අධ්‍යයනාංශ හා අධ්‍යයනාංශ ප්‍රධානීන් පහත පරිදි වේ.

| අධ්‍යයනාංශය | අධ්‍යයනාංශ ප්‍රධාන |
|---|---|
| 1.හෙද හා වින්නඹු මාතා අධ්‍යයනාංශය | එස්.එම්.කේ.එස්. සෙනවිරත්න මෙනවිය |
| 2.ඖෂධ වේදය හා ඖෂධ විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එම්.ඩී.ජේ.විජේබන්ඩාර මහතා |
| 3. වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ඩී.අයි.උළුවඩුගේ මහත්මිය |
| 4.මූලික විද්‍යා අධ්‍යයනාංශය | කාර්ය මණ්ඩලය බඳවා ගැනීම අපේක්ෂිතය |

## පීඨය මගින් පිරිනමන උපාධි

උපාධි

1. විද්‍යා වේදී හෙද (ගෞරව) උපාධිය
2. ඖෂධවේදී (ගෞරව) උපාධිය
3. විද්‍යා වේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය

## පීඨය මගින් නිකුත් කළ ප්‍රථිඵල විස්තර

| උපාධිය | පළමු පෙළ | දෙවන පෙළ ඉහල | දෙවන පෙළ පහළ | සමත් | සමත් මුළ ගණන |
|---|---|---|---|---|---|
| විද්‍යා වේදී හෙද (ගෞරව) උපාධිය | 01 | 04 | 05 | 13 | 23 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | - | 03 | 15 | 04 | 22 |

| | | | | | |
|---|---|---|---|---|---|
| විද්‍යා වේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | **04** | **10** | **07** | **04** | **25** |
| **එකතුව** | **05** | **17** | **27** | **21** | |

## 2018 හා 2019 වසර ප්‍රතිඵල සංසන්දනය

| **පීඨය විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල සමාලෝචනය 2018 -2019 වසර** | **ප්‍රථම පන්තිය** | | **දෙවන පෙළ ඉහල** | | **දෙවන පෙළ පහල** | | **සාමාන්‍ය සාමාර්ථ** | | **සමත්වූ සම්පූර්ණ සංඛ්‍යාව** | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2018 වසර** | **2019 වසර** | **2018 වසර** | **2019 වසර** | **2018 වසර** | | **2018 වසර** | **2019 වසර** | **2018 වසර** | **2019 වසර** |
| විද්‍යා වේදී හෙද (ගෞරව) උපාධිය | - | 01 | 13 | 04 | 09 | 04 | 19 | 13 | 41 | 22 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | 01 | - | 03 | 03 | 13 | 03 | 22 | 09 | 39 | 15 |
| විද්‍යා වේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | - | 04 | 10 | 10 | 03 | 08 | 08 | 06 | 21 | 28 |
| එකතුව | **01** | **05** | **26** | **17** | **25** | **15** | **49** | **28** | **101** | **65** |

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය

| උපාධිය | **මුලු ශිෂ්‍ය සංඛ්‍යාව** | **මුලු අධ්‍යයන කාර්යමන්ඩලය** | **අනධ්‍යයන කාර්යමන්ඩලය** |
|---|---|---|---|
| විද්‍යා වේදී හෙද (ගෞරව) උපාධිය | **88** | **11** | **04** |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | **95** | **12** | **07** |
| විද්‍යා වේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | **105** | **07** | **11** |
| **එකතුව** | **288** | **30** | **22** |

## පීඨයේ දේශිය ශිෂ්‍ය විස්තරය

| උපාධිය | මාධ්‍යය | ශිෂ්‍ය සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | | **1** වන | **2** වන | **3** වන | **4** වන | උපාධිධා රීන් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| විද්‍යා වේදී හෙද (ගෞරව) උපාධිය | | 25 | 23 | 21 | 19 | 22 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | | 23 | 23 | 26 | 23 | 15 |
| විද්‍යා වේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | ඉංග්‍රීසි | 24 | 29 | 27 | 25 | 28 |
| එකතුව | | **72** | **75** | **74** | **67** | **65** |

## පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

| අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | තාවකාලික කථිකාචාර්ය | උපදේශක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| හෙද හා වින්නඹු මාතා අධ්‍යයනාංශය දෙපාර්තමේන්තුව | - | - | - | 04 | 01 | 06 | - | - | 11 |
| ඖෂධවේදී හා ඖෂධ විද්‍යා අධ්‍යයනාංශය | - | - | - | 08 | - | 02 | - | - | 10 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය | - | - | - | 04 | - | 03 | - | - | 07 |
| එකතුව | **-** | **-** | **-** | **16** | **01** | **11** | **-** | **-** | **28** |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ආචාර්ය උපාධිධාරීන් | | | | | | | | | |

## අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර

| ජ්‍යෙෂ්ඨතම | ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය | කණිෂ්ඨ කාර්යමණ්ඩලය | කණිෂ්ඨ සේවක | එකතුව |
|---|---|---|---|---|
| 03 | 03 | 05 | 13 | 24 |

## සිදුකරන ලද පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන

| විෂය | ප්‍රකාශයට පත්කල | වාණිජකරණයකල | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පර්යේෂණ ප්‍රමාණය | 78 | - | 63 |
| නවෝත්පාදන ප්‍රමානය | 0 | - | 0 |
| ජර්නල් ප්‍රමානය | 13 | - | 0 |
| පොත් ප්‍රමානය | 2 | - | 0 |
| ලිපි ප්‍රමානය | 83 | - | 14 |
| වෙනත්(වෙනත් පර්යේෂන පත්‍රිකා) | 0 | - | 0 |
| එකතුව | **176** | **-** | **77** |

## වැඩසටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | සහභාගීවීම | සම්පූර්ණකළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පශ්චාද් උපාධි වැඩසටහන් ප්‍රමානය | 2 | 2 | - |
| පශ්චාද් උපාධි ඩිප්ලෝමා ප්‍රමානය | - | - | - |
| උපාධි වැඩසටහන් ප්‍රමානය | - | - | - |
| ඩිප්ලෝමා වැඩසටහන් | - | - | - |
| සහතික පත්‍ර පාඨමාලා ප්‍රමානය | - | 4 | - |
| වෙනත් (සම්මන්ත්‍රන, වැඩමුළු සහ සමුළු) | 16 | 0 | - |
| එකතුව | 18 | 6 | - |

## ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර

| විෂය | අධ්‍යයන කාර්යමණ්ඩලය | ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රදාන ප්‍රමානය |
|---|---|---|---|
| දේශිය ප්‍රදාන | 9 | 1 | 10 |
| ජාතික ප්‍රදාන | 3 | 1 | 4 |
| ජාත්‍යාන්තර ප්‍රදාන | 2 | 0 | 2 |
| වෙනත්( විශේෂ ප්‍රදාන, ත්‍යාග සහ රන් පදක්කම්) | 0 | 0 | 0 |
| එකත්වl | **14** | **2** | **16** |

## විභාග අංශය

නියෝජ්‍ය ලේඛකාධිකාරීවරියක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය දොළොස් දෙනෙකුගෙන් සමන්විත විභාග අංශය 2019 වසරේ දී සිදු කරන ලද ප්‍රධාන රාජකාරී පහත පරිදි සංක්ෂිප්ත කළ හැක.

1. වර්ෂාර්ධ පරීක්ෂණවලට අදාල රාජකාරී
2. 45 වන උපාධි ප්‍රදානෝත්සවයට අදාල රාජකාරි
3. උපාධි සහතික නිකුත් කිරීම සහ ඒවායේ තොරතුරු සනාථ කිරීම

**<u>වර්ෂාර්ධ පරීක්ෂණ සඳහා රාජකාරි 2019</u>**

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ (ජනවාරි - මාර්තු 2019 සහ අගෝස්තු -ඔක්තෝබර් 2019) ව්‍යවහාරික විද්‍යා පීඨයේ (ජුනි-ජුලි 2019 සහ දෙසැම්බර් 2019) කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ (මාර්තු-අප්‍රේල් 2019 සහ ඔක්තෝබර්- නොවැම්බර් 2019) සහ තාක්ෂණ පීඨයේ (ජනවාරි - මාර්තු 2019 සහ අගෝස්තු - සැප්තැම්බර් 2019) වර්ෂාර්ධ පරීක්ෂණ වෙනුවෙන් පහත රාජකාරී විභාග අංශය මගින් සිදු කරන ලදි.

- විභාග ප්‍රශ්න පත්‍ර යතුරු ලියනය, මුද්‍රණය, මුද්‍රා තබා ඇසුරුම් කිරීම.
- විභාග ප්‍රශ්න පත්‍ර පැකට් අදාල ශාලාධිපතිවරුන්ට භාර දීම.

- විභාග පිළිතුරු පත්‍ර පැකට් විභාග පරීක්ෂකවරුන්ට භාර දීම.
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ උපාධි අවසන් සිසුන්ගේ නාම ලේඛන සැකසීම සහ එය සනාතන සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීම
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට විභාග ගාස්තු ගෙවීම් සඳහා වන රාජකාරී කටයුතු
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට විභාග ගාස්තු ගෙවීම් සඳහා වන රාජකාරී කටයුතු

<u>විභාග අක්‍රමිකතා කමිටුව සහ අභියාචනා කමිටුව</u>

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 135 (1)(උ) දරණ වගන්තිය යටතේ (සංශෝධන සහිතව) සකස් කරන ලද 1986 අංක 02 දරණ අතුරු ව්‍යවස්ථාවේ විභාග කටයුතු පිළිබඳ නීති රීති, විභාග අක්‍රමිකතා සහ දඬුවම් පිළිබඳ විස්තර කර ඇත.

විභාග අක්‍රමිකතා කමිටුව සහ අභියාචනා කමිටුව විශ්වවිද්‍යාල සනාථන සභාව මගින් පත් කරනු ලැබේ. ඒ අනුව 2019 වසරේ විභාග අක්‍රමිකතා කමිටුව සඳහා මහාචාර්යවරු පස් දෙනෙකු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු දෙදෙනෙකු තේරී පත්ව ඇති අතර විභාග අංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී එම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන ලදී.

2019 වසරේදී විභාග අක්‍රමිකතා කමිටු රැස්වීම් 05ක් සහ එක් අභියාචනා කමිටු රැස්වීමක් පවත්වන ලදී. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ, ව්‍යවහාරික විද්‍යා පීඨයේ, තාක්ෂණ පීඨයේ සිසුන්ගේ සහ සමාජවිද්‍යා හා අපරාධ විද්‍යා ඩිප්ලෝමා සිසුන්ගේ විභාග අක්‍රමිකතා සම්බන්ධ විභාග අක්‍රමිකතා කමිටු වාර්තා විශ්වවිද්‍යාල සනාථන සභාවට යොමු කළ අතර අදාළ තීරණ ක්‍රියාත්මක කරන ලදී.

<u>2019 සැප්තැම්බර් 10 සහ 11 දෙදින පැවැත්වූ **45 වන උපාධි ප්‍රදානෝත්සවය**</u>

45 වන උපාධි ප්‍රදානෝත්සවය වෙනුවෙන් විභාග අංශය මගින් පහත රාජකාරි සිදු කරන ලදී.

- මානවශාස්ත්‍ර හා සමජීයවිද්‍යා පීඨයේ, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ, ව්‍යවහාරික විද්‍යා පීඨයේ උපාධිලාභී නාමලේඛන සකස් කර විශ්වවිද්‍යාල සනාථන සභාවට යොමු කිරීම.
- උපාධිලාභියාට උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත්‍රය විශ්වවිද්‍යාල වෙබ් අඩවිය හරහා බාගත කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- 45 වන උපාධි උත්සවයේ දැන්වීම් පළ කිරීම.

- ඉහත පීඨ තුනෙහි උපාධිලාභීන්ගේ උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත්‍ර 2647ක් භාර ගැනීම හා උපාධිලාභී නාමය උපාධි සහතික පත්‍රයේ (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන්) ලිවීම සහ උපාධි ප්‍රදානෝත්සවයේදීම එය ප්‍රදානය කිරීම.

## 45 වන උපාධි ප්‍රදානෝත්සවයේ දී ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය

අදාළ උපාධිලාභීන් වෙත උපාධි ප්‍රදානෝත්සවයේදී පිරිනැමීමට නියමිත ස්වර්ණ මුද්‍රිකා, ත්‍යාග, ශිෂ්‍යත්ව හා ඊට අදාළ සහතික පත් සම්බන්ධ සියලු කටයුතු විභාග අංශය මගින් සිදු කරන ලදී.

## උපාධි සහතික නිකුත් කිරීම හා සනාථ කිරීම

මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා, සහ ව්‍යවහාරික විද්‍යා යන පීඨයන්හි මෙතෙක් උපාධි සහතික ලබා නොගත් උපාධිධාරීන්ට උපාධි සහතික නිකුත් කිරීම, උපාධිධාරීන්ගේ ඉල්ලීම් අනුව දේශීය හා විදේශීය ආයතන සඳහා විස්තරාත්මක සහ සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම හා දේශීය හා විදේශීය ආයතනවල ඉල්ලීම් අනුව ප්‍රතිඵල සනාථ කර යැවීමේ කටයුතු විභාග අංශය මගින් සිදු කරන ලදී. එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඇතුළු අවසර ලත් විවිධ ආයතන මගින් උපාධිධාරීන්ගේ තොරතුරු ලබාගැනීම සම්බන්ධයෙන් කරනු ලබන විමසීම් සඳහා අවශ්‍ය පරිදි පිළිතුරු සැපයීම ද විභාග අංශය මගින් ඉටු කරන ලදී

## විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය

විශ්ව විද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පහසුකම් රැසක් සපයයි. ඒවාට වෛද්‍ය හා දන්ත ප්‍රතිකාර, පරීක්ෂණ, එන්නත් සහ උපදේශනය ඇතුළත් වේ. ඩෙංගු මර්දන ව්‍යාපාර, පළිබෝධකයන් පාලනය කිරීම සඳහා පළිබෝධ නාශක ඉසීම, විශ්ව විද්‍යාල නේවාසිකාගාර හා ආපනශාලා වල ආහාර පරීක්ෂණ වැඩසටහන්, ජල සාම්පල පරීක්ෂා කිරීම සහ සෞඛ්‍ය හා සමාජීය කරුණු පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම මෙම මධ්‍යස්ථානය මගින් සිදුකරයි.

2019 වර්ෂය තුළ ප්‍රධාන වෛද්‍ය නිලධාරි වෛද්‍ය ශාන්ත හෙට්ටියාරච්චි 2019 අප්‍රේල් මාසයේදී වෛද්‍ය මධ්‍යස්ථානයෙන් ඉල්ලා අස්විය. වෛද්‍ය ඩී.එම්.එල්.ආර්.පෙරේරා මහත්මිය ප්‍රධාන වෛද්‍ය නිලධාරී ලෙස උපකුලපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා පත්කරන ලදී. වෛද්‍ය ඩී.එම.එල්.ආර්.එච්.පෙරේරා මහත්මිය සහ වෛද්‍ය ඩී.පී.ඩී.අසේලගේ මහතා දන්ත වෛද්‍ය ලෙසද සේවය සපයා ඇත.

වෛද්‍ය කේ.ජී.එන්. සෙනවිරත්න මහතා, වෛද්‍යා කේ.ඒ.එම්. හන්දකුඹුර මහතා සහ වෛද්‍ය එස්.එම්.ඩී.ජී.එස්.පෙරේරා ස්ථානීය වෛද්‍ය නිලධාරීන් ලෙස සහ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වෛද්‍ය එස්.එම්.ඩී.ජී.එස්.පෙරේරා වෙනුවට වෛද්‍ය එස්.මාරසිංහ මහතා පත් කරන ලදී.

**2019 වර්සරේ වෛද්‍ය මදයස්ථානයේ සේවා පිළිබඳ සංඛ්‍යාලේඛනය**

| | | |
|---|---|---|
| 1. | ශාරීරික රෝග සඳහා වෛද්‍ය වරුන් පරීක්ෂා කළ රෝගීන් ප්‍රමානය; | **28,428** |
| 2. | ඖෂධාලයෙන් ඖෂධ ලබාගත් රෝගීන් ප්‍රමානය; | **25,215** |
| 3. | හෙද ඒකකය මගින් ප්‍රතිකාර ලැබූ රෝගීන් ප්‍රමානය; | **2,040** |
| 4. | දන්ත සායනයට සහභාගීවූවන් ප්‍රමානය; | **1,693** |

# ශාරීරික අධ්‍යාපන අංශය

## හැඳින්වීම

විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා ක්‍රීඩා ක්‍රියාකාරකමෙහි සැලසුම් කරණය හා ක්‍රියාවට නැංවීමල ක්‍රීඩක ක්‍රීඩිකාවන් තරග 39 ක් සඳහා පුහුණු කරවීම සහ ක්‍රීඩාව හා සම්බන්ධ විෂයන් සංවිධානය කිරීම, ශාරීරික අධ්‍යාපන අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. අන්තර් විශ්වවිද්‍යාල තරග ජාතික ක්‍රීඩා සංගමය හෝ ජාත්‍යන්තරව සංවිධානය කරනු ලබන තරග සඳහා විධිමත් පුහුණුව ලබා දීම සහ විවිධ ක්‍රීඩාවන් සඳහා ක්‍රීඩාපිටි පරිපාලනය සහ නඩත්තුව ශාරීරික අධ්‍යාපන අංශයේ අනෙකුත් කාර්යයන් වේ.

එන්.නිශාන්ති විදානගේ මහත්මිය ශාරීරික අධ්‍යාපන අංශයේ වර්තමාන ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂිකා වේ. ස්ථිර ක්‍රීඩා උපදේශකයන් ලෙස රමණී කුලතිලක මහත්මිය , එම්.ජී.එස්.එස්. කීර්තිරත්න මහතා, එච්.එල්.එල්.දිලංකර මහතා,බී.එන්.එම්.පෙරේරා මහතා සහ එල්.ඒ.ඩී.ප්‍රියදර්ශණ මහතා සිය සේවය ලබා දෙන අතර බී.එම්.සී.එන්.නිරෝෂණ මහතා ශාරීරික අධ්‍යාපන අංශයේ තාවකාලික උපදේශකවරයකු ලෙස සේවය කරයි.

## ශාරීරික අධ්‍යාපන අංශයේ අරමුණු

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශාරීරික අධ්‍යාපනයේ වටිනාකම් පිළිබඳව අවබෝධයක් ලබා දීම හා මානසික සංවර්ධනය තුළින් කායික සංවර්ධනය ඇති කිරීම
2. ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ හැකියාවන්හි වැඩි දියුණුව සඳහා අවස්ථාවක් ලබා දීම
3. අභ්‍යන්තර හා බාහිර ක්‍රීඩා සංගම් සමඟ ක්‍රීඩා තරග පැවැත්වීමෙන් ක්‍රීඩා සහභාගිත්වය දිරි ගැන්වීම
4. ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරේ ක්‍රීඩා ක්‍රියාකාරකම් දිරි ගැන්වීම මඟින් විනය සංවර්ධනයක් ඇති කිරීම
5.ක්‍රිඩාව මගින් විශ්ව විද්‍යාලයීය නාමය ඉදිරියට ගෙන යාම

අධ්‍යයන හා පරිපාලන නිලධාරීන්ගෙන් ක්‍රීඩා උපදේශක මණ්ඩලයේ සාමාජිකත්වය සැදි ඇත. විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා ක්‍රියාකාරකම් සහයෝගිතාවයෙන් ගෙන යාම සඳහා ක්‍රීඩා සංගමය නායක/උප නායකයන්ගෙන් සමන්විත වන අතර, ඒ සඳහා සෑම වසරකදීම සම සභාපතිවරුන් දෙදෙනෙකු සහ විධායක සභාවක් පත් කර ගනු ලැබේ.

## ක්‍රීඩා උපදේශක මණ්ඩලය

ක්‍රීඩා උපදේශක මණ්ඩලයේ පහත සඳහන් සාමාජිකයින් අන්තර්ගත වන්නේය

1ෆ ක්‍රීඩා විෂය කෙරෙහි ඇල්මක් දක්වන අධ්‍යයන කාර්යය මණ්ඩලයේ දහසය දෙනෙකු නිත්‍ය සාමාජිකයන් ලෙස උපකුලපතිවරයා විසින් පත් කෙරේ.

2ෆ ශාරිරික අධ්‍යාපන අධ්‍යක්ෂිකා

3. පූර්ණ කාලින ශාරීරික අධ්‍යාපන උපදේශකයන් අතරින් පස්දෙනෙකු (මෙයින් එක් අයෙකු උපදේශිකාවක් විය යුතුය)

4. ක්‍රීඩා සංගමයේ සම සභාපතිවරු දෙදෙනෙකු,උප සභාපති ද,ලේකම් හෝ වෙනත් නියෝජිතයෙකු (එක් අයෙකු ක්‍රීඩිකාවක් විය යුතුය)

5. විශ්වවිද්‍යාලයීය ප්‍රධාන වෛද්‍ය නිලධාරීන් හෝ ඔහුගේ නියෝජිතයෙකු (විශ්වවිද්‍යාලයේ නිලධාරියෙකු විය යුතුය)

6. අධ්‍යක්ෂක / ශිෂ්‍ය කටයුතු

7. ජ්‍යොෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සුබසාධනය) හෝ ඇයගේ නියෝජිතයෙකු

8. මූල්‍යාධිකාරී හෝ ඔහුගේ හෝ ඇයගේ නියෝජිතයෙකු

9. වැඩ ඉංජිනේරු හෝ ඔහුගේ නියෝජිතයෙකු

10. සහකාර ලේඛකාධිකාරී (මූල ධන වැඩ අංශය)

11. ව්‍යාපෘති ඉංජිනේරු (මූලධන වැඩ අංශය)

## ක්‍රීඩා සංගමය

විවිධ ක්‍රීඩා කණ්ඩායම් වල නායකයින් උපදේශකයන්ගෙන් විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ සාමාජිකත්වය සුසැදි ඇත. ඊට සම සභාපතිවරු දෙදෙනෙකු, උප සභාපති, ලේකම්, සහකාර ලේකම්, කනිෂ්ඨ භාණ්ඩාගාරික, සම්පාදකවරු දෙදෙනෙකු සහ කමිටු සාමාජිකයන් දෙදෙනෙකු අයත් වන්නේය.

අධ්‍යයන වර්ෂයක පළමු රැස්වීමේදි මොවුන් තෝරා පත් කර ගැනේ

## ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ තරගාවලි

- විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අංශයේ ශාරීරික අධ්‍යාපන උපදේශකයින්ගේ සුපරික්ෂණය යටතේ පහත සඳහන් ක්‍රීඩා පුහුණු කිරීම් සහ පහසුකම් ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| **එන්. නිශාන්ති විදානගේ මහත්මිය**<br>(ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ) | **ජේ.එම්. රමණී කුලතිලක මහත්මිය** (ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>වෙස් (ගැහැනු / පිරිමි)<br>දැල්පන්දු (ගැහැනු)<br>අත්පන්දු (ගැහැනු / පිරිමි)<br>වායු වෙඩිතැබීම් (ගැහැනු / පිරිමි)<br>යෝග ව්‍යායාම් | **එම්.ජී.එස්.එස්.කිර්තිරත්න මහතා** (ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>පාපන්දු (පිරිමි)<br>පිහිණුම්(ගැහැනු / පිරිමි)<br>රගර් (පිරිමි) |
| **එච්.එල්.එල්.දිලංකර මහතා**<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>මලල ක්‍රීඩා(ගැහැනු / පිරිමි)<br>මැරතන් තරඟ (ගැහැනු / පිරිමි)<br>කැරම් (ගැහැනු / පිරිමි)<br>පැසිපන්දු (පිරිමි / ගැහැනු)<br>කරාටේ (ගැහැනු / පිරිමි)<br>ඇරොබික්ස්<br>සුම්බා | **බී.එන්.එම්.පෙරේරා මහතා**<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>බර ඉසිලීම (ගැහැනු / පිරිමි)<br>මල්ලවපොර (පිරිමි)<br>එල්ලේ (ගැහැනු / පිරිමි) | **එල්.ඒ.ඩී.ප්‍රියදර්ශණ මහතා**<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>ටෙනිස් (ගැහැනු / පිරිමි)<br>බේස්බෝල් (පිරිමි)<br>කබඩි (ගැහැනු / පිරිමි)<br>බැඩ්මින්ටන් (ගැහැනු / පිරිමි)<br>මේස පන්දු (ගැහැනු / පිරිමි) |
| **බී.එම්.සී.එන්.නිරෝෂණ මහතා**<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br>තයිකොන්ඩෝ (ගැහැනු / පිරිමි)<br>හොකි (ගැහැනු / පිරිමි).<br>ක්‍රිකට් (පිරිමි) | | |

**ශාරීරික අධ්‍යාපන අංශය විසින් පහත සඳහන් තරග සංවිධානය කරනු ලබන්නේ ය.**

- 1). අන්තර් පීඨ ආධුනික / නවක තරග
- 2). අන්තර් පීඨ ක්‍රීඩා තරග
- 3). ආරාධිත හා සුහද තරග
- 4). අන්තර් විශ්වවිද්‍යාල තරග
- මීට අමතර වශයෙන් බාහිර කණ්ඩායම් සමඟ සුහද තරඟ සංවිධානය සහ අන්තර් විශ්වවිද්‍යාල ශූරතා තරග සංවිධානය හා ඒකාබද්ධ විශ්වවිද්‍යාල කණ්ඩායම් තරග ද පවත්වනු ලැබේ.
- ජාතික ශූරතා තරග ලෝක විශ්වවිද්‍යාල තරග සහ ශූරතා තරඟ සඳහා සියලු ම විශ්වවිද්‍යාල වලින් තෝරා ගත් ඒකාබද්ධ විශ්වවිද්‍යාල ක්‍රීඩා කණ්ඩායම්හි ද අපගේ ශිෂ්‍යයින් සහභාගි වන්නේය.
- විශ්වවිද්‍යාල කිහිපයක් විසින් පමණක් අන්තර් විශ්වවිද්‍යාල ක්‍රිඩා උත්සව සංවිධානය කරන අතර මෙය වසරක් පාසා පැවැත් වෙන අතර එක් තනි විශ්වවිද්‍යාලයක් විසින් පමණක් සංවිධානය කරනු ලබන Mini Olympics තරග සෑම වසර තුනකටම වරක් පැවැත්වෙන්නේය.

## 2019 දී අප විසින් මෙහෙයවන ලද විශේෂ සිදුවීම්

- "විදුදය අන්තර් පාසල් පිහිණුම් තරගාවලිය - 2019"
  අධ්‍යාපන අමාත්‍යංශයේ අනුමැතිය ඇතිව ශාරීරික අධ්‍යාපන අංශය හා ක්‍රීඩා සංගමය එක්ව සංවිධානය කරන ලදුව, විශ්වවිද්‍යාලයීය පිහිණුම් තටාක පරිශ්‍රයේ දී පවත්වනු ලැබීය.

- 2018 පෙබරවාරි මස 02 වන දා සිට පෙබරවාරි 05 වන දා තෙක් ශාරීරික අධ්‍යාපන අංශයෙන් සංවිධානය කරනු ලදුව, ශ්‍රී ලංකා යුධ හමුදා විශේෂ බලකා පුහුණු පාසැලේදී බාහිර පුහුණු වැඩසටහනක්, අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රිඩා තරග සඳහා සූදානම් කරලනු පිණිස කණ්ඩායම් නායකයන්ගේ සහ උප නායකයන්ගේ නායකත්ව ගුණාංග අභිප්‍රේරණය කිරිම හා සංවර්ධනය කිරිම සඳහා පවත්වනු ලැබීය.

- 2019 වර්ෂයේ අන්තර් විශ්ව විද්‍යාල ක්‍රිඩා තරගාවලිය 2019 අගෝස්තු මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා පැවැත්වූ අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ප්‍රථම ස්ථානය දිනාගත්තේය.

- 2019 - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශූරතා තරග ප්‍රතිපල

| | තරගය | පිරිමි | ගැහැනු |
|---|---|---|---|
| 1 | බැඩ්මින්ටන් | 1 වන ස්ථානය | 1 වන ස්ථානය |
| 2 | බේස් බෝල් | 1 වන ස්ථානය | - |
| 3 | පැසි පන්දු | 1 වන ස්ථානය | 1 වන ස්ථානය |
| 4 | කැරම් | 4 වන ස්ථානය | 2 වන ස්ථානය |
| 5 | චෙස් | 2 වන ස්ථානය | 4 වන ස්ථානය |
| 6 | ක්‍රිකට් | 1 වන ස්ථානය | - |
| 7 | එල්ලේ | අර්ධ අවසන් පූර්ව වටය | අර්ධ අවසන් පූර්ව වටය |
| 8 | පා පන්දු | අර්ධ අවසන් පූර්ව වටය | - |
| 9 | හොකී | 1 වන ස්ථානය | 2 වන ස්ථානය |
| 10 | කරාටේ | 7 වන ස්ථානය | 4 වන ස්ථානය |

| | | | |
|---|---|---|---|
| 11 | දැල් පන්දු | - | 3 වන ස්ථානය |
| 12 | මාර්ග ධාවන | 2 වන ස්ථානය | - |
| 13 | රගර් | අර්ධ අවසන් පූර්ව වටය | - |
| 14 | පිහිනුම් | 2 වන ස්ථානය | 1 වන ස්ථානය |
| 15 | මේස පන්දු | 3 වන ස්ථානය | 2 වන ස්ථානය |
| 16 | තෛයිකොන්ඩෝ | 2 වන ස්ථානය | 6 වන ස්ථානය |
| 17 | ටෙනිස් | 2 වන ස්ථානය | 3 වන ස්ථානය |
| 18 | ජවන හා පිටිය | 3 වන ස්ථානය | 2 වන ස්ථානය |
| 19 | අත් පන්දු | අර්ධ අවසන් පූර්ව වටය | අර්ධ අවසන් පූර්ව වටය |
| 20 | බර ඉසිලීම | 4 වන ස්ථානය | - |
| 21 | මල්ලව පොර | 1 වන ස්ථානය | - |

❖ පිරිමි ශූරතාවය - පළමුවන ස්ථානය
❖ කාන්තා ශූරතාවය – 2 වන ස්ථානය

❖ සමස්ත ශූරතාවය – පළමුවන ස්ථානය




බැඩ්මින්ටන් (පිරිමි) කණ්ඩායම




බැඩ්මින්ටන් (කාන්තා) කණ්ඩායම




පැසිපන්දු (පිරිමි) කණ්ඩායම




පැසිපන්දු (කාන්තා) කණ්ඩායම




බේස්බෝල් කණ්ඩායම




ක්‍රිකට් කණ්ඩායම




එල්ලේ කණ්ඩායම




පිහිණුම් කණ්ඩායම




මල්ලව පොර කණ්ඩායම




සමස්ත පිරිමි ශූරතාවය

සමස්ත ශූරතාවය



❖ <u>වසර තුළ සහභාගි වූ දේශිය ක්‍රීඩා තරගාවලින් (ආරාධිත හා අනෙකුත් තරග)</u>

- 4වන SSC Open International rating චෙස් තරගාවලිය -2019
- ශ්‍රී ලංකා විවෘත චෙස් තරගාවලිය -2019
- 12 වන කොළඹ අන්තර්ජාතික චෙස් තරගාවලිය -2019
- 9 වන දම්සෝ අන්තර්ජාතික චෙස් තරගාවලිය -2019
- ශ්‍රී ලංකා ජාතික B කාන්තා චෙස් තරගාවලිය -2019
- HNDE Masters Trophy වාර්ෂික වොලිබෝල් තරගාවලිය - 2019
- මහේෂ් ප්‍රනාන්දු අනුස්මරණ බේස්බෝල් තරගාවලිය - අනුශූරතාවය
- අන්තර් සමාජ යුගල මේස පන්දු තරගාවලිය -2019 Division 5 - අනුශූරතාවය
- ආරාධිත කබඩි තරගාවලිය -2019 (පේරාදෙණිය සහ සබරගමුව) - අනුශූරතාවය
- ජාතික පිරිමි කබඩි තරගාවලිය -2019 (විශ්වවිද්‍යාල මට්ටම) - අනුශූරතාවය
- ආරාධිත මේස පන්දු තරගාවලිය - 2019 - මොරටුව විශ්වවිද්‍යාල සංවිධානය කරන ලදි
- UMISF ( බැඩ්මින්ටන් ) තරගාවලිය -2019 - කාන්තා ,පිරිමි සමස්ත ශූරතාවය
- ලෙස්ලි හඳුනගේ අනුස්මරණ ආරාධිත බොක්සිං තරගාවලිය -2019
- ශ්‍රී ලංකා ආධුනික බරඉසිලීම් තරගාවලිය -2019
- ශ්‍රී ලංකා ආධුනික මල්ලවපොර තරගාවලිය -2019
- ජාතික යොවුන් එල්ලේ තරගාවලිය - අනුරාධපුර -2019
- මෝරා හොකි 9 සයිඩ් තරගාවලිය - 2019 - දෙවන ස්ථානය
- බස්නාහිර පළාත් Division 3 ක්‍රිකට් තරගාවලිය - 2019
- මෝරා හොකි 6 තරගාවලිය - 2019 - තෙවන ස්ථානය
- ජාතික යොවුන් තෛකොන්ඩෝ තරගාවලිය

❖ <u>ජාත්‍යන්තර වශයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තරග නියෝජනය</u>

- දකුණු ආසියානු ක්‍රීඩා තරගාවලිය -2019
  අප විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩක/ ක්‍රීඩිකාවන් අටදෙනෙකු සහභාගි විය.ඔවුන් විසින් රන් පදක්කම් 3ක්ද (ටී.පී.හෙන්දහේවා,එස්.කේ ඉෂාදිකා.බී.එම්.එච්.පී.බාලසූරිය - ව්‍යවහාරික විද්‍යා පීඨය) රිදී පදක්කම් 5ක්ද (ටී.පී.හෙන්දහේවා,එස්.කේ ඉෂාදිකා, බී.එම්.එච්.පී.බාලසූරිය - ව්‍යවහාරික විද්‍යා පීඨය. එච්.සී.විජේරත්න.චරිත් පෙරේරා- කළමණාකරණ පීඨය),ලෝකඩ පදක්කම් 4 ක්ද(එරන්දි වරුසවිතාන,චමීර ගිනිගේ,සුමේධ රණසිංහ ව්‍යවහාරික විද්‍යා පීඨය) දිනා ගන්නා ලදි.

- ආසියානු කණ්ඩායම් බැඩ්මින්ටන් තරගාවලිය -2019
  අප විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩිකාවන් දෙදෙනෙකු (ටී.පී.හෙන්දහේවා,එස්.කේ ඉෂාදිකා.බී.එම්.එච්.පී.බාලසූරිය - ව්‍යවහාරික විද්‍යා පීඨය) සහභාගි විය.

- ලෝක කුසලාන පාපන්දු තරගාවලිය සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග -
  අප විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩකයෙකු (ජුඩ් සුබන් - ව්‍යවහාරික විද්‍යා පීඨය) සහභාගි විය.

- බටහිර ආසියානු බේස්බෝල් කුසලාන තරගාවලිය - 2019
  අප විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩකයෙකු (විමුක්ති සෙනෙවිරත්න - ව්‍යවහාරික විද්‍යා පීඨය) සහභාගි විය.

- දකුණු ආසියානු Throw Ball තරගාවලිය - 2019
  අප විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩකයින් දෙදෙනෙකු (ඩී.එල්.එස්.එම්.ජයසිංහ,එච්.එල්.එස්.පී. සමරකෝන්- ව්‍යවහාරික විද්‍යා පීඨය) සහභාගී විය.

- ආසියානු ඒකල ස්කොච් තරගාවලිය -2019
  අප විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩිකාවක (නදුනි ගුණවර්ධන - කළමණාකරණ පීඨය) සහභාගී විය.

- ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරගාවලිය. 2019 ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරගාවලිය - 2019 ඉතාලියේ පැවැති ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරගාවලිය 2019 සඳහා විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සාමාජිකයන් 13 දෙනෙකු සහභාගි විය.

1. ඩබ්ලිව්.කේ.එම්.කුමාර - ව්‍යවහාරික විද්‍යා පීඨය
2. ඕ.අයි.එල්.ඒ.කුමාර - ව්‍යවහාරික විද්‍යා පීඨය
3. අයි.ජී.අයි. ශ්‍රිමාලි - ව්‍යවහාරික විද්‍යා පීඨය
4. ඒ.අයි.එම්.ආර්.ඒ.සී.මාරලන්ද- ව්‍යවහාරික විද්‍යා පීඨය
5. බී.එස්.දුලක්ෂි- ව්‍යවහාරික විද්‍යා පීඨය
6. එස්.එච්.එස්.වී.වික්මරත්න- ව්‍යවහාරික විද්‍යා පීඨය
7. ආර්.ඒ.කුමාරජීව - ව්‍යවහාරික විද්‍යා පීඨය
8. ඒ.ඩබ්ලිව්.වයි.කේ.විමලරත්න- ව්‍යවහාරික විද්‍යා පීඨය
9. ර්.ඩී.වරුසවිතාන - ව්‍යවහාරික විද්‍යා පීඨය
10. බී.එම්.එච්.පබෝධා- ව්‍යවහාරික විද්‍යා පීඨය
11. සී.එන්.විජේවර්ධන - කළමණාකරණ පීඨය
12. පී.කේ.කේ.ඩී.ගිම්හාන් - කළමණාකරණ පීඨය
13. එන්.එච්.එල්ලාවල - කළමණාකරණ පීඨය

## වර්ණ ප්‍රදානය

එක් එක් වර්ෂාවසානයේ දී ශාරීරික අධ්‍යාපන අංශය හා ක්‍රීඩා සංගමය එක්ව මෙම වර්ණ ප්‍රදන උත්සවය සංවිධානය කරනු ලබයි. නිර්දේශිත සාධන මට්ටම් යටතේ අපේක්ෂිත ප්‍රමිත අත්පත් කරගනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් උපදේශන සභාවේ නිර්දේශයෙන් වර්ණ ලබන්නේය. මෙම සම්මාන සඳහා වන සාධන මට්ටම් හා වැඩිදුර විස්තර ශාරීරික අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත හැකිය. වැඩිදුරටත්, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා සංගමය විසින් අන්තර් විශ්වවිද්‍යාලයීය තරගාවලියේ දී වැඩි දක්ෂතා පෙන්වන ක්‍රීඩක ක්‍රීඩිකාවනට කුසලතා සම්මාන ලබා දෙනු ලබන්නේය.

## ක්‍රීඩා පහසුකම්

අද්විතීය ක්‍රීඩා පහසුකම් සහිත ගෞරව සම්ප්‍රයුක්ත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ ක්‍රීඩා ක්ෂේත්‍රය මෙහෙය වන යාන්ත්‍රණය වන්නේ ශාරීරික අධ්‍යාපන අංශයයි.

## එළිමහන් අත් පන්දු පිටි

විශ්වවිද්‍යාලයේ අත් පන්දු ක්‍රීඩා පිටි දෙකක් පිහිනුම් තටාකය ආසන්නයේ පිහිටා ඇති අතර මෙම අත්පන්දු පිටි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවනට හා කාර්ය මණ්ඩලයට ලබා ගත හැකිය.

## පැසි පන්දු පිටි

එළිමහන් පැසි පන්දු පිටි, අත් පන්දු පිටින්ට ආසන්නයේ පිහිටා ඇති අතර ප්‍රධාන වශයෙන් මෙම පාටිය තාර පෘශ්ටයක් සහිතව සකස්කර ඇත. මෙම පැසි පන්දු පිටි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවනට හා කාර්ය මණ්ඩලයට ලබා ගත හැකිය.

## ටෙනිස් පිටි

මෙම ටෙනිස් පිටි මැටි පෘෂ්ඨයක් සහිතව මැනවින් නඩත්තු වන්නකි. මෙම ටෙනිස් පිටි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවනට හා කාර්ය මණ්ඩලයට මෙන්ම බාහිර පුද්ගලයිනට ද ලබා ගත හැකිය.

## පිහිණුම් තටාක සංකීර්ණය

මෙම පිහිනුම් තටාකය මීටර් 50 ක සම්මත දිගින් යුතු වන අතර ඊට ධාවන පථ 10 ක් ඇතුළත් වේ. මෙහි නොගැඹුරු අන්තය මීටර් 1.5 ක ගැඹුරකින් යුතු වන අතර ගැඹුරු අන්තය මීටර් 5.5 ක් වන්නනේය. පිහිනුම්කරුවනට ඇඳුම් මාරු කිරීමට හා නෑමට අවශ්‍ය පහසුකම් වලින් සමන්විත ගොඩනැගිල්ලක් මෙම පිහිනුම් තටාකයට යාබදව පිහිටා තිබෙන්නේය. මෙම පිහිනුම් තටාකය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවනට හා කාර්ය මණ්ඩලයට විවෘත වනාතර පිටස්තරයනට ද මෙහි පහසුකම් ලබා ගත හැකිය.

## ක්‍රිකට් ක්‍රීඩ පිටි

විශ්වවිද්‍යාලයීය ක්‍රිකට් තණතිල්ල ප්‍රධාන වශයෙන්ම තණ පෘශ්ටයක් සහිත මීටර් 65 ක සම්පූර්ණ දිගකින් යුතු වන්නේය. මෙම හොඳින් නඩත්තු වන පිටියෙහි එක් කලාල තණතිල්ලක් හා මැටි තණතිලි දෙකක් අන්තර්ගත වන්නේය. ක්‍රීඩකයනට හා ක්‍රීඩා විනිසුරුවරුන්ට ප්‍රයෝජනය පිණිස යාබද නාන කාමර සහිත ඇඳුම් මාරු කර ගැනීමේ කුටිවලින් සහ ප්‍රේක්ෂකාගාරයකින් සමන්විත එක් මහල් ගොඩනැගිල්ලක් මෙම ක්‍රිකට් පිටියට යාබදව පිහිටා තිබෙන්නේය. ක්‍රීඩාපිටිය පිහිටා ඇත්තේ ඉතාමත් රමණීය පරිසරයකය. අන්තර් විශ්වවිද්‍යාලයීය තරඟ  විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර තරඟ මෙන්ම අනෙකුත් ක්‍රීඩා සමාජ තරඟ සඳහා මෙම ක්‍රිකට් ක්‍රීඩා පිටිය පහසුකම් සලසන්නේය.

## වසර තුළ සපුරාගත් ඉලක්ක

- විශාල අඩුපාඩුවක්ව පැවති ශාරිරික අධ්‍යාපන අංශ කාර්යාලයේ නවීකරණ කටයුතු සිදු කිරිම
- පිහිණුම් තටාක පරිශයේ අඩුපාඩුවක්ව පැවති සනීපාරක්ෂක පහසුකම් සඳහා අළුතින් ගොඩනැගිල්ලක් සහ පිහිණුම් තටාක පාලන කාමරයක් අළුතින් ඉදිකිරිම
- විශ්වවිද්‍යාල ක්‍රිකට් ක්‍රිඩකයින්ගේ පුහුණුවීම් කටයුතු සඳහා ක්‍රිකට් නෙට් එක සකසා ගැනීම
- පුහුණුවීම් කටයුතු සඳහා වඩාත් පුළුල් සේවයක් සැපයීමේ අරමුණින් ඉහළ ක්‍රිඩා පිටියේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
- 2018 සැප්තැම්බර් මාසයේ සිට 349.03.04 (28) මුදල් කමිටු තීරණයට අනුව ටෙනිස්,අත්පන්දු,පැසිපන්දු, ක්‍රිකට් නෙට්,පාපන්දු,හොකී,දැල්පන්දු ක්‍රිඩාපිටි ගිවිසගත් මිලගණන් යටතේ බාහිර පාර්ශවයන්ට ලබාදීමට අවස්ථාව සලසා ගැනීම

- පිහිණුම් තටාක පරිහරණය කිරීම් සඳහා බාහිර ආයතනයන්ට පිහිණුම් තටාක මන්තීරු ලබාදීමෙන් ලක්ෂ 840410.00 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත උපයා දීම.
- 2018 සැප්තැම්බර් මාසයේ සිට ආරම්භ කළ බාහිර ආයතන සඳහා ක්‍රීඩා පිටි වෙන්කිරීම සහ ලියාපදිංචි කිරීම් මගින් රුපියල් 701000/- ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත උපයා දීම.

## වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය (CSDS) සහ ගැවෙල් ක්ලබ් සමඟ එක්ව සියළුම වෘත්තීය මාර්ගෝපදේශන ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එසේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් පහත පරිදි වේ.

### ග්ලෝරි නයිට්

වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතියේ ග්ලෝරි නයිට් යනු වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතියේ වාර්ෂික සුහදහමුව සහ පහසුකම් සැලසීම සම්බන්ධයෙන් පවත්වනු ලබන උත්සවයයි. 2019 වර්ෂයේ දී පවත්වනලද මෙම උත්සවයේ ප්‍රධාන සංවිධායකයින් ලෙස පියුමි දිසානායක සහ චන්දන ප්‍රියශාන්ත යන අය කටයුතු කළහ. නව නිලධාරීන් මණ්ඩලය නිල වශයෙන් විශ්ව විද්‍යාලයේ වෘත්තීය උපදේශකයින් වෙත හඳුන්වා දීම මෙම උත්සවයේ දී සිදුකරන ලදී. තවද මෙහිදී සිය නිලතලවලින් ඉවත්ව යන නිලධාරී මණ්ඩලයේ විශිෂ්ට කැපවීම මෙහිදී ඇගයීමට ලක්කරන ලදී.

### සාර්ථකත්වයේ සෙවනැල්ල (අධියර 04)

සාර්ථකත්වයේ සෙවනැල්ල යන මැයෙන් පවත්වනලද වැඩමුළු මාලාවේ 04 වන අදියර 2019 මැයි මස 23 වන දින පබ්ලියස් සිල්වා මහතාගේ ගෞරවනීය සහභාගීත්වයෙන් පැවැත්විණි. මෙම උත්සවයේ ප්‍රධාන සංවිධායක ලෙස දිලීප් රාජපක්ෂ මහතා කටයුතු කළේය. මෙම වැඩමුළුව විශ්ව විද්‍යාලයේ සියලුම උපාධි අපේක්ෂකයින් සඳහා විවෘත වූ අතර සිසුන් 400 කට ආසන්න පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ. වැඩමුළුව අතරතුර සිසුන්ට සම්පත්දායකයා සමඟ සාකච්ඡා කිරීමට සහ ඔහුගේ වටිනා ජීවන අත්දැකීම් බෙදාහදා ගැනීමට අවස්ථාව උදාවිය විය.

### ජ,පුර සේවා නියුක්ති නිපුණතා සම්මාන 2019 (JESA 2019)

ජ,පුර සේවා නියුක්ති නිපුණතා සම්මාන (JESA) 2019 යනු විශ්ව විද්‍යාලයේ වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවය වන අතර එමගින් උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්ත හැකියාවන්ට ප්‍රවේශයක් ලබා දීම සිදුවේ.

"ටච් ද පීක් " – වැඩමුළු මාලාව (ක.අ. හා වාණිජ පීඨ වැඩසටහන)

"ටච් ද පීක්" යන මැයෙන් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික රැකියා ප්‍රදර්ශනය සහ ව්‍යවසායකත්ව ව්‍යාපාර වැඩසටහන විශ්වවිද්‍යාලයේ නවක උපාධි අපේක්ෂකයින්ට සුදුසු රැකියාවකට බඳවා ගැනීමටත්, වෘත්තීය සැලසුම් සහ වෘත්තීය මාර්ග සොයා ගැනීමටත් පහසුකම් සලසනු ලබන දුර්ලභ අවස්ථාවක් විය. මෙම වැඩසටහන වැඩමුළු මාලාවකින් සහ රැකියා වෙළඳපොලකින් සමන්විත විය. මෙම වැඩසටහනේ ප්‍රධාන සංවිධායකයින් ලෙස ඉෂාන්, සසංක සහ ප්‍රවිනා රාජපක්ෂ යන අය විසින් සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලද අතර මෙම අවස්ථාවට සිසුන් 1000 කට ආසන්න පිරිසක් සහභාගී වූහ.

"ටච් ද පීක් " – වැඩමුළු මාලාව (ව්‍යවහාර විද්‍යා පීඨයේ වැඩසටහන)

"ටච් ද පීක්" යන මැයෙන් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාර විද්‍යා පීඨය විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික රැකියා වෙළඳපොළ සහ ව්‍යවසායකත්ව ව්‍යාපාර වැඩසටහන විශ්වවිද්‍යාලයේ නවක උපාධි අපේක්ෂකයින්ට රජයේ සහ පෞද්ගලික ක්ෂේත්‍රයේ සුදුසු රැකියා අවස්ථාවක් ලබා ගැනීමටත්, සැලසුම් සහ වෘත්තීය මාර්ග සොයා ගැනීම සහ සැළසුම් කිරීම සඳහාත් උදාවූ දුර්ලභ අවස්ථාවක් විය. මෙම වැඩසටහන වැඩමුළු මාලාවකින් සහ වෘත්තීය ප්‍රදර්ශනයකින් සමන්විත විය. මෙම වැඩසටහන ප්‍රධාන සංවිධායකයින් විසින් සම්බන්ධීකරණය කරන ලදී. ව්‍යවහාර විද්‍යා පීඨයේ ටච් ද පීක් - වාර්ෂික රැකියා ප්‍රදර්ශනය සහ ව්‍යවසායකත්ව ව්‍යාපාර වැඩසටහන උපාධි අපේක්ෂකයින් / උපාධිධාරීන් 1000 කට වැඩි පිරිසක් සහ සුප්‍රසිද්ධ සමාගම් 25 කට වැඩි ප්‍රමාණයක සහභාගීත්වයෙන් යුතුව සාර්ථකව පවත්වන ලදී.

"ටච් ද පීක් " - වාර්ෂික රැකියා පොළ සහ ව්‍යවසායකත්ව ව්‍යාපාර (මා.ශා. හා ස.වි. පීඨයේ වැඩසටහන)

**"**ටච් ද පීක්**"** යන මැයෙන් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික රැකියා ප්‍රදර්ශනය සහ ව්‍යවසායකත්ව ව්‍යාපාර වැඩසටහන විශ්ව විද්‍යාලයේ නවක උපාධි අපේක්ෂකයින්ට සුදුසු රැකියාවකට බඳවා ගැනීමටත්, වෘත්තීය සැලසුම් සහ වෘත්තීය මාර්ග සොයා ගැනීමටත් පහසුකම් සලසනු ලබන දුර්ලභ අවස්ථාවක් විය. මෙම වැඩසටහන වැඩමුළු මාලාවක් සහ වෘත්තීය ප්‍රදර්ශනයකින් සමන්විත විය. මෙහි ප්‍රධාන සංවිධායකයින් වශයෙන් ඉමාල්, මාධව සහ තාඩියා වික්‍රමසිංහ යන අය විසින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර මෙම වැඩසටහන සඳහා සිසුන් 1000 කට ආසන්න පිරිසක් සහභාගී වූහ.

## වෙරළ පිරිසිදු කිරීම (ආනවිලුන්දාව මුතුපන්තිය වෙරළ තීරය)

'CSDS වෙරළ පිරිසිදු කිරීම' යනු වෘත්තීය නිපුණතා සංවර්ධන ඒකකය විසින් සංවිධානය කරනු ලබන තවත් ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් වෙරළ සංරක්ෂණය අරමුණුකොට ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංවිධායක වශයෙන් සංජය එම්. ජයකොඩි මහතා මෙහි සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය. මෙම ප්‍රයත්නය තවදුරටත් පුළුල් කරමින් අරච්චිකට්ටු වෙරළේ කිලෝමීටර් දෙකකට ආසන්න දුරක් පිරිසිදු කිරීම සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා පොලිස් ස්ථානය, වෙරළ සංරක්ෂණ අධිකාරිය සහ ගම්වැසියන්ගේ සහාය ද හිමි විය.

## අරුණැල්ල

අරුණැල්ල යනු වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය විසින් අඛණ්ඩව කරගෙන යනු ලබන ප්‍රධාන ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියකි. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත්වන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීම මෙහි අරමුණ විය. මෙම ප්‍රයත්නය ප්‍රයත්නය තවදුරටත් පුළුල් කරමින් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ද එයට සම්බන්ධ කරමින් වෘත්තීය නිපුණතා සංවර්ධන ඒකකය විසින් ඉදිරි පිම්මක් තබන ලදි. විධායක කමිටුව විසින් වමෝදි ගුණතුංග සහ ජනක කොග්ගල යන අය 2019 වර්ෂය සඳහා ප්‍රධාන සංවිධායකයින් වශයෙන් තෝරාපත්කරන ලද අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කුඳරවලියා ද්විතීයික පාසල තෝරා ගන්නා ලදී .

## සාමාන්‍ය පාලන හා සේවා අංශය

සාමාන්‍ය පාලන හා සේවා අංශය මඟින් අධ්‍යයන හා අනධ්‍යයන කටයුතු වෙනුවෙන් ප්‍රවාහන පහසුකම්,දුරකථන සන්නිවේදන පහසුකම් ,තැපැල් සේවාව ,සේවක හවතුන් වෙනුවෙන් නිවාස පහසුකම් ලබා දීම සහ පුවත්පත් සහ ගිනින නිවන උපකරණ සැපයීම වැනි යටිතල පහසුකම් ලබා දෙනු ලැබේ. සාමාන්‍ය පාලන හා සේවා අංශයේ එක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයෙක් ,කළමණාකරන සහකාරවරු 06ක් ,පිළිගැනීමේ නිලධාරිනියක් ,රියදුරු මහතුන් හතලිස් එක් දෙනෙක්,රිය සහායක මහතුන් දෙදෙනෙක් හා කම්කරු සේවක හවතුන් අටදෙනෙක් ඇතුලුව සේවක හවතුන් පනස් නවයකින් සමන්විත වේ.

විශ්වවිද්‍යාලයේ වාහන සංචිතය මෝටර් රථ 12ක් ,ජීප් රථ 04ක් , බස් රථ 07 ක් ,වෑන් රථ 11 ක්, කැබ් රථ 05 ක් ,ගිලන් රථ 03 ක් ,ට්‍රැක්ටරයක් ,අත් ට්‍රැක්ටරයක් ,යතුරු පැදි 02 ක් සහ ත්‍රී රෝද රථයකින් සමන්විත වේ.මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන හයක් ද විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් වාහන පහක්ද විශ්වවිද්‍යාල සංචිතයට පසුගිය වසර කිහිපය තුළදී එකතුවී ඇත. තොරතුරු හා සේවා මධ්‍යස්ථානයට සම්බන්ධීකරණයෙන් අභ්‍යන්තර දුරකථන පහසුකම්,9 ” ඩයලින් දුරකථන පහසුකම් හා සෘජු දුරකථන පහසුකම් සැපයේ.

විශ්වවිද්‍යාල නිවාස සේවක හවතුන් වෙත ලබා දීම විශ්වවිද්‍යාල නිවාස කමිටුව විසින් සිදුකරන අතර තෝරා ගත් නිලධාරීන් කිහිප දෙනෙකුට නිවාස පහසුකම් නොමිලයේ ලබා දී ඇත.එම නිලධාරීන් වනුයේ විනයාධිකාරි, නේවාසිකාගාර පාලක, වැඩ ඉංජිනේරු , ප්‍රධාන ආරක්ෂක නිලධාරී,විදුලි කාර්මික හා ජල නල කාර්මික වේ.ඊට අමතරව සුබ සාධන සේවයක් ලෙස මාසික කුලී පදනම මත අධ්‍යයන , විධායක හා අනධ්‍යයන සේවක හවතුන් වෙත නිවාස සපයා ඇත.

වාර්ෂිකව ගිනි නිවන උපකරණ යාවත්කාලීන කිරීම ගිනි නිවන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් සිදුකරනු ලැබේ. මේ වනවිට විශ්වවිද්‍යාලයේ සියළුම අංශවල සවිකර ඇති ගිනි නිවන උපකරණවල අඩුපාඩු පරීක්ෂා කර ඒ පිළිබඳව වාර්තාවක් සැපයීම හා අලුතින් ගිනි නිවන උපකරණ සවිකල යුතු ස්ථාන පිළිබඳව වාර්ථාවක් ලබා දීමට කොළඹ මහ නගර සභාවේ ගිනි නිවන සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී.

මාර්ග නීති රීති හා ආරක්ෂිත රිය ධාවනය පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් රියදුරු හා රිය සහායක මහතුන් වෙත වාර්ෂිකව පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.ඒ අනුව 2019 වසර වෙනුවෙන් ක්ලබ් ෆාම් බේ හෝටලයේදී රියදුරු මහතුන් සඳහා දෙදින පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.

## කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

2019 වසරේ දී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබීය. වෛද්‍ය අධ්‍යාපන හා සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධාන,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය. ආර්.බී. මාරසිංහ මහතා කාර්ය මණ්ඩල අධ්‍යක්ෂ තනතුර අර්ධ කාලීන වශයෙන් තවදුරටත් හොබවන්නේ ය.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් 2019 වසරේ දී පවත්වන ලද වැඩමුළු පහත සඳහන් වේ.

| අංකය | වැඩසටහන | දිනය | ශිර්ෂය | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|---|---|
| 1 | **පුහුණු වැඩසටහන** | 07.01.2019<br>14.01.2019<br>21.01.2019<br>28.01.2019<br>11.02.2019 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන (ලිඛිත) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා<br><br>මෙහෙයවීම<br>පී.එම්.මොහමඩ් ෆිර්තස් මහතා |
| 2 | **පුහුණු වැඩසටහන** | 09.01.2019<br>16.01.2019<br>23.01.2019<br>29.01.2019<br>06.02.2019<br>20.02.2019 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන (කථනය) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා<br><br>මෙහෙයවීම<br>පී.එම්.මොහමඩ් ෆිර්තස් මහතා |
| 3 | සයමාසික පුහුණු වැඩ සටහන | 25.01.2019<br>01.02.2019<br>08.02.2019<br>15.02.2019 | උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව (CTHE) 2018 කණ්ඩායම | කථිකාචාර්යවරුන් ( පරිවාස ) සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සඳහා<br><br>මෙහෙයවීම<br>වෛද්‍ය ආර්.බී.මාරසිංහ මහතා |
| 4 | Toast masters communit y Club | 05.01.2019<br>09.01.2019<br>19.01.2019<br>23.01.2019<br>02.02.2019<br>13.02.2019<br>16.02.2019<br>27.02.2019<br>02.03.2019<br>13.03.2019<br>16.03.2019<br>27.03.2019 | Toastmasters Community Club Meetings<br><br><br>Area Context | |

| | | | | |
|---|---|---|---|---|
| | | 30.03.2019<br>10.04.2019<br>08.05.2019<br>01.06.2019<br>12.06.2019<br>15.06.2019<br>26.06.2019<br>29.06.2019<br>10.07.2019<br>13.07.2019<br>24.07.2019<br>27.07.2019<br>07.08.2019<br>21.08.2019<br>24.08.2019<br>07.09.2019<br>16.10.2019<br>19.10.2019<br>23.10.2019<br>20.11.2019<br>23.11.2019<br>27.11.2019<br>18.12.2019 | | |
| 5 | සයමාසික පුහුණු වැඩ සටහන | 21.06.2019<br>28.06.2019<br>12.07.2019<br>26.07.2019<br>09.08.2019<br>23.08.2019<br>06.09.2019<br>25.10.2019<br>01.11.2019<br>08.11.2019<br>22.11.2019<br>29.11.2019<br>27.12.2019 | උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව (CTHE) 2019 කණ්ඩායම | කථිකාචාර්යවරුන් ( පරිවාස ) සහ ජ්‍යෙෂ් කථිකාචාර්යවරුන් සඳහා<br><br>මෙහෙයවීම<br>වෛද්‍ය ආර්.බී.මාරසිංහ මහතා |
| 6 | සායනික පුහුණුව | 20.02.2019 | සායනික පුහුණුව | වෛද්‍ය සිසුන් සඳහා සායනික පුහුණු වැඩසටහන මෙහෙයවීම<br>කොළඹ දකුණු ශික්ෂණ රෝහලේ, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල හෝමගම මූලික රෝහල |
| 7 | වැඩමුළුව | 29.07.2019 | ලිපි ගොනු කළමනාකරණය සහ කාර්යාල ක්‍රියා පටිපාටි සහ මූල්‍ය රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි | ව්‍යවහාරික විද්‍යා පීඨයේ කළමනාකරණ සහායකයින් සහ ඊට අනුබද්ධ ශ්‍රේණි සඳහා<br><br>මෙහෙයවීම |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 1. කේ.ජී.බ්‍රිටෝ මහතා, රෙජිස්ට්‍රාර්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>2.කේ.ටී.සී.ප්‍රියංගනී මහත්මිය මුල්‍යාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 8 | වැඩමුළුව | 09.08.2019 | ලිපි ගොනු කළමනාකරණය සහ කාර්යාල ක්‍රියා පටිපාටි සහ මූල්‍ය රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි | ඉංජිනේරු පීඨයේ කළමනාකරණ සහායකයින් සහ ඊට අනුබද්ධ ශ්‍රේණි සඳහා<br><br>මෙහෙයවීම<br><br>1. කේ.ජී.බ්‍රිටෝ මහතා, රෙජිස්ට්‍රාර්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>2.කේ.ටී.සී.ප්‍රියංගනී මහත්මිය මුල්‍යාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 9 | උපදේශන වැඩසටහන | 06.08.2019<br>20.08.2019<br>03.09.2019 | උපදේශන වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සියලුම අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා<br><br>මෙහෙයවීම<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මනෝවිකිත්සක අංශයේ ප්‍රධානී වෛද්‍ය ජයමාල් ද සිල්වා හා වෛද්‍ය ඩී.එල්.යූ.අමරකෝන් මහත්මිය කථිකාචාර්ය, මනෝ විකිත්සාව, වෛද්‍ය කසුන් , මනෝවිකිත්සාව, කොළඹ දකුණු ශික්ෂණ රෝහල |
| 10 | වැඩමුළුව | 03.09.2019 | වත්කම් ලේඛනය සහ ඉන්වෙන්ටරි කළමනාකරණ පද්ධතිය සවි කරන්න | සියලුම පීඨාධිපතිවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානී, සියලුම විධායක කාර්ය මණ්ඩලය සහ ඉන්වෙන්ටරි භාර නිලධාරීන් සඳහා,<br>මෙහෙයවීම<br>හිරිපිටිය මහත්මිය ,නියෝජ්‍ය මූල්‍යාධිකාරී,මූල්‍ය අංශය |
| 11 | වැඩමුළුව / පුහුණුව | 28.10.2019<br>29.10.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | නඩත්තු අංශයේ සියලුම අනධ්‍යයන නොවන කාර්ය මණ්ඩලය සඳහා කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේදී පවත්වන ලදී |

| | | | | |
|---|---|---|---|---|
| 12 | වැඩමුළුව / පුහුණුව | 11.11.2019<br>12.11.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සුභසාධන අංශයේ සියලුම අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ලයා ලෙෂර් කුකුලේගග<br>මෙහෙයවීම<br>ආචාර්ය පී.ඒ.එන්.එස්. අනුරාධා,<br>මහාචාර්ය ගාමිනි රණසිංහ<br>ජ්‍යොෂ් මහාචාර්ය හේමන්ත කොට්ටවත්ත,<br>තුෂාරි මල්කාන්ති මහත්මිය, |
| 13 | වැඩමුළුව / පුහුණුව | 11.11.2019<br>12.11.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන නිලධාරීන් සඳහා මින්නේරිය Gunners' Club හිදී පවත්වන ලදී<br>මෙහෙයවීම<br>කේ.ජී.බ්‍රිටෝ මහතා,<br>රෙජිස්ට්‍රාර්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 14 | වැඩමුළුව / පුහුණුව | 26.11.2019<br>27.11.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ව්‍යවහාරික විද්‍යා පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා Club Hotel Dolphin , හිදී පවත්වන ලදී<br>මෙහෙයවීම<br>කේ.ජී.එස්.ආර්.ජයවර්ධන මහතා<br>වෘත්තීය උපදේශක<br>වෘත්තීය උපදේශන අංශය සහ මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ මහතා , භාෂා හා සංස්කෘතික අධ්‍යයන හා රංග කලා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| 15 | වැඩමුළුව / පුහුණුව | 06.12.2019<br>07.12.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | පරිපාලනගොඩනැඟිලි,විනයා රක්ෂක නිලධාරීන් හා ශාරීරික අධ්‍යාපන අංශයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා Club Palm Bay Hotel,මාරවිල හීදී පවත්වන ලදී<br>මෙහෙයවීම<br>කේ.ජී.බ්‍රිටෝ මහතා,<br>රෙජිස්ට්‍රාර්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |

| | | | | |
|---|---|---|---|---|
| 16 | වැඩමුළුව / පුහුණුව | 08.12.2019<br>09.12.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරීන් සඳහා කාර්ය මණ්ඩලය සඳහා (1 වන කණ්ඩායම)<br>Resource Persons<br>මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසාංගික කලා දෙපාර්තමේන්තුව<br>චමිල් ජයසේකර මහතා<br>අංශ ප්‍රධානී/ පුහුණු<br>Imperial Fire and Safety<br>උප පොලිස් පරීක්ෂක<br>කේ.ඒ.ආර්.සංජීවපිය මහතා<br>මිරිහාන පොලිස් ස්ථානය |
| 17 | වැඩමුළුව / පුහුණුව | 12.12.2019<br>13.12.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ හා සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා Club Palm Bay Hotel,මාරවිල හීදී පවත්වන ලදී<br>මෙහෙයවීම<br>කේ.ජී.එස්.ආර්.ජයවර්ධන මහතා<br>වෘත්තීය උපදේශක<br>වෘත්තීය උපදේශන අංශය |
| 18 | වැඩමුළුව / පුහුණුව | 13.12.2019<br>14.12.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රියදුරන් සඳහා Club Palm Bay Hotel,මාරවිල හීදී පවත්වන ලදී<br>මෙහෙයවීම<br>ආචාර්ය ඒ.පී.එන්, ද එස්. අබයසුන්දර මහතා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා හා මානව විද්‍යා දෙපාර්තමේන්තුව<br>ඩබ්ලිව්.ඩබ්ලිව්. ජයරත්න<br>පොලිස් පරීක්ෂක<br>ප්‍රාදේශීය රථවාහන ස්ථානාධිපති<br>නුගේගොඩ |
| 19 | වැඩමුළුව / පුහුණුව | 14.12.2019<br>15.12.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරීන් සඳහා කාර්ය මණ්ඩලය සඳහා (II වන කණ්ඩායම) Club Palm Bay |

| | | | | |
|---|---|---|---|---|
| | | | | Hotel,මාරවිල හීදී පවත්වන ලදී<br>මෙහෙයවීම<br>මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසාංගික කලා දෙපාර්තමේන්තුව<br>චමිල් ජයසේකර මහතා අංශ ප්‍රධානී/ පුහුණු Imperial Fire and Safety<br><br>උප පොලිස් පරීක්ෂක කේ.ඒ.ආර්.සංජීවපිය මහතා මිරිහාන පොලිස් ස්ථානය |
| 20 | වැඩමුළුව / පුහුණුව | 14.12.2019<br>15.12.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා Club Palm Bay Hotel,මාරවිල හීදී පවත්වන ලදී |
| 21 | වැඩමුළුව / පුහුණුව | 16.12.2019<br>17.12.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ නිලධාරීන් සඳහා Club Palm Bay Hotel,මාරවිල හීදී පවත්වන ලදී<br><br>මෙහෙයවිම<br>කේ.ජී.බ්‍රිටෝ මහතා, රෙජිස්ට්‍රාර්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 22 | වැඩමුළුව / පුහුණුව | 16.12.2019<br>17.12.2019 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අනධ්‍යයන නිලධාරීන් සඳහා ලයා ලෙෂර් කුකුලේගග හීදී පැවැත්වීය<br>මෙහෙයවිම<br>රංග පල්ලේවෙල මහතා |

## තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය(CITS)

තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ පරිගණක ජාලයේ ව්‍යුහය සම්බන්ධ අධීක්ෂණය සහ නඩත්තු කිරීම, අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් පහසුකම් සැපයීම, සේවාදායක පරිගණක අධීක්ෂණය, විද්‍යුත් සේවා සහ යෙදුම් නඩත්තු කිරීම ඇතුළු සියලුම තාක්ෂණික සේවාවන් සපයන ප්‍රධාන මධ්‍යස්ථානයයි. එමෙන්ම තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය මඟින් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවි ද පවත්වාගෙන යනු ලබන අතර පරිපූර්ණ මාධ්‍ය ඒකකයකින් ද සමන්විතය.

තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානයේ තොරතුරු පද්ධති කළමණාකරු ලෙස හර්ෂ මුණසිංහ මහතා නායකත්වය දෙන ලද අතර වජිර ප්‍රේමදාස මහතා සහ නෙත්සිරි ජයවීර මහතා පරිගණක උපදේශකයන් ලෙස සේවය කරන ලදී. සහකාර ජාල කළමණාකරු ලෙස සුරේෂ් නානායක්කාර මහතා සේවය කරන ලදී. පරිගණක ක්‍රමලේඛකයන් ලෙස අශේලා නිල්මිණී මහත්මිය සහ රුණුක එදිරිසූරිය මහතා සේවය කරන ලද අතර තාක්ෂණික නිළධාරීන් ලෙස උපුල් වීරතුංග මහතා, දිනිති වීරසිංහ මහත්මිය සහ එස්.කේ. ගුරුගේ මහතා සේවය කරන ලදී. එච්.එම්.එම්.එස්. නිසංසලා මෙනවිය කළමණාකරණ සහකාර ලෙස ද, විද්‍යාගාර සහායක ලෙස බණ්ඩාර යාපා මහතා ද සේවය කරන ලදී. වැඩ සහායක ශාන්ත කුමාර මහතා සමඟ තාවකාලික සේවක හවතුන් කිහිප දෙනෙකු ම තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානයේ, මාධ්‍ය මධ්‍යස්ථානයේ සහ වෙබ් කණ්ඩායමේ සේවය කරන ලදී.

තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානයෙන් ලබා දෙන ප්‍රධාන සේවාවන්...

- විශ්වවිද්‍යාලයීය විද්‍යුත් තැපැල් පහසුකම පවත්වාගෙන යාම
- අන්තර්ජාල පහසුකම් ලබා දීම සහ පවත්වාගෙන යාම
- සේවාදායක පරිගණක අධීක්ෂණය සහ විද්‍යුත් සේවා සහ යෙදුම් නඩත්තු කිරීම
- කළමනාකරණ පද්ධති සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම
- මෘදුකාංග සංවර්ධනය හා විද්‍යුත් විසඳුම් ලබාදීම
- පුද්ගලික අවකාශ පද්ධති (Private Cloud System) පවත්වාගෙන යාම
- විශ්වවිද්‍යාලයීය තන්තු ප්‍රකාශ යොත් පද්ධතියේ (Fiber Optic Backbone) ව්‍යුහය වැඩිදියුණු කිරීම
- අභ්‍යන්තර ජාල පද්ධති සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම
- Wi-Fi පහසුකම් සැපයීම සහ වැඩිදියුණු කිරීම
- විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සංවර්ධනය සහ යාවත්කාලීන කිරීම
- විශේෂ අවස්ථා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ආවරණය කිරීම
- අභ්‍යන්තර දුරකථන පද්ධතියේ නව සම්බන්ධතා ස්ථාපනය කිරීම, නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම
- VoIP පද්ධතිය පවත්වාගෙන යාම
- තොරතුරු සන්නිවේදන උපාංග නඩත්තු කිරීම සහ තාක්ෂණික උපදෙස් ලබා දීම
- පරිගණක මෘදුකාංග ස්ථාපනය කිරීම සහ ප්‍රති වෛරස මෘදුකාංග යාවත්කාලීන කිරීම
- තාක්ෂණික නියමාවලි/ පිරිවිතර සැකසීම සහ තුලනය කිරීම
- කාර්යය මණ්ඩලය සඳහා විශේෂ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම
- තොරතුරු තාක්ෂණ මෙවලම් භාවිතය සම්බන්ධව කාර්යය මණ්ඩලය දැනුවත් කිරීම සහ අවශ්‍ය සහයෝගය ලබා දීම
- සිසුන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපදේශන සේවාවන් සහ තාක්ෂණික සහය ලබා දීම

## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

1979 වර්ෂයේ වාණිජ විද්‍යා බාහිර උපාධි පාඨමාලාව ආරම්භ කිරීමත් සමඟ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශය ක්‍රියාත්මක විය. ඉන් අනතුරුව ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා ආරම්භ විය. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව හා විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව 1997 සිට ක්‍රියාත්මක විය. ශාස්ත්‍රවේදී හා විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන බාහිර උපාධි පාඨමාලා ඉතා ජනප්‍රිය විය.

2010 ඔක්තෝබර් මස 15 වන දින නිකුත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 932 ට අනුව බාහිර උපාධි ඒකකය නමින් ක්‍රියාත්මක වූ මෙම ඒකකය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය නමින් ව්‍යුහාත්මක වෙනසකට භාජනය විය.

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

(i) උපකුලපති
(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන නියෝජිතයකු
(iii) පාලක සභාව විසින් පත් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකු
(iv) පීඨාධිපතිවරුන්
(v) බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ අධ්‍යයන මණ්ඩල සාමාජිකයින්
(vi) ලේඛකාධිකාරී
(vii) මූල්‍යාධිකාරී
(viii) බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ අධ්‍යක්ෂ
(ix) බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
(x) බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය 2014 වර්ෂයේ සිට පහත සඳහන් පරිදි නව විෂය නිර්දේශ යටතේ පාඨමාලා හඳුන්වාදෙන ලදී.

**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**

(i) ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
(ii) ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
(iii) සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

**කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය**

(i) විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
(ii) විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව
(iii) වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

ඉහත දක්වන ලද නව උපාධි පාඨමාලාවන් සඳහා 2019 වර්ෂයට පහත සඳහන් පරිදි සිසුන් ලියාපදිංචි කරන ලදී.

| | |
|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | - 1593 |
| ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | - 308 |
| සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | - 105 |
| විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව | - 826 |
| වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | - 804 |

2019 වර්ෂයේ එක් එක් උපාධි පාඨමාලාව වෙනුවෙන් පවත්වන ලද සම්මන්ත්‍රණ සහ පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| උපාධි පාඨමාලාව | පවත්වා ඇති සම්මන්ත්‍රණ සංඛ්‍යාව | පවත්වා ඇති පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|
| ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **02**<br>(2017 කණ්ඩායම II අදියර, 2018 I අදියර , 2019 කණ්ඩායම I අදියර) | **03**<br>[2014 කණ්ඩායම උපාධි III, මාර්තු/අප්‍රේල් 2019 (නව නිර්දේශය)<br><br>2015 කණ්ඩායම උපාධි II (නව නිර්දේශය), නොවැම්බර්/දෙසැම්බර් 2019<br><br>2017 කණ්ඩායම උපාධි I (නව නිර්දේශය), ජූලි 2019] |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව (පැරණි නිර්දේශය) | - | 03<br>[ශාස්ත්‍රවේදී ප්‍රථම පරීක්ෂණය 2019 ජුනි,<br><br>උපාධි I, 2019 පෙබරවාරි/ මාර්තු (නව සහ පැරණි නිර්දේශ ),<br><br>උපාධි II, 2019 ජුනි] |
| ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **03**<br>[2015 කණ්ඩායම උපාධි III | **02**<br>[2015 කණ්ඩායම උපාධි II, |

| | | |
|---|---|---|
| | 2018 කණ්ඩායම උපාධි I , 2019 කණ්ඩායම උපාධි I] | 2017 කණ්ඩායම උපාධි I, 2019 පෙබරවාරි/ මාර්තු ] |
| සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **04** [2015 කණ්ඩායම උපාධි III, 2017 කණ්ඩායම උපාධි II , 2018 කණ්ඩායම උපාධි II 2019 කණ්ඩායම උපාධි I] | **01** [2018 කණ්ඩායම උපාධි I, 2019 සැප්තැම්බර්] |
| විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව | **03** [2019 කණ්ඩායම උපාධි I , 2017 කණ්ඩායම උපාධි II, 2018 උපාධි I ] | **03** [2014/2015 උපාධි II - පුනර් (නව/පැරණි) 2019 ජනවාරි,<br>2015 උපාධි III (නව/ පැරණි) 2019 ජනවාරි,<br>2019 කණ්ඩායම උපාධි I (නව/පැරණි)2019 නොවැම්බර්] |
| වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **03** [2017 කණ්ඩායම උපාධි II, 2018 කණ්ඩායම උපාධි I, 2019 කණ්ඩායම උපාධි I] | **03** [2015 උපාධි III (නව නිර්දේශය) 2019 පෙබරවාරි,<br>2018 උපාධි I (නව නිර්දේශය) 2019 නොවැම්බර්,<br>උපාධි I, II, III (පැරණි නිර්දේශය) 2019 නොවැම්බර්] |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | **2** [2016 කණ්ඩායම උපාධි III, 2017 කණ්ඩායම උපාධි II ] | **2** [2016 කණ්ඩායම උපාධි II -2019 ජුනි/ ජූලි,<br>2017 කණ්ඩායම උපාධි I – 2019 පෙබරවාරි] |

මේ වන විට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව **98852** ක් වන අතර එම උපාධි අපේක්ෂකයන් සඳහා සේවය ලබා දීමට පහත සඳහන් පරිදි කාර්ය මණ්ඩලය සේවයේ යොදවා ඇත.

1. අධ්‍යක්ෂතුමා
2. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
3. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
4. ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාරවරුන් 04
5. මාණ්ඩලික සහකාරවරුන් 03
6. කළමනාකරණ සහකාරවරුන් 16
7. පරිගණක වැඩසටහන් සම්පාදකවරුන් 01
8. වැඩ සහායක සේවකභවතුන් 05
9. කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු

## පුස්තකාලය

පුස්තකාලයාධිපතිනී ආචාර්ය නයනා විජයසුන්දර මහත්මියගේ මඟ පෙන්වීම යටතේ එක් නියෝජ්‍ය පුස්තකාලයාධිපතිවරයෙක්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් 04 දෙනෙක්, සහකාර පුස්තකාලයාධිපතිවරුන් 07 දෙනෙක්, සහකාර ජාල කළමනාකාරවරයෙක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජිකයින් 54දෙනෙක් පුස්තකාලයේ රාජකාරි ඉටු කළහ.

වර්ෂය තුළ වාර්ෂික ප්‍රතිපාදන උපයෝගී කරගෙන රු. 13,195,286.65 ක් වැයකර පොත් 978 ක් මිලදී ගන්නා ලදි. එමෙන්ම රු. 6,721,375.25 ක් වැයකර විදේශීය හා දේශීය වාර සඟරා හතලිස් හයක් මිලදී ගන්නා ලදි. තවද විද්‍යුත් දත්ත සමුදායන් තුනක්; එනම් JSTOR (රු. 1,152,226.25 ක පිරිවැයක් යටතේ ), Research life (රු. 270,575.60 ක පිරිවැයක් යටතේ) සහ SCOPUS (රු. 3,383,617.95 ක පිරිවැයක් යටතේ) මිලදී ගන්නා ලදී. එමෙන්ම රු.5,942,698.54 වටිනා පොත් 1551ක්, රු. 72,521.60ක් වටිනා විදේශීය සහ දේශීය වාර සඟරා 244 ක් සහ පුස්කොළ අත් පිටපත් 385 ක් පරිත්‍යාග වශයෙන් ලැබී ඇති අතර වාර ප්‍රකාශන 48 ක් හුවමාරු පදනම මත ලැබී තිබුණි.

මීට අමතරව, අනුග්‍රාහකයන් සඳහා වෙනත් ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායන් 03 කට එනම්; එමරල්ඩ්, ටේලර් සහ ෆ්‍රැන්සිස් යන දත්ත සමුදායන්වලට සහ වෛද්‍ය අත්පොත් එකතුවක් ඇතුළු ඔක්ස්ෆර්ඩ් ජර්නල් යන දත්ත සමුදායන් සඳහා ප්‍රවේශවීමට වි.වි.ප්‍ර.කො.ස විසින් පහසුකම් සලසන ලදි. බ්‍රිතාන්‍ය පුස්තකාලය හරහා ලේඛන බෙදා හැරීමේ ක්‍රියාවලියක් කොන්සාල් කාර්යාලය හරහා පාඨකයින් සඳහා ලබා දෙන ලදී.

2019 වර්ෂය තුළ සැකසුම් අංශය සහ පීය පුස්තකාල විසින් පොත් මාතෘකා 1534 ක් සහ පිටපත් 2525 ක් සකස් කරන ලදී. මෙම පොත් ප්‍රමාණය සිලොන් රූම් සඳහා (CR) 337කින් ද, නිත්‍ය පරිශීලන සඳහා (PR) සිට 388කින් ද, උපලේඛනගත පරිශීලන සඳහා (SR) 316කින් ද, බැහැරදෙන (L) පොත් 1484 කින් ද සමන්විත විය. 2019 වර්ෂය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලය (77), අනධ්‍යයන කාර්ය මණ්ඩලය (60), උපාධි අපේක්ෂකයින් (3637) සහ ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි සිසුන් (167) ඇතුළුව පාඨකයින් 3941 ක් ලියාපදිංචි වී ඇති අතර එම ප්‍රමාණයත් ඇතුළුව ලියාපදිංචි වූ මුළු පරිශීලකයින් සංඛ්‍යාව 18,117 කි.

අන්තර් පුස්තකාල ණය ඉල්ලීම් ඉටු කිරීමේ අනුපාතය 88.8% කි. ලැප්ටොප් බැහැර දීමේ සේවාව 2019 දී පරිශීලකයින් 944 දෙනෙකු විසින් භාවිතා කරන ලදී. මෙම සේවාව සඳහා ලැප්ටොප් පරිගණක 30 ක් අප විසින් වෙන් කර ඇත. ශාස්ත්‍රීය බැංකුවේ (ආයතනික ගබඩාවේ) මුළු ඇතුළත් කිරීම් සංඛ්‍යාව 7764 ක් වන අතර 2019 වසර අවසන් වන විට පුවත්පත් ලිපි දත්ත සමුදාය තෝරාගත් පුවත්පත් ලිපි 2235 කින් සමන්විත විය.

තොරතුරු සම්පත් හා තොරතුරු සාක්ෂරතා කුසලතා පිළිබඳ උපාධි අපේක්ෂකයිනගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා පුස්තකාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් වැඩමුළු 13 ක් පවත්වන ලදී. පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් 2019 වර්ෂය තුළ දී ආචාර්ය උපාධි 02 ක්, ශාස්ත්‍රපති උපාධිය 06 ක්, උපාධි 06 ක් සහ ඩිප්ලෝමා අධ්‍යයන 07 ක් සම්පූර්ණ කරන ලදී.

# අභ්‍යන්තර විගණන අංශය

**අභ්‍යන්තර විගණන අංශයෙහි ව්‍යුහය සහ කාර්යභාරය**

අභ්‍යන්තර විගණන අංශය නියෝජ්‍ය අභ්‍යන්තර විගණකගේ ප්‍රධානත්වයෙන් පාලනය වේ. වාර්ෂික විගණන වැඩසටහන පිළියෙල කර විගණන කමිටුවේ නිර්දේශය සමඟ විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

**විගණන කමිටු රැස්වීම්.**

විගණන කමිටුවේ සාමාජිකයන් වශයෙන් විධායක නොවන තත්වයේ පාලක සභා සාමාජිකයින් තිදෙනෙකු පත්කර ඇති අතර ඉන් එක් අයෙකු සභාපතිත්වය දරයි. 2019 වර්ෂයේ දී කමිටුව හතර වරක් රැස්වූ අතර පහත සඳහන් වැදගත් කරුණු සාකච්ඡා කරන ලදී.

**(අ)** දැනට පවත්නා ක්‍රමවේද, පටිපාටි සහ ඒවායෙන් බැහැරවීම් ඇත්නම් ඒවා විමර්ශනයට භාජනය කරන ලද අතර පවත්නා තත්වය වැඩි දියුණුව සඳහා පාලක සභාවේ අනුමැතිය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

**(ආ)** විගණකාධිපතිවරයාගේ විමසීම් වලට, අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ පිළිතුරු කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කර ඒ පිළිබඳව සාකච්ඡා කර නිවැරදි ක්‍රමයක් අනුගමනය කිරීමට කටයුතු සැලසීම.

| | | | 6.1.2.2 | අදාළ බලධාරීන් විසින් ප්‍රජා සම්බන්ධතා ක්‍රියාකාරකම් විධිමත් කිරීමට වගබලා ගැනීම. |
| 6.2 සිසුන්ගේ සමාජ වගකීම වැඩි දියුණු කිරීම | 6.2.1 | සිසුන් අතර සමාජ වගකීම පිළිබඳ ආකල්ප වැඩි දියුණු කිරීම | 6.2.1.1 | අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය විසින් ශිෂ්‍ය ප්‍රඥප්තිය ප්‍රතිශෝධනය කර වැඩි දියුණු කිරීම |
| | | | 6.2.1.2 | අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය විසින් වි.වි.ප්‍ර.කො. සභාව සමඟ එකතුවී දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම |
| | | | 6.2.1.3 | සමාජ සංහිදියා ක්‍රියාකාරකම් පැවැත්වීමට වගබලා ගැනීම |

තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ උපායමාර්ගික සැලැස්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හි ඊළඟ / උපායමාර්ගික සැලැස්ම -1919-1924 සමඟ ඒකාබද්ධ කිරීමට තීරණය කරන ලදි.

## 6. ආයතනික සමාලෝචනයේ දී ඉදිරිපත් වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම්:

විශ්ව විද්‍යාලයේ ආයතනික සමාලෝචනයේ (IR) අවසන් වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2018-2022 තත්ත්ව සහතික උපදේශක මහාචාර්ය කල්‍යාණි පෙරේරාගේ මඟ පෙන්වීම ඇතිව තත්ත්ව සහතික අධ්‍යක්ෂ විසින් සකස් කර ඇත. මෙම ක්‍රියාකාරී සැලැස්මේ යෝජනා කර ඇති ක්‍රියාකාරකම් 2021-2024 කාලපරිච්ඡේදය සඳහා වන විශ්ව විද්‍යාල උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කෙරේ.

## 2018 - 2022 කාලපර්ච්ඡේදය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම

**ආයතනික සමාලෝචනය - 2018-2022 සඳහා ක්‍රියාකාරී සැලැස්ම**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**හැඳින්වීම: ආයතනික සමාලෝචනයේ අවසාන සමාලෝචන වාර්තාවේ ඉදිරිපත් කරන ලද නිර්දේශ සැලසුම් සහගත ක්‍රියාකාරකම් / උපාය මාර්ග මගින් පිළිබිඹුවේ.**

**උපායමාර්ග සහ ක්‍රියාකාරකම්**

***නිර්ණායක 1 – පාලනය සහ කළමනාකරණය***

| අංක ය. | ක්‍රියාකාරකම් / උපායමාර්ග | උප ක්‍රියාකාරකම් | ආරම්භක දිනය | අවසන් කරන දිනය | කාර්ය සාධන දර්ශක මගින් වාර්ෂික ඉලක්ක | | | | | වගකිවයුතු නිලධාරී | ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2018 | 2019 | 2020 | 2021 | 2022 | | |
| 1 | දැක්ම සහ මෙහෙවර පිළිබඳ මූලික සංකල්ප සියළුම පීය හා අංශ විසින් පවත්වනු ලබන වැඩසටහන්වලට අන්තර්ගත කිරීම | පීය හා අංශවල ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණය කිරීම | 01.01.2020 | 31.12.2022 | අදාළ පීය විසින් 2017-2021 සහ 2021-2024 විශ්වවිද්‍යාල උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව සකස් කරන ලද ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම් වලදී මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත. | | | | | උපකුළපති, පීඨාධිපතිවරුන් | |
| 2 | ඉහළම මට්ටමින් ගනු ලබන තීරණ සියලු අංශ හා ඒකක විසින් ඒකාකාරව ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම | පීය හා අංශවල ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණය කිරීම | 01.01.2020 | 31.12.2022 | 2017-2021 සහ 2021-2024 කාලපරිච්ඡේදයට අදාළ විශ්වවිද්‍යාල උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේදී මේ සම්බන්ධව අවධානය යොමුකරනු ලැබේ. | | | | | උපකුළපති, පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී | |
| 3 | උපායමාර්ගික හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී සියලුම අභ්‍යන්තර හා | | 01.01.2020 | 30.06.2020 | උපායමාර්ගික සැලසුම් කමිටුව විසින් 2021-2024 සඳහා විශ්ව විද්‍යාල උපායමාර්ගික සැලැස්ම සකස් කරන විට මේ සම්බන්ධව අවධානය යොමුකරනු ලැබේ. | | | | | උපායමාර්ගික සැලසුම් කමිටුව | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | බාහිර පාර්ශ්වකරුවන්ට ආරාධනා කිරීම | | | | | | | | | | |
| 4 | අංශ / ඒකකවල සියලුම ප්‍රධාන කාර්යයන් සඳහා ක්‍රියා පටිපාටි සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි පිළිබඳ අත්පොත් සකස් කිරීම | විශ්වවිද්‍යාලය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම (සංවර්ධනය කරන ලද ප්‍රතිපත්ති ලැයිස්තුව සඳහා ඇමුණුම I බලන්න) | 01.05.2018 | 31.12.2020 | ප්‍රතිපත්ති 19 ක් (08/11/18 දින අනුමත කර ඇත) | ප්‍රතිපත්ති 1 ක් (29/08/19 දින අනුමත කර ඇත) | ප්‍රතිපත්ති 2 | | | රෙජිස්ට්‍රාර් (කළමනාකරණ මාර්ගෝපදේශය සඳහා) අධ්‍යක්ෂ / විභාග (විභාග පිළිබඳ ස.මෙ.ප්‍ර. මූල්‍යාධිකාරී (මූල්‍ය පිළිබඳ ස.මෙ.ප්‍ර.) අධ්‍යක්ෂ / අ.ත.ස.ඒකකය) | විශ්ව විද්‍යාල සනාතන සභාවේ සහ කවුන්සිලයේ විවිධ ප්‍රතිපත්ති 20 ක් සකස් කර අනුමත කර ඇත. කවුන්සිලයේ අනුමත දිනය අදාළ කොටුතුළ දක්වා ඇත. කළමනාකරණ මාර්ගෝපදේශය සකස් වෙමින් පවතින අතර එහි පළමු කෙටුම්පත 2019 දෙසැම්බර් 31 වන විට සකස්කිරීමට අපේක්ෂා කෙරේ. කළමනාකරණ මාර්ගෝපදේශය සකස් |
| | | කළමනාකරණ මාර්ගෝපදේශයක් සකස් කිරීම | 21.03.2019 | 31.12.2020 | | මාර්ගෝපදේශ 1 | | | | | |
| | | මූල්‍ය හා විභාග පිළිබඳ සම්මත මෙහෙයුම් ප්‍රතිපත්ති සකස් කිරීම | 01.01.2020 | 31.12.2021 | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | කිරීමෙන් පසු 2020 දී සම්මත මෙහෙයුම් ප්‍රතිපත්ති(මූල්‍ය හා විභාග) සකස් කිරීම ආරම්භ වේ. |
| 5 | සියළුම විශ්ව විද්‍යාල කාර්යයන් / වැඩසටහන් වල ප්‍රතිඵල පදනම් කරගත් ප්‍රවේශයට අනුකූලවීම වැඩි දියුණු කිරීම | පීඨ හා අංශවල ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණය කිරීම | 01.01.2020 | 31.12.2021 | මේ වන විටත් උපාධි පාඨමාලා සඳහා ප්‍රතිඵල පදනම් කරගත් අධ්‍යාපන ප්‍රවේශයක් ඇතුළත් කර ඇති 2017-2021 විශ්ව විද්‍යාල ක්‍රමෝපායික සැලැස්මට අනුකූලව සකස් කරන ලද ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී අදාළ පීඨ සහ අංශ විසින් මේ පිළිබඳ කටයුතු කරනු ඇත. | | | | | උපකුළපති, පීඨාධිපතිවරුන් | |
| 6 | ඉතිරි සියලුම සේවක පුරප්පාඩු පිරවීම. වැඩ කිරීමේ සම්මතයන් සකස් කිරීම යුතු අතර සියලු පීඨවල කාර්ය මණ්ඩලයේ වැඩ ප්‍රමාණය ගණනය කිරීම | අධ්‍යයන වගවීමේ ලේඛනයේ කටයුතු අවසන් කිරීම | 01.01.2019 | 31.12.2020 | | | ලේඛන 1 | | | උපකුළපති, පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී | අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමේ කටයුතු සිදු වෙමින් පවතී. අධ්‍යයන වගවීම පිළිබඳ පවත්නා ලේඛනයට සංශෝධනයක් ලෙස වැඩ සම්මතයන් සඳහා පුළුල් |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | මාර්ගෝප දේශයක් සකස් කිරීම මේවනවිට සිදු වෙමින් පවතී. |
| 7 | කාර්ය මණ්ඩලය සඳහා වර්යාධර්ම පද්ධතියක් (CoC) සම්පාදන කිරීම | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වර්යාධර්ම පද්ධතිය | 01.01.2020 | 31.12.2021 | | | වර්යාධර්ම පද්ධති 1 | | | උපකුලපති, පීඨාධිපති, අධ්‍යක්ෂ / අධ්‍යයන ආයතන (AE) | |
| | | අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වර්යාධර්ම පද්ධතිය | | | | | | වර්යාධර්ම පද්ධති 1 | | ලේඛකාධිකාරී, ජ්‍යෝ.ස. ලේඛකාධිකාරී / අනධ්‍යයන ආයතන (NAE) | |
| 8 | එක් එක් කාණ්ඩයේ කාර්ය මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම් සැලකිල්ලට ගනිමින් සුදුසු කාර්ය සාධන ඇගයීම් (කා.ඇ.) ක්‍රමවේදයක් සකස් කිරීම | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදයක් | 01.01.2021 | 31.12.2022 | | | | සාධන ඇගයීම් ක්‍රමවේද 1 ක් | | අධ්‍යක්ෂ / අධ්‍යයන ආයතන | |
| | | අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සාධන ඇගයීම් ක්‍රමවේදයක් | | | | | | | සාධන ඇගයීම් ක්‍රමවේද 1 | ජ්‍යෝ.ස. ලේඛකාධිකාරී / අනධ්‍යයන ආයතන | |
| 9 | ජාත්‍යන්තර සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් පවතින | විදේශීය සිසුන් අතර විශ්ව විද්‍යාලය ප්‍රවර්ධනය | 01.01.2019 | 31.12.2022 | | සිසුන් සංඛ්‍යාව 12 | සිසුන් සංඛ්‍යාව 17 | සිසුන් සංඛ්‍යාව 22 | සිසුන් සංඛ්‍යාව 27 | ජාත්‍යන්තර ශිෂ්‍ය කාර්යාලය | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | යාන්ත්‍රණයන් වැඩි දියුණු කිරීම | කිරීම (විස්තර සඳහා ඇමුණුම II බලන්න) | | | | | | | | | |
| | | සැපයුම් කාර්ය සංවිධාන සහාය ලබාදීම (විස්තර සඳහා ඇමුණුම II බලන්න) | 01.01.2019 | 31.12.2022 | සෑම වසරකම බඳවා ගන්නා සිසුන්ට සැපයුම් කාර්ය සංවිධාන සහාය ලබාදීම සිදුකරනු ලැබේ. | | | | | | |
| 10 | රැකියා ස්ථානයේ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම | වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම | 01.01.2020 | 31.12.2020 | | | ප්‍රතිපත්ති 1 | | | ලේඛකාධිකාරී | 2020 වර්ෂය ආරම්භය වන විට මෙය අවසන් කොට ප්‍රකාශයට පත් කෙරේ. ප්‍රතිපත්තියේ සංවර්ධනය සඳහා නිර්දේශ විෂය (TOR) සකස් කිරීමේ ක්‍රියාවලියේ දී. |
| 11 | නවක වදය අධීක්ෂණය කිරීමේ හා මර්දනය කිරීම සම්බන්ධයෙන් | | 01.01.2020 | 31.12.2021 | විශ්ව විද්‍යාලයේ 2021-2024. 2021-2024 ක්‍රමෝපායික සැලැස්මට අනුකූලව සකස්කරනලද සිය ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ අධ්‍යයන පීඨවල සහාය ඇතිව ප්‍රොක්ටර් කාර්යාලය විසින් මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත. | | | | | ප්‍රොක්ටර්, පීඨාධිපති | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පවත්නා ක්‍රමය වැඩිදියුණු කිරීම | | | | | | | | | | |
| ***නිර්ණායක 2 - විෂයමාලා සහ වැඩසටහන් සංවර්ධනය*** | | | | | | | | | | | |
| 1 | සියලුම වැඩසටහන් වරින් වර සංශෝධනයකට භාජනය වී ඇති බව සහතික කිරීම සඳහාත්, සියලුම අධ්‍යයන වැඩසටහන් වල පවත්නා උපාධි පාඨමාලා ශ්‍රී ලංකා තත්ත්ව කාර්යරාමු ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ප්‍රත්සංස්කරණය කිරීම සඳහා දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහාත්, මධ්‍යම මට්ටමේ අධීක්ෂණ හා විෂයමාලා සංවර්ධන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | විෂයමාලා සංවර්ධනය හා සමාලෝචනය පිළිබඳ සෙනෙට් අනුකමිටුවක් පිහිටුවීම | 01.01.2020 | 31.12.2020 | | 1 | | | | උපකුලපති, අධ්‍යක්ෂ /අ.ත.ස.ඒකකය | මේ සම්බන්ධයෙන් සනාතන සභාවේ අනුමැතිය ලබාගෙන ඇත. සනාතන සභාවේ විෂයමාලා සමාලෝචන හා සංවර්ධන අනුකමිටුවේ වගකීමක් වශයෙන් නිර්නේය විෂය(TOR) සංවර්ධනය වෙමින් පවතී. එය 2020 ආරම්භයේ සිට ක්‍රියාත්මක වේ. |
| | | සනාතන සභාවේ විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටුව හා පීඨ විෂයමාලා | 01.01.2020 | 31.12.2022 | පීඨ විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටු | පීඨ විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටු 8 | ( සනාතන සභාවේ විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටු1 සහ පීඨ | ( සනාතන සභාවේ විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටු1 සහ පීඨ | ( සනාතන සභාවේ විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටු1 සහ පීඨ | උපකුලපති, පීඨාධිපති, සභාපති, සෙනෙට් වි.සමා. හා සං.කමිටුව, පීඨ වි.සමා. හා | දැනට අධීක්ෂණය සිදු කරනු ලබන්නේ පීඨ වි.සමා. හා සං.කමිටු විසිනි. සනාතන |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සමාලෝචන හා සංවර්ධන කමිටුව විසින් අධීක්ෂණය කිරීම. | | | 7 | | විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටු 9 ) | විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටු 9 ) | විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටු 8 ) | සං.කමිටුව සභාපතිවරු | සභාවේ පීය වි.සමා. හා සං.කමිටුව පත් කිරීමෙන් පසු එය උපාධි පාඨමාලා සංවර්ධනය, සමාලෝචනය සහ සංශෝධනය අධීක්ෂණය කිරීමේ කේන්ද්‍රීය ආයතනය වනු ඇත. |
| 2 | විශ්ව විද්‍යාලයේ වැඩසටහන් / කාර්යයන් ඇගයීමට ලක් කිරීම, විශ්ලේෂණය කිරීම, නිර්දේශ කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථාන සහ අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයන්හි ක්‍රියාකාරකම් පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම සහ පීඨාධිපති / | අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකක සඳහා උපායමාර්ගික සැලැස්මක් සහ අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථාන සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස්කිරීම | 01.01.2019 | 31.12.2020 | | | උ.සැ. 1<br>ක්‍රි.සැ. 8 | | | උපකුලපති, පීඨාධිපති, අධ්‍යක්ෂ / අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකක, සම්බන්ධීකාරක / අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථාන | අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයේ උපායමාර්ගික සැලැස්ම දැනටමත් සකස් කර ඇත. එය සෙනෙට් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පීඨ මණ්ඩලයට මෙන්ම සියලුම අධ්‍යයන හා පරිපාලන කටයුතු වලදී උපකුලපති / සෙනෙට් සභාවට හා කවුන්සිලයට අදාළ ලෙස උපදෙස් දීම | | | | | | | | | | උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කරනු ඇත. |
| 3 | අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය විසින් ආයතනික සමාලෝචනයේ හි ඊළඟ වටය සහ අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථාන විසින් වැඩසටහන් සමාලෝචනයේ හි ඊළඟ වටය සඳහා වරින් වර අභ්‍යන්තර සමාලෝචන සිදු කිරීම | ආයතනික සමාලෝචනය සඳහා විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව තක්සේරුවක් සිදුකිරීම<br><br>පීඨවල වැඩසටහන් සමාලෝචනය සඳහා අභ්‍යන්තර තත්ත්ව සමාලෝචන සිදුකිරීම | 01.01.2020 | 31.12.2022 | | | වැඩසටහන් සමාලෝචන 2 (ව්‍යා. වි. පීඨය, ස.සෞඛ්‍ය විද්‍යා පීඨය.) | වැඩසටහන් සමාලෝචන 1 | වැඩසටහන් සමාලෝචන 1 (මා.ශා. හා ස.වි.පීඨය) | උපකුලපති, අධ්‍යක්ෂ / අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය (ආයතනික අභ්‍යන්තර සමාලෝචනය සඳහා) පීඨාධිපති, සම්බන්ධීකාරක / අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථාන (වැඩසටහන් අභ්‍යන්තර සමාලෝචනය සඳහා). | |
| 4 | අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයේ සහ අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථානවල සහාය ඇතිව | අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයේ මාසික රැස්වීම්වලදී ආයතනික | 01.01.2018 | 31.12.2022 | රැස්වීම 4 | රැස්වීම 2 | රැස්වීම 2 | රැස්වීම 2 | රැස්වීම 2 | අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයේ කළමනාකරණ කමිටුව | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තු මට්ටමින්, පීඨ මට්ටමින් සහ සෙනෙට් සභාවේ දී සමාලෝචනයන්ගේ නිර්දේශ සාකච්ඡා කිරීම | සමාලොචනයන් හි නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය | | | | | | | | | |
| | | පීඨ අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථානවල මාසික රැස්වීම්වලදී ආයතනික සමාලොචනයන් හි නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය | | | පීඨයකට රැස්වීම් 2 බැගින් | පීඨයකට රැස්වීම් 2 බැගින් | පීඨයකට රැස්වීම් 2 බැගින් | පීඨයකට රැස්වීම් 2 බැගින් | පීඨයකට රැස්වීම් 2 බැගින් | | |
| ***නිර්ණායක 3 - ඉගැන්වීම සහ ඉගෙනීම*** | | | | | | | | | | | |
| 1 | සියළුම පීඨ වල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සමපදස්ත සමාලෝචන ක්‍රියාවලිය පුළුල් කිරීම | | 01.01.2020 | 31.12.2022 | විශ්වවිද්‍යාලයේ 2017-2021 සහ 2021-2024 යන උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව පීඨ විසින් සකස් කරන ලද ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම්වලදී අදාළ පීඨ විසින් මේ පිළිබඳ අවධානය යොමුකරනු ඇත. | | | | | පීඨාධිපතිවරු, අංශ ප්‍රධානීන් | |
| 2 | නිර්මාණාත්මක හා නව්‍ය ඉගැන්වීම් හඳුනා ගැනීම සහ ඒ සඳහා සම්මාන ප්‍රදානය කිරීම සඳහා | | 01.01.2020 | 31.12.2022 | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | යාන්ත්‍රණයක් සකස් කිරීම | | | | | | | | | | |
| 3 | සියලුම පාඨ මාලා ද්‍රව්‍ය ඉගෙනීම් කළමනාකරණ පද්ධතිය වෙත ඇතුළත් කිරීම සහ තක්සේරු කිරීමේ ක්‍රියාවලියේදී ඉගෙනීම් කළමනාකරණ පද්ධතිය භාවිතා කිරීමට දිරිමත් කිරීම | | 01.01.2020 | 31.12.2022 | | | | | | | |
| ***නිර්ණායක 4 - ඉගෙනුම් සම්පත්, ශිෂ්‍ය සහායසේවා සහ ප්‍රගතිය*** | | | | | | | | | | | |
| 1 | අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍ය ක්‍රියාකාරකම් සඳහා ඉහළ දෘශ්‍යතාවයක් ලබා දෙන විශ්ව විද්‍යාල වෙබ් අඩවි සහ පීඨ අඩවි යාවත්කාලීන කිරීම | | 01.01.2018 | 31.12.2022 | විශ්ව විද්‍යාල වෙබ් අඩවිය සහ පීඨ සහ අංශවල වෙබ් පිටු අඛණ්ඩව යාවත්කාලීන කිරීම සිදු කෙරේ. | | | | | අධ්‍යක්ෂ / ඩිජිටල් මාධ්‍ය සහ සන්නිවේදන සම්බන්ධීකාරක / තො.තා.සේ.ම. | |
| 2 | තවදුරටත් ප්‍රමාද වීමකින් තොරව කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම | | 01.01.2020 | 31.12.2020 | | | ක.තො.ප. | | | උපකුලපති., සම්බන්ධීකාරක / තො.තා.සේ.ම. | |
| 3 | සියලුම පාඨ මාලා තොරතුරු | පාඨ මාලා විස්තර සහිත | 01.01.2018 | 31.12.2022 | පීඨ 5 | පීඨ 7 | පීඨ 8 | පීඨ 8 | පීඨ 8 | පීඨාධිපතිවරු | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සටහන් / තක්සේරු කිරීමේ නිර්ණායක වෙබයේ ප්‍රදර්ශනය කිරීම (ඒවා ඉ.ක.පද්ධතියේ තබා ගැනීමට අමතරව) | පීය තොරතුරු විශ්ව විද්‍යාල වෙබ් අඩවියට ඇතුළත් කිරීම | | | | | | | | | |
| 4 | සියළුම පීයවල උපදේශන වැඩසටහන් පුළුල් කිරීම සහ විශ්වවිද්‍යාල ජීවිතය තුළ සිසු/සිසුවියන්ගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දීම | | 01.01.2020 | 31.12.2022 | විශ්වවිද්‍යාලයේ 2017-2021 සහ 2021-2024 යන උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව පීය විසින් සකස් කරන ලද ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම්වලදී අදාළ පීය විසින් මේ පිළිබඳ අවධානය යොමුකරනු ඇත. | | | | | පීයාධිපතිවරු, අංශ ප්‍රධානී | පීය |
| 5 | ඉගැන්වීමේ / ඉගෙනීමේ කටයුතුවලට අමතරව ශිෂ්‍ය සුහසාධන පහසුකම් පිළිබඳ ශිෂ්‍ය තෘප්තිමත් බව සම්බන්ධයෙන් නිරන්තරයෙන් සමීක්ෂණ සිදු කිරීම සහ එවැනි පහසුකම්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම | | 01.01.2020 | 31.12.2022 | | | සමීක්ෂණ 1 | සමීක්ෂණ 1 | සමීක්ෂණ 1 | අධ්‍යක්ෂ, ජො.ස.ලේ./ශිෂ්‍ය සුහසාධන අංශය | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 6 | ශිෂ්‍යාවන් සඳහා නේවාසිකාගාර පහසුකම් සහ සායනික පුහුණු පහසුකම් ඇතුළු යටිතල පහසුකම් පුළුල් කිරීම | | 01.01.2020 | 31.12.2022 | මේ සම්බන්ධයෙන් 2017-2021 සඳහා වන ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කය 4: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්මේ යටිතල පහසුකම් 2017-2021 යටතේ මේවනවිටත් අවධානය යොමුකර ඇත. | ලේඛකාධිකාරී, පීඨාධිපතිවරුන්, ජ්‍යෙ.ස.ලේ / අධ්‍යක්ෂ ප්‍රාග්ධන වැඩ, අධ්‍යක්ෂ / ශිෂ්‍ය සුභසාධන, අධ්‍යක්ෂ / ශිෂ්‍ය සුභසාධන අංශය | |
| *නිර්ණායක 5 - ශිෂ්‍ය ඇගයීම් සහ සම්මාන* | | | | | | | |
| 1 | නවීකරණය හා දෙවනවර ලකුණු සටහන් කිරීම සඳහා සම්බන්ධ වන පරීක්ෂකයින්ගෙන් වාර්තා ලබා ගැනීම | | 01.01.2020 | 31.12.2022 | විශ්වවිද්‍යාලයේ 2017-2021 සහ 2021-2024 යන උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව පීඨ විසින් සකස් කරන ලද ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම්වලදී අදාළ පීඨ විසින් මේ පිළිබඳ අවධානය යොමුකරනු ඇත. | පීඨාධිපතිවරුන්, අංශ ප්‍රධානීන් | |
| 2 | හැකිතාක් දුරට සියලු පීඨවල සෑම පාඨ මාලා ඒකකයක් සඳහාම සැකසුම්කරුවන් / උපපරිපාලකවරු / පරීක්ෂකවරු පත් කරීම. | | | | | පීඨාධිපතිවරුන්, අංශ ප්‍රධානීන් | |
| 3 | අවම වශයෙන් මාස තුනක කාලයක් තුළ මා.ශා.හා ස.වි.පීඨයේ විභාග ප්‍රතිඵල ප්‍රමාදයකින් | | 01.01.2020 | 31.12.2022 | 2017-2021 සහ 2021-2024 විශ්ව විද්‍යාල උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව වැඩසටහන් සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නියමිත මා.ශා.හා ස.වි. පීඨයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් මේ පිළිබඳ අවධානය යොමුකරන් ඇත. | පීඨාධිපති,අංශ ප්‍රධානී මා.ශා.හා.ස.වි.පීඨය | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | තොරව නියමිත කාලය තුළ නිකුත් කිරීම. | | | | | | |
| 4 | අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල ලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා තක්සේරු ක්‍රම නිරන්තරයෙන් සංශෝධනය කිරීම | | 01.01.2020 | 31.12.2022 | 2017-2021 සහ 2021-2024 විශ්ව විද්‍යාල උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව වැඩසටහන් සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නියමිත මා.ශා.හා ස.වි. පීඨයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් මේ පිළිබඳ අවධානය යොමුකරන් ඇත. | පීඨාධිපති,අංශ ප්‍රධානී මා.ශා.හා.ස.වි.පීඨය | |
| 5 | විභාග ක්‍රියා පටිපාටි පිළිබඳ පුළුල් අත්පොතක් සකස් කිරීම | | | | විස්තර සඳහා නිර්ණායක 1 යටතේ අංක 4 බලන්න. | ලේඛකාධිකාරී, අධ්‍යක්ෂ/ විභාග අංශය | |
| ***නිර්ණායක 6 - කාර්ය මණ්ඩලයේ ශක්තිය හා ගුණාත්මකභාවය*** | | | | | | | |
| 1 | සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ සුදුසුකම් වැඩි දියුණු කිරීම | | 01.01.2020 | 31.12.2022 | 2017-2021 සහ 2021-2024 විශ්ව විද්‍යාල උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව වැඩසටහන් සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සකස්කරන ලද අදාළ පීඨයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් මේ පිළිබඳ අවධානය යොමුකරනු ඇත. | පීඨාධිපති, අධ්‍යක්ෂ / අධ්‍යයන ආයතන (AE) | |
| 2 | මා.ශා.හා ස.වි. පීඨයේ, ව්‍යා.වි.පීඨයේ, සහ ක.අ.හා වා.පීඨයේ ශිෂ්‍ය අනුපාතයට සාපේක්ෂව අඩු කාර්ය මණ්ඩලයක් පැවතීමේ ගැටළුව විසඳීම සඳහා සියලු පුරප්පාඩු | | | | | පීඨාධිපති, අධ්‍යක්ෂ / අධ්‍යයන ආයතන (AE) | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පිරවීමට කඩිනම් පියවර ගැනීම | | | | | | | | | | |
| 3 | ක.අ.හා වානිජ පීඨයේ දේශන ශාලා ධාරිතාව පුළුල් කිරීම | | 01.01.2020 | 31.12.2022 | 2017-2021 සහ 2021-2024 විශ්ව විද්‍යාල උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව වැඩසටහන් සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සකසනලද ක.අ.හා වානිජ පීඨයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් මේ පිළිබඳ අවධානය යොමුකරනු ඇත. | | | | | පීඨාධිපති / ක.අ.හා වානිජ පීඨය | |
| 4 | අනධ්‍යයන කාර්ය මණ්ඩලයට වෘත්තීය විශේෂිත හෝ රැකියා ආශ්‍රිත පුහුණුවක් ලබා දීම | කා.සං.මධ්‍යස්ථානය විසින් පුහුණු ලබා දීම | 01.01.2018 | 31.12.2022 | 18 | 4 | 10 | 10 | 10 | ලේඛකාධිකාරී, ජේ.ස.ලේ./අනධ්‍යයන අයායතන, අධ්‍යක්ෂ/ කා.සං.මධ්‍යස්ථානය | |
| ***නිර්ණායක 7 - පශ්චාත් උපාධි අධ්‍යයන, පර්යේෂණ, නවෝත්පාදන සහ භාහිර ක්‍රියාකාරකම්*** | | | | | | | | | | | |
| 1 | නව නිපැයුම් හා නවෝත්පාදනයන් වැඩි දියුණු කිරීම මෙන්ම පර්යේෂණ සොයා ගැනීම් සඳහා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සහ වාණිජකරණය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම | නවෝත්පාදන, නව නිපැයුම් සහ ව්‍යාපාර නිර්මාණ සභාව පිහිටුවීම | 02.04.2018 | 31.12.2019 | සභා 1 ප්‍රතිපත්ති 1 | ප්‍රදර්ශන 1 | | | | සභාපති/ නවෝත්පාදන, නව නිපැයුම් සහ ව්‍යාපාර නිර්මාණ සභාව | මෙම ආයතන දෙකම ස්ථාපිත කර ඇති අතර අදාළ කටයුතු සිදු කරනු ලැබේ. |
| | | විශ්ව විද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා මධ්‍යස්ථානයක් පිහිටුවීම | | | | මධ්‍යස්ධාන 1 | | | | අධ්‍යක්ෂ/ විශ්ව විද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා මධ්‍යස්ථානය | |
| 2 | පශ්චාත් උපාධි සිසුන්ගේ ඉගැන්වීම, ඉගෙනීම සහ සුහසාධනය සඳහා උ.අ.පීඨයේ | | 01.01.2020 | 31.12.2022 | 2021-2024 සඳහා විශ්ව විද්‍යාල උපායමාර්ගික සැලැස්ම සහ උ.අ.පීඨයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන විට මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරනු ඇත. | | | | | පීඨාධිපති / උ.අ.පීඨය<br><br>උපායමාර්ගික සැලසුම් කමිටුව | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | යටිතල පහසුකම් පුළුල් කිරීම | | | | | | | | | | |
| ***නිර්ණායක 8 - ප්‍රජා සහභාගීත්වය, උපදේශනය සහ භාහිර ක්‍රියාකාරකම්*** | | | | | | | | | | | |
| 1 | සහයෝගී ප්‍රතිපාදන සහ වැඩ පදනම් කරගත් / කාර්මික ස්ථානගත කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම | වැඩසටහන පිළිබඳ ප්‍රතිපත්තිය හෝ විෂයමාලා සැලසුම් කිරීම සහ ඉගැන්වීම සහ ඉගෙනීම පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම | 01.05.2018 | 08.11.2018 | ප්‍රතිපත්ති 2 | | | | | උපකුලපති, අධ්‍යක්ෂ/අ.ත.ස. ඒකකය | මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති දෙකක් සකස් කර ඇත. විස්තර සඳහා නිර්ණායක 1 යටතේ අංක 4 බලන්න. |
| 2 | වෘත්තීය වැඩසටහන් / පාඨමාලා වඩාත් ලදායි ලෙස ලබා දීම සඳහා ඒ සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සකස් කිරීම | ප්‍රජා සහභාගීත්වය , සහ භාහිර ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම | 01.01.2020 | 31.12.2020 | | | 1 | | | උපකුලපති, අධ්‍යක්ෂ/අ.ත.ස. ඒකකය | |
| 3 | වැඩ පදනම් කරගත් සහ කර්මාන්ත ස්ථානගත කිරීමේ පැවරුම් සඳහා සපයනු ලබන සම්පත් පිළිබඳ නාමාවලියක් සකස් කිරීම | | 01.01.2020 | 31.12.2022 | 2017-2021 සහ 2021-2024 විශ්ව විද්‍යාල උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව වැඩසටහන් සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සකස්කරන ලද අදාළ පීඨයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් මේ පිළිබඳ අවධානය යොමුකරනු ඇත. | | | | | පීඨාධිපති, අංශ ප්‍රධානීන් | |
| 4 | උපායමාර්ගික හා ක්‍රියාකාරී සැලසුම් සකස් | | 01.01.2020 | 31.12.2022 | මේ පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්ම 2021-2024 සහ විශ්ව විද්‍යාල උපායමාර්ගික සැලැස්මට අනුකූලව සකස් කරන ලද | | | | | විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැසුම් | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිරීම, විෂයමාලා සංවර්ධනය, පර්යේෂණ, පූර්ව ලියාපදිංචි තක්සේරු ඒකක පිහිටුවීම සහ අධ්‍යයන වැඩසටහන්වලට සහ සම්මාන සඳහා අගය එකතු කිරීම පිණිස බාහිර පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සඳහා පහසුකම් සැපයීම. | | | | පීඨවල ක්‍රියාකාරී සැලසුම් මගින් අවධානය යොමු කෙරේ. | | | | | කමිටුව සහ පීඨ විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටුව | |
| *නිර්ණායක 9 - දුරස්ථ අධ්‍යාපනය* | | | | | | | | | | | |
| 1 | ඉගෙනුම් ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ප්‍රතිපත්තියක් හා ක්‍රියා පටිපාටියක් සකස් කිරීම | | 01.01.2020 | 31.12.2022 | | | ප්‍රතිපත්ති 1 | | | අධ්‍යක්ෂ/බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා ඒකකය | |
| 2 | ගුණාත්මක අධ්‍යාපනය පවත්වා ගැනීම සඳහා පැහැදිලි අරමුණු, කාර්යයන් සහ සංයුතියක් සහිත අ.ත.ස.ඒකකයක් බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා ඒකකය සඳහා ස්ථාපිත කිරීම | | 01.01.2020 | 30.06.2020 | | | අ.ත.ස.ම 1 | | | අධ්‍යක්ෂ/බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා ඒකකය | වර්තමානයේ බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා ඒකකයේ අධ්‍යක්ෂ විශ්වවිද්‍යාලයේ අ.ත.ස.ඒකකයේ සාමාජිකයෙකි. |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | අ.ත.ස.මධ්‍යස්ථානය හරහා අධ්‍යයන වැඩසටහන් පිළිබඳ වරින් වර අභ්‍යන්තර සමාලෝචනය සිදු කිරීම | | 01.01.2020 | 31.12.2022 | | | | අභ්‍යන්තර සමාලෝචන 1 | අභ්‍යන්තර සමාලෝචන 1 | අධ්‍යක්ෂ සහ සම්බන්ධීකාරක අ.ත.ස.මධ්‍යස්ථානය /භාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා ඒකකය | |
| ***නිර්ණායක 10 - තත්ත්ව සහතිකය*** | | | | | | | | | | | |
| 1 | අ.ත.ස.ඒකක සහ අ.ත.ස.මධ්‍යස්ථානවල කාර්යයන් ප්‍රශස්ත කිරීම සඳහා මානව හා භෞතික සම්පත් වැඩි දියුණු කිරීම | පරිගණක උපකරණ, ගෘහ භාණ්ඩ ප්‍රසම්පාදනය (මේස, පුටු, කබඩ්) | 16.07.2017 | 31.12.2019 | | අයිතම 28 | | | | උපකුලපති, පීඨාධිපතිවරු සහ අධ්‍යක්ෂ/ අ.ත.ස.ඒකකය | |
| 2 | සියලුම පීඨවල නිතිපතා අ.ත.ස.මධ්‍යස්ථානරැස්වීම් පැවැත්වීම | සියලුම පීඨවල රැස්වීම් සහ අධ්‍යයනාංශවල රැස්වීම්වල නිතිපතා පවත්වා ප්‍රගතිය වාර්තා කිරීම සහතිකකරනු වස් නිත්‍ය න්‍යාය පත්‍රයක් වශයෙන් අ.ත.ස.මධ්‍යස්ථානය ඇතුළත් කිරීම. | 01.01.2018 | 31.12.2022 | | 8 | 8 | 8 | 8 | පීඨ අ.ත.ස.මධ්‍යස්ථානවල සම්බන්ධීකාරකවරු | මෙය පීඨ 8 ම න්‍යාය පත්‍රවල ස්ථිර අයිතමයකි. |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | අ.ත.ස.ඒකකයේ පරිශ්‍රමයන් විශ්වවිද්‍යාලයේ සියලුම මට්ටම්වල අභ්‍යන්තරකරණය, අධීක්ෂණය සහ මනා පිළිවෙත් වැඩිදියුණු කිරීම සඳහා යොමු කිරීම | පීඨ හා අංශවල මනා පිළිවෙත් පිළිබඳ තොරතුරු බෙදාහදා ගැනීම සඳහා අ.ත.ස.ඒකකයේ වෙබ් පිටුවේ ස්ථානයක් නිර්මාණය කිරීම | 01.01.2020 | 30.06.2020 | | | 1 | | | අධ්‍යක්ෂ/ අ.ත.ස.ඒකකයේ සහ අ.ත.ස.මධ්‍යස්ථානවල සම්බන්ධීකාරකවරු අධ්‍යක්ෂ/ ඩිජිටල් මාධ්‍ය සහ සන්නිවේදනය | මේ සම්බන්ධයෙන් අ.ත.ස.ඒකකය මේ වන විට විශ්ව විද්‍යාලයේ ඩිජිටල් මාධ්‍ය සහ සන්නිවේදන ඒකකය සමඟ කටයුතු කරමින් සිටී. |
| | | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ වැඩමුළු පැවැත්වීම | 01.01.2018 | 31.12.2022 | 16 | 6 | 6 | 6 | 6 | අධ්‍යක්ෂ/ අ.ත.ස.ඒකකය, අධ්‍යක්ෂ / සම්බන්ධීකාරකවරු කා.සං.ම. / සම්බන්ධීකාරකවරු පීඨ අ.ත.ස.මධ්‍යස්ථාන | 2018 දී කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වූ තත්ත්ව සහතික වැඩමුළුවලට වැඩසටහන් සමාලෝචන වැඩමුළු ඇතුළත් වේ |
| 4 | පූර්ව ආයතනික සමාලෝචන නිර්දේශයන් පිළිබඳ අවධානය යොමුකිරීම. | විශ්ව විද්‍යාල දින දර්ශනය සකස් කිරීම | 01.01.2020 | 31.12.2020 | | | 1 | | | උපකුලපති, අධ්‍යක්ෂ/ අ.ත.ස.ඒකකය | |
| | | කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම | | | විස්තර සඳහා 4 වන නිර්ණායකය යටතේ අංක 2 බලන්න. | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5 | අනෙකුත් අංශවල / ඒකකවල කාර්ය මණ්ඩලය විසින් සියළුම අංශවල වැඩසටහන් සහ කාර්යයන් විධිමත් ලෙස සමාලෝචනය කිරීම | විස්තර සඳහා නිර්ණායක 2 යටතේ අංක 3 බලන්න. | | | | | | ආ. ස.1 වැ. ස. 1 | වැ. ස. 1 | අධ්‍යක්ෂ/ අ.ත.ස.ඒකකය, සම්බන්ධීකාරක වරු පීඨ අ.ත.ස.මධ්‍ය ස්ථාන | |
| | | අධ්‍යයන හා පරිපාලන නිලධාරී න්ගේ රැස්වීමේ න්‍යායපත්‍ර අංගයක් ලෙස තත්ත්ව සහතික කිරීම ඇතුළත් කිරීම | | | | | 1 | | | ලේඛකාධිකාරී, අධ්‍යක්ෂ/ අ.ත.ස.ඒකකය | |
| 6 | සියලුම ප්‍රධාන හා වැදගත් ක්‍රියාවලියන් සඳහා මාර්ගෝපදේශ සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සකස් කිරීම | විස්තර සඳහා නිර්ණායක 1 යටතේ අංක 4 බලන්න. | | | | | | | | ලේඛකාධිකාරී , මූල්‍යාධිකාරී, අධ්‍යක්ෂ/ අ.ත.ස.ඒකකය | |

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ක්‍රි.සැ. | ක්‍රියාකාරී සැලසුම |
| තො. තා. සේ. ම. | තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය |
| ච.ද.සං. | චර්යා ධර්ම සංග්‍රහය |
| වි.ස.හා සං.ක | විෂයමාලා සමාලෝචන හා සංවර්ධන කමිටුව |

| | |
|---|---|
| බා.උ හා ව්‍යා.පා.ඒ. | බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා ඒකකය |
| ස.සෞ.වි.පී. | සම සෞඛ්‍ය විද්‍යා පීඨය |
| ව්‍ය.වි.පී. | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| උ.අ.පී. | උපාධි අධ්‍යයන පීඨය |
| මා.ශා. හා ස.වි.පී. | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය |
| ක.අ.පී. | කළමනාකරණ අධ්‍යයන පීඨය |
| අ.ඉ.ප්‍ර | අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල |
| අ.ත.ස.ම. | අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථානය |
| අ.ත.ස.ඒ. | අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය |
| ආ.ස. | ආයතනික සමාලෝචනය |
| ඉ.ක.ප. | ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය |
| ක.තො.ප. | කළමනාකරණ තොරතුරු පද්ධතිය |
| අ.ආ. | අනධ්‍යයන ආයතන |
| කා.සා.ඇ. | කාර්ය සාධන ඇගයීම |
| වැ.ස. | වැඩසටහන් සමාලෝචනය |
| ත.ස. | තත්ත්ව සහතිකය |
| කා.සං.ම. | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය |
| ශ්‍රීලං.ත.කා.රා. | ශ්‍රී ලංකා තත්ත්ව කාර්ය රාමුව |
| ස.මෙ.ක්‍රි. | සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය |
| උ.සැ. | උපායමාර්ගික සැලැස්ම |
| නි.වි. | නිර්නේය විෂය |
| වි.ව්‍යා.සං. | විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතාවය |
| ශ්‍රී.ජ.වි.වි. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |

# ඇමුණුම්

## ඇමුණුම I: ප්‍රතිපත්ති උපලේඛණය

| ප්‍රතිපත්ති අංකය | බලපැවැත්වෙන හා සංශෝධිත දිනයන් | ප්‍රතිපත්ති මාතෘකාව | ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු |
|---|---|---|---|
| 01 | 08.11.2018 | අධ්‍යයන අවංකභාවය | සදාචාරාත්මක, බුද්ධිමය හැසිරීම, අවංකභාවය පිළිබඳ මූලධර්ම ආවරණය කරයි. සිසුන්ගේ අධ්‍යාපන අත්දැකීම් සහ දැනුම සොයායෑමේදී විනය හා අවංකභාවය පිළිබඳ මූලික මූලධර්ම ලබා ගැනීමට ඉවහල්වන බැවින් අධ්‍යයන අවංකභාවය වැදගත් වේ. |
| 02 | 08.11.2018 | පරිපාලනය | විශ්වවිද්‍යාල පනත හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙහෙවරට අනුකූලව ආයතනික කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා කාර්යරාමුවක් ස්ථාපිත කිරීම. |
| 03 | 08.11.2018 | ප්‍රජා සේවා / බාහිර ක්‍රියාකාරකම් සහ කර්මාන්ත සම්බන්ධතා / කටයුතුවල නියැලීම | ගුණාත්ම අදාළ ඉගැන්වීම් සහ පර්යේෂණ තුළින් දැනුම ආරක්ෂා කිරීම, නිර්මාණය කිරීම සහ බෙදා හැරීම, විද්‍යාත්මක, තාක්ෂණික හා සංස්කෘතික උරුමයන් සංරක්ෂණය හා සංවර්ධනය කිරීම. |
| 04 | 08.11.2018 | පර්යේෂණ පැවැත්වීම සහ සහාය දීම | හිතකර පර්යේෂණ පරිසරයක් ස්ථාපිත කිරීමට මග පෙන්වීම<br>මෙහිදී ශ්‍රී ලාංකීය සහ ලෝක ජනතාවගේ සමෘද්ධිය සහ යහපැවැත්ම උදෙසා ශාස්ත්‍රීය / පරිපාලන කාර්ය මණ්ඩලය සහ පශ්චාත් උපාධි පර්යේෂණ සිසුන් විසින් විද්වත් ප්‍රකාශන සහ නව්‍යකරණයන් සඳහා ඉවහල්වන උසස් තත්ත්වයේ පර්යේෂණ පවත්වනු ඇත. |
| 05 | 08.11.2018 | ශිෂ්‍ය නවෝත්පාදනයන් දිරිගැන්වීම සහ ඒ සඳහා ප්‍රතිලාභ ලබා දීම | විශ්වවිද්‍යාල සිසුන් විසින් තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රයන්හි පවත්නා ගැටළු විසඳීම පිණිස නවෝත්පාදන ප්‍රවේශයන් ක්‍රියාවට නැංවීමට / නව ශිල්පක්‍රම අනුගමනය කිරීමට / පවත්නා ශිල්පීය ක්‍රම, නිෂ්පාදන සහ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමට සහ නවෝත්පාදන තරඟවලට සහභාගී වීමට ඔවුන් තුළ පෙළඹවීමක් ඇති කිරීම. |
| 06 | 08.11.2018 | විභාග | අනුමත විභාග කාලසටහන් වලට අනුකූලව මධ්‍යම / පීය මට්ටමේ විභාග පැවැත්වීම පරිපාලන සඳහා මූලධර්ම සැපයීම |
| 07 | 08.11.2018 | මූල්‍ය | විශ්ව විද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගනු පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය සම්පත් ඵලදායී ලෙස හා කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය කටයුතු සඳහා නීති, රෙගුලාසි, මාර්ගෝපදේශ සහ නිර්ණායක අනුව නිසි මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම. |
| 08 | 08.11.2018 | සාමාන්‍ය පරිපාලනය | නිසි ආරක්ෂාවක් සහතික කරමින් විශ්ව විද්‍යාල ප්‍රජාවේ චංචල හා නිශ්චල දේපල සහ ජීවිත ආරක්ෂා කිරීම. |

| | | | |
|---|---|---|---|
| 09 | 08.11.2018 | මානව සම්පත් සංවර්ධනය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවකයින්ට තම වර්තමාන හා අනාගත රැකියා කාර්ය සාධනය වැඩි කරලනුවස් ඔවුන්ගේ රැකියා ආශ්‍රිත හැකියාවන් සහ අභිප්‍රේරණය වැඩි දියුණු කිරීම සඳහා නව ඉගෙනුම් අවස්ථා ලබා දීම පිණිස ක්‍රමානුකූල හා ව්‍යුහාත්මක ප්‍රවේශයක් සැපයීම |
| 10 | 08.11.2018 | තොරතුරු | උනන්දුකාර පාර්ශ්වයන් තීරණ ගැනීමේ අරමුණු සඳහා තොරතුරු භාවිතා කිරීමේදී පද්ධතියේ කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා මාර්ගෝපදේශ ලබාදීම. |
| 11 | 08.11.2018 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | ජනවාර්ගික, කුල, භාෂාව, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය, ආබාධිත පුද්ගලයින්, පදිංචි ස්ථානය හෝ ආර්ථික මට්ටම්වල වෙනස්කමකින් තොරව විශ්වවිද්‍යාල ප්‍රජාවේ සෑම සාමාජිකයෙකුටම තොරතුරු සන්නිවේදන තාක්ෂණ පහසුකම් සැපයීම |
| 12 | 08.11.2018 | නවෝත්පාදන, නව නිපැයුම් සහ ව්‍යාපාර නිර්මාණය | ජාතියේ යහපත උදෙසා දැනුම් නිර්මාපකයින්ට නිර්මාණ සිදුකිරීමට දිරිගැන්වීම, ඔවුන්ගේ නිර්මාණ ආරක්ෂා කිරීම සහ වාණිජකරණය කිරීම සඳහා මිත්‍රශීලී වාතාවරණයක් ඇති කිරීම. |
| 13 | 08.11.2018 | ජාත්‍යන්තරකරණය සහ අක්වෙරළ අධ්‍යයන වැඩසටහන් | නව අරමුදල් ප්‍රභවයන් සොයා ගැනීම සහ අධ්‍යයන ගුණාත්මකභාවය සහ සිසුන්ගේ සුදානම වැඩි දියුණු කිරීම මගින් ජාතික, කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් වැඩි ආයතනික ආකර්ෂණයක් ලබාගැනීම. |
| 14 | 08.11.2018 | වැඩසටහන් / විෂයමාලා අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, සමාලෝචනය සහ අත්හිටුවීම | ණය මත වන පාඨමාලා හෝ අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම, වෙනස් කිරීම සහ අත්හිටුවීම සඳහා වන ක්‍රියාවලිය පිළිබඳ මග පෙන්වීම සහ මෙම ක්‍රියාවලිය තුළ විශ්ව විද්‍යාල මට්ටමින් පරිපාලකයින්ගේ සහ කමිටුවල කාර්යභාරය සැලසුම් කිරීම. |
| 15 | 08.11.2018 | වැඩසටහන් / විෂයමාලා සැලසුම් කිරීම | විශ්වවිද්‍යාලයේ විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියට අදාළ ක්‍රියාපටිපාටි සහ වෙනත් පරිපාලනමය කරුණු ආවරණය කිරීම. |
| 16 | 08.11.2018 | කලාපීය හා ජාතික මට්ටමේ තරඟ සඳහා සිසුන්ගේ සහභාගීත්වය | සිසුන්ගේ අපේක්ෂාවන්, ඔවුන්ගේ විශ්ව විද්‍යාල ජීවිතය සහ සෑම අතින්ම දක්ෂයෙකු බවට පත්වීම සඳහා ඔවුන්ගේ සංවර්ධන හැකියාවන් ඉහළ නැංවීමේදී විෂයබාහිර ක්‍රියාකාරකම්වල වටිනාකම හඳුනා ගැනීම. |
| 17 | 08.11.2018 | ඉගැන්වීම සහ ඉගෙනීම | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සියලුම සිසුන්ට උසස් තත්ත්වයේ ඉගෙනුම් අත්දැකීමක් ලබාදීම සඳහා සුදුසු ඉගැන්වීම් ක්‍රම තෝරා ගැනීම පාලනය කිරීම. |
| 18 | 08.11.2018 | වෙබ් අන්තර්ගත කළමනාකරණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, පීඨ සහ අධ්‍යයනාංශවල වෙබ් අඩවි වල ප්‍රකාශයට පත් කර ඇති අන්තර්ගතය සමාලෝචනය කර ඇති බවට සහ ඒවා ඉතා නිවැරදි වන බවට වගබලා ගැනීම. |
| 19 | 08.11.2018 | රචනා කොල්ලය | සිසුන් අතර ‘‘සදාචාරාත්මක ලිවීම’’ ඇතුළු අධ්‍යයන ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීමට සහ සදාචාර විරෝධී ක්‍රියාවන් මුලිනුපුටා දැමීම සඳහා අවශ්‍ය වැළැක්වීමේ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට උත්සාහ කිරීම. |

| | | | |
|---|---|---|---|
| 20 | 29.08.2019 | සමානාත්මතාවය | ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, ආගම, ආබාධිතභාවය, වයස, විවාහක තත්ත්වය, ගර්භණීභාවය සහ මාතෘත්වය, භාෂාව, වෘත්තීය සමිති සාමාජිකත්වය සහ දේශපාලන විශ්වාසයන් හෝ වෙනත් හේතු නොසලකා සමානාත්මතාවය සහතික කිරීමට උත්සාහ කිරීම. |

ඇමුණුම II: ජාත්‍යන්තර සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා පවත්නා යාන්ත්‍රණ

කරන ලද ක්‍රියාකාරකම්:

1. ජාත්‍යන්තර සිසුන් සඳහා විස්තර ප්‍රකාශ පත්‍ර ප්‍රකාශයට පත් කිරීම.
2. ජාත්‍යන්තර සිසුන් සම්බන්ධ කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම සඳහා එක් එක් පීඨයෙන් (සමස්තය 07) අධ්‍යයන සාමාජිකයෙකු බැගින් පත් කිරීම.
3. වීසා ලබා ගැනීම සඳහා සිසුන්ට පෞද්ගලිකව සහාය වීම.
4. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ජාත්‍යන්තර සිසුන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා වීඩියෝවක් මුදල් අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය සමඟ සම්බන්ධීකරණයවී සකස් කිරීම.
5. ජාත්‍යන්තර සිසුන් සඳහා වෙබ් පිටුවක් සකස් කිරීම

2019 ජනවාරි 01 සිට 2019 ජුනි 30 දක්වා විදේශීය සිසුන් බඳවා ගැනීම:

| රට | පාඨමාලාව | උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| මියන්මාරය | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 07 | |
| නයිජීරියාව | ජීව විද්‍යාව | 01 | |
| ශ්‍රී ලංකාව | MBBS | 03 | |
| ඕස්ට්‍රේලියාව | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 01 | |
| බංග්ලාදේශය | | | 01 (දර්ශන ශූරී) |
| මුළු ගණන | | 12 | 01 |

7. **වැඩසටහන් සමාලෝචනවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම්:**

එමෙන්ම, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ (මා.ශා.හා ස.වි.පී.) සහ කළමනාකරණ අධ්‍යයන හා වානිජ පීඨයේ පවත්වන ලද වැඩසටහන් සමාලෝචන පිළිබඳ අදහස් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කරමින් පවතී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයෙහි වැඩසටහන් සමාලෝචන 05ක් 2017 දී පවත්වන ලද අතර 2018-2019 දී කළමනාකරණ අධ්‍යයන හා වානිජ පීඨයෙහි වැඩසටහන් සමාලෝචන දොළහක් පවත්වන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ වැඩසටහන් සමාලෝචනවල ක්‍රියාකාරී සැලැස්ම තත්ත්ව සහතික මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරන ලදී.

8. **විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර තත්ත්ව සහතික පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ 09/2019 යටතේ යෝජිත වෙනස්කම්**

අංක 09/2019 හා 2019.10.07 දිනැති කොමිෂන් චක්‍රලේඛය මගින් යෝජිත පහත සඳහන් වෙනස්කම් සනාතන සභාවට සහ විශ්වවිද්‍යාල සභාවට ඉදිරිපත් කරන ලදී.

- විශ්වවිද්‍යාලයේ පුළුල් කාර්යභාරය වඩා හොඳින් පිළිබිඹු කිරීම සඳහා තත්ත්ව සහතික කිරීමේ ඒකකය තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) ලෙස නම් කිරීම. පරිපාලනමය වශයෙන්, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය විශ්ව විද්‍යාලයේ අධ්‍යයන අංශයක කොටසක් ලෙස ක්‍රියා කළ යුතුය.

- 1978 අංක 16 විශ්ව විද්‍යාල පනතේ 46 (6) (vii) වගන්තියේ (සංශෝධිත) විධිවිධාන ප්‍රකාරව අ.ත.ස.ඒකකයේ වර්තමාන කළමනාකරණ කමිටුව (MC) විශ්ව විද්‍යාලයේ සෙනෙට් සභාවේ ස්ථාවර කමිටුවක් බවට පරිවර්තනය කිරීම. මෙම ස්ථාවර කමිටුවේ සංයුතිය කළමනාකරණ කමිටුවට සමාන වනු ඇත.

- විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික ඒකකයේ අධ්‍යක්ෂක, විශ්වවිද්‍යාල සංවිධාන සටහනේ සුදුසු ස්ථානයක තැබීම. මේ සම්බන්ධයෙන් මග පෙන්වීම මෙම චක්‍රලේඛයේ ඇමුණුම 3 හි දක්වා ඇත

## *9.* තත්ත්ව සහතික කිරීම පිළිබඳ කිරීමේ වැඩසටහන්*:*

අධ්‍යක්ෂ / ත.ස.මධ්‍යස්ථානය සහ තත්ත්ව සහතික උපදේශක විසින් *2019* වර්ෂය තුළ පහත සඳහන් තත්ත්ව සහතික කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

*1.* 2019.08.01.–සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක්

2. 2019.09.05 –මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ ප්‍රධානීන් සහ පීඨාධිපතිවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක්

*3.* 2019.09.06 - තත්ත්ව සහතිකය පිළිබඳ උසස් අධ්‍යාපනයේ ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාවට (CTHE*)* සහභාගිවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක්

4. 2019.11.05 - සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා, ඔවුන්ගේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශ සහ උපාධි පැතිකඩ සමාලෝචනය කිරීම

**5.** 2019.12.13 බාහිර උපාධි පාඨමාලා පිළිබඳ ස්වයං ඇගයීමක් සිදු කිරීමට අදාළව බාහිර උපාධි සඳහා වන වැඩසටහන් සමාලෝචන අත්පොත පිළිබඳව උපාධි හා ව්‍යාප්ති පාඨමාලා ඒකකයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩසටහනක් පැවත්වීම.

10. තත්ත්ව සහතික කවුන්සිලයේ අධ්‍යක්ෂකවරයා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සංචාරයක නිරතවීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කවුන්සිලයේ අධ්‍යක්ෂ මහාචාර්ය නිලන්ති ද සිල්වා 2019.11.06 දින විශ්ව විද්‍යාලයට පැමිණි අතර එහිදී තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබඳව තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවේ (MC) සාමාජිකයින් සමඟ සාකච්ඡාවක් පැවැත්විය. තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා ද වන විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් මෙම රැස්වීමේ මුලසුන හොබවන ලදී. පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ, සියලුම පීඨවල

පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී, පුස්තකාලයාධිපති, මූල්‍යාධිකාරී, පර්යේෂණ කවුන්සිලයේ සම සභාපති, බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා අධ්‍යක්ෂ, කාර්යමණ්ඩල සංවර්ධන අධ්‍යක්ෂ , සහ පීඨ අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථානවල සම්බන්ධීකාරකවරුන්ගෙන් සමන්විත කළමනාකරණ කමිටුවේ සාමාජිකයෝ මෙම රැස්වීමට සහභාගී වූහ. මෙම රැස්වීම ආරම්භයේදී උපකුලපතිවරයා විසින් විශ්ව විද්‍යාලයේ වර්තමාන ක්‍රියාකාරකම් සහ එහි අනාගත දිශාවන් පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදි. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම්වල වර්තමාන තත්ත්වය, පවත්වන ලද බාහිර සමාලෝචනවල තත්ත්වය සහ ආයතනික සමාලෝචන පිළිබඳ අවසාන සමාලෝචන වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පිළියෙල කර ඇති ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත්කිරීමක් සිදු කරන ලදී. මෙයින් අනතුරුව තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් අතර සාකච්ඡාවක් පැවැත්විණි. උපකුලපතිතුමාගේ ආරාධනයෙන් තත්ත්ව සහතික උපදේශක සහ විශ්වවිද්‍යාලයේ ආයතනික සැලසුම් කමිටුවේ සාමාජිකයින් ද මෙම රැස්වීමට සහභාගී වූහ.

මෙම රැස්වීම අවසානයේදී මහාචාර්ය නිලන්ති ද සිල්වා විසින් මා.ශා.හා ස.වි.පීඨයේ පීඨාධිපති, අංශ ප්‍රධානීන් සහ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ සාමාජිකයින් සමඟ වැඩසටහන් සමාලෝචනවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ වසාකච්ඡාවක් පවත්වන ලදී. මෙම රැස්වීමට විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සහ තත්ත්ව සහතික උපදේශක යන දෙදෙනාම සහභාගී වූහ.

2019.11.22 දින කළමනාකරණ අධ්‍යයන හා වානිජ පීඨයට පැමිණි මහාචාර්ය නිලන්ති ද සිල්වා එහිදී මහජන වැඩසටහන් සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳව සාකච්ඡා කළේය.

## 11. යෝජනා ඇගයීම:

පහත සඳහන් අධ්‍යයන වැඩසටහන්වල යෝජනා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානය විසින් ඇගයීමට ලක්කරන ලදි.

(i) 2019.04.01 - දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ යෝජිත ශාස්ත්‍රපති උපාධිය (SLQF මට්ටම 10)

(ii) 2019.06.07 - ව්‍යාපාර සංඛ්‍යාලේඛන හා සමාජ සංඛ්‍යාලේඛන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව නැවත හඳුන්වාදීමේ යෝජනාව (SLQF මට්ටම 08)

(iii) 2019.08.19 - ව්‍යාපාර පිළිබඳ යෝජිත දර්ශනපති (SLQF මට්ටම 10)

(iv) 2019.08.27 - වන විද්‍යා හා පාරිසරික විද්‍යා පිළිබඳ යෝජිත පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (SLQF මට්ටම 08)

(v) 2019.09.09 - දත්ත විද්‍යාව හා කෘතිම බුද්ධිය පිළිබඳ යෝජිත පශ්චාත් උපාධි පාඨමාලාව (SLQF මට්ටම 09)

(vi) 2019.09.09 - පරිගණක විද්‍යාව පිළිබඳ යෝජිත ශාස්ත්‍රපති උපාධිය (IV බඳවා ගැනීම) (SLQF මට්ටම 10)

(vii) 2019.11.21 - ඉතිහාස පිළිබඳ යෝජිත ඩිප්ලෝමාව (SLQF මට්ටම 03)

(viii) 2019.11.27 - දෘෂ්ටිමිතිය පිළිබඳ යෝජිත විද්‍යාවේදී උපාධිය (SLQF මට්ටම 06)

## ලෝක බැංකු අරමුදල් සපයන උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධන (AHEAD) මෙහෙයුම කඩිනම් කිරීම

**OTS Office – ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

දැනුම පදනම් කරගත් කාර්මික හා සේවා අංශයේ ක්‍රියාකාරකම් තුළින් ආර්ථික වර්ධනය ඇතිකර ගැනීම සහ ගෝලීය ගුණාත්මකභාවයෙන් යුත් උපාධිධාරීන් බිහිකිරීම උදෙසා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශය පුළුල් කිරීම, විවිධාංගීකරණය කිරීම සහ සංවර්ධනය කිරීම කෙරෙහි උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය මගින් (AHEAD) අවධානය යොමු කරයි.

AHEAD ව්‍යාපෘතියේ හි ප්‍රතිඵල ක්ෂේත්‍ර තුනක් තිබි.

ප්‍රතිඵල ක්ෂේත්‍රය 1: ආර්ථික සංවර්ධනය සඳහා වන ප්‍රමුඛතා විෂයයන් සඳහා බඳවා ගැනීම වැඩි කිරීම

ප්‍රතිඵල ක්ෂේත්‍රය 2: උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

ප්‍රතිඵල ක්ෂේත්‍රය 3: පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම

**1.** පළමු ප්‍රතිඵල ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම

මෙම ප්‍රතිඵල ක්ෂේත්‍රයේ අරමුණ වන්නේ ආර්ථික සංවර්ධනය සඳහා උපායමාර්ගික වැදගත්කමක් ඇති උසස් අධ්‍යාපන වැඩසටහන් සඳහා බඳවා ගැනීම වැඩි කිරීමයි. ඉල්ලුම හා සැපයුම් පාර්ශවීය වැඩසටහන් හා ඒකාබද්ධව විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත (STEM) උපාධි වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍ය විශ්ව විද්‍යාල සහ උසස් තාක්ෂණ ආයතන සඳහා බඳවා ගැනීම පුළුල් කිරීම රජය විසින් ප්‍රවර්ධනය කරනු ඇත.

මෙම ප්‍රතිඵල ක්ෂේත්‍රය යටතේ වෛද්‍ය විද්‍යා හා තාක්ෂණ පීඨ වැඩිදියුණු කිරීම සඳහා ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලැබේ.

**වෛද්‍ය විද්‍යා පීඨය**

| වර්ෂය | ලැබුණු අරමුදල් | තථ්‍ය වියදම් | උපයෝජනය % | ප්‍රදාන වර්ගය | ප්‍රසම්පාදන ප්‍රගතිය | සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|---|---|---|
| 2018 ඔක්තෝම්බර් | මිලියන 30 | මිලියන 29.9 | 100% | භාණ්ඩ | සියලුම භාණ්ඩ මිලදීගෙන ඇත | 2019 මාර්තු |
| 2019 මැයි | මිලියන 156 | - | 0% | සිවිල් වැඩ | සිදුවෙමින් පවතී | |
| එකතුව | මිලියන 186 | මිලියන 29.9 | 16% | | | |

භාණ්ඩ මිලදී ගැනීම සඳහා ලැබුණු ප්‍රදානය භාවිතා කරමින් 2018 සහ 2019 කාලය තුළ බොහෝ වෛද්‍ය උපකරණ මිලදී ගන්නා ලදි. ඒ සඳහා දරනලද මුළු වියදම රු. මිලියන 29.9 කි. එහිදී තෙල් ගිල්වීමේ දුරදක්න අන්වීක්ෂය, රියල් ටයිම් පීසීආර් යන්ත්‍රය, ජෙල් නිරූපණ පද්ධතිය, එලිසා රීඩර්, 80 ºC අධි ශීතකරණය, උසස් ජීවිත ආධාර සඳහා පමණක් වන Manikin, ඒඑල්එස් (ළමා) Manikin, අන්තර් ඇක්ටිව් වයිට්බෝඩ් සහ ඔටෝක්ලේව් වැනි ඉහළ වටිනාකමින් යුත් භාණ්ඩ අරමුදල් භාවිතා කර මිලදී ගන්නා ලදි. ප්‍රසම්පාදන කටයුතු 2019 මාර්තු මාසයේදී අවසන් කරන ලදී.

ව්‍යාධි විද්‍යා දෙපාර්තමේන්තුවේ ව්‍යුහ විද්‍යා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2019 මැයි මාසයේදී රුපියල් මිලියන 156 ක් ප්‍රදානය කරන ලදී. ඒ සම්බන්ධයෙන් දැනට ලංසු ලියකියවිලි කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

**තාක්ෂණ පීඨය**

| වර්ෂය | ලැබුණු අරමුදල් | තථ්‍ය වියදම් | උපයෝජනය % | ප්‍රදාන වර්ගය | ප්‍රසම්පාදන ප්‍රගතිය | සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|---|---|---|
| 2018 ඔක්තෝම්බර් | මිලියන 40 | මිලියන 39.8 | 100% | භාණ්ඩ | සියලුම භාණ්ඩ මිලදීගෙන ඇත | 2019 මාර්තු |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2019 මැයි | මිලියන 350 | මිලියන 339.4 | 97% | සිවිල් වැඩ | අර්ධ / කොටස් ගෙවීම් | |
| | මිලියන 100 | මිලියන 80.6 | 81% | භාණ්ඩ | අයිතම කිහිපයක් සඳහා ගෙවීම් කළ යුතුව ඇත. | |
| **එකතුව** | මිලියන 490 | මිලියන 459.8 | 94% | | | |

තාක්ෂණ පීඨය විසින් 2018 සහ 2019 වර්ෂවල ඉගැන්වීම් හා පර්යේෂණ කටයුතු සඳහා රුපියල් මිලියන 120.4 ක් වැයකර ඉහළ තාක්ෂණයෙන්යුත් උසස් උපකරණ මිලදී ගන්නා ලදි. මේ සඳහා භාණ්ඩ ප්‍රදාන කාණ්ඩය යටතේ වෙන් කර ඇති සියලුම මුදල් පාහේ භාවිතා කර ඇති අතර 2020 වර්ෂය තුළ තවත් භාණ්ඩ කිහිපයක් සඳහා ගෙවීම් කළ යුතුව ඇත. මෙම ප්‍රදානය යටතේ මිලදී ගත් ඇතැම් භාණ්ඩ නම් ගෑස් ක්‍රෝමොටෝග්‍රැෆි-ස්කන්ධ වර්ණදේහ යන්ත්‍රය, ඉහළ කාර්ය සාධනය සහිත ද්‍රව වර්ණදේහ යන්ත්‍රය, වීඩියෝ කැමරාව සහ දසුන් මික්සරය, වායු සම්පීඩකය - තෙල් රහිත වායු සම්පීඩකය, ජෛව ප්‍රතික්‍රියාකාරකය, ආසවනය, වියළනය, නිස්සාරකය, ෆර්මන්ටේෂන් වොට්, ඇඹරුම් යන්තය, මික්සර් සහ රෝස්ටර් යනාදිය වේ.

පිටිපන අධ්‍යයන ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සිවිල් වැඩ පිරිවැය සංරචකය යටතේ පීඨයට රුපියල් මිලියන 350 ක් ද ලැබුණි.

තාක්ෂණ පීඨයේ පරිපාලන ගොඩනැගිල්ල සඳහා ලෝක බැංකුව විසින් සම්පූර්ණ අරමුදල් සපයනු ලබන අතර වර්ෂය තුළ රු. මිලියන 339.4 ක ගෙවීමක් සිදුකර ඇත. 2019 වසර අවසන් වන විට සිවිල් වැඩවලින් 90% ක් අවසන් කර ඇති අතර මෙම ව්‍යාපෘතිය 2020 මාර්තු වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

**2.** දෙවන ප්‍රතිඵල ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම

මෙම ප්‍රතිඵල ක්ෂේත්‍රයේ අරමුණ වන්නේ, උපාධි අපේක්ෂක වැඩසටහන්වල විශේෂයෙන්ම මානව ශාස්ත්‍ර, අධ්‍යාපනය, කළමනාකරණය සහ සමාජ විද්‍යාව (HEMS) යන විෂය ධාරාවන්හි උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමයි. මෙම ප්‍රතිඵල ක්ෂේත්‍රය යටතේ උප ක්ෂේත්‍ර තුනක් සඳහා තරඟකාරී පදනම මත ප්‍රදානයන් ලබා ගැනීමට විශ්වවිද්‍යාල සුදුසුකම් ලබයි. එම උප ක්ෂේත්‍ර වනුයේ:

- ELTA-ELSE පීඨමට්ටමේ ප්‍රදාන
- ELTA-ELSE අධ්‍යයනාංශ මට්ටමේ ප්‍රදාන
- දර්ශන ශූරී ආචාර්ය උපාධි අධ්‍යයන සඳහා ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව

එක් ප්‍රදානයක වටිනාකම රු. මිලියන 120ක් වූ පීඨ ප්‍රදාන තුනක් ලබා ගැනීමට අපේ විශ්ව විද්‍යාලයට හැකි විය. එම ප්‍රදාන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යන පීඨ තුන විසින් දිනාගන්නා ලදි.

අධ්‍යයනාංශ මට්ටමේ තරඟය යටතේ අපගේ විශ්ව විද්‍යාලයට අධ්‍යයනාංශ මට්ටමේ ප්‍රදාන 5 ක් දිනා ගැනීමට හැකි විය. ජයග්‍රාහී අධ්‍යයනාංශ සඳහා එක් අංශයකට රුපියල් මිලියන 18 බැගින් හිමි වේ. මානව විද්‍යා අධ්‍යයනාංශය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, තීරණ විද්‍යා අධ්‍යයනාංශය, අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයනාංශය සහ ක්‍රීඩා විද්‍යා අධ්‍යයනාංශය පළමු වටයේ ප්‍රතිපාදන දිනා ගත්හ.

ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ට රුපියල් මිලියන 9 ක් වටිනා ආචාර්ය උපාධි 40 ක් පිරිනමන ලදී.විවිධ හේතූන් මත 2018 සහ2019 යන වසර වලදී ආචාර්ය උපාධි අධයයන ආරම්භ කිරීමට හැකි වූයේ 17 දෙනෙකුට පමණි. මෙහෙයුම්, කළමනාකරණ සේවා සහ තාක්ෂණ (OMST) මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම හේතුවෙන් අනෙකුත් ශිෂ්‍යත්ව අවලංගු කරන ලදි.

2019 දෙසැම්බර් 31 දිනට එක් එක් ප්‍රදාන වර්ගයේ වත්මන් මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ:

**ELTA – ELSE** ප්‍රදාන

| පීඨය/ අධ්‍යයනාංශය | ගිවිසුම් අත්සන්කරන ලද දිනය | මුළු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම් | උපයෝජනය % | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|
| මා.ශා.හා ස.වි.පීඨය | මැයි 6 | මිලියන 120 | මිලියන 4.1 | **3%** | ක්‍රියාත්මකයි |
| ක.අ.හා.වා. පීඨය | මැයි 6 | මිලියන 120 | මිලියන 4.1 | **3%** | ක්‍රියාත්මකයි |
| ව්‍යා.වි.පීඨය | සැප්තැම්බර් 26 | මිලියන 120 | මිලියන 0.6 | **1%** | ක්‍රියාත්මකයි |
| තීරණ විද්‍යා ක.අ.හා.වා. පීඨය | අගෝස්තු 19 | මිලියන 18 | මිලියන 0.7 | **4%** | ක්‍රියාත්මකයි |
| මානව විද්‍යා මා.ශා.හා ස.වි.පීඨය | අගෝස්තු 30 | මිලියන 18 | මිලියන 0.6 | **3%** | ක්‍රියාත්මකයි |
| භූගෝල විද්‍යා | සැප්තැම්බර් 2 | මිලියන 18 | මිලියන 0.2 | **1%** | ක්‍රියාත්මකයි |

| | | | | | |
|---|---|---|---|---|---|
| මා.ශා.හා ස.වි.පීඨය | | | | | |
| අලෙවිකරණ<br>කළමනාකරණ<br>ක.අ.හා.වා. පීඨය | ඔක්තෝම්බර්<br>29 | මිලියන 18 | මිලියන 0.1 | **1%** | ක්‍රියාත්මකයි |
| ක්‍රීඩා විද්‍යා<br>ව්‍යා.වි.පීඨය | නොවැම්බර් 27 | මිලියන 18 | | | ක්‍රියාත්මකයි |
| එකතුව | | මිලියන 450 | මිලියන 10.6 | **2%** | |

ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන

| පීඨය | පිරිනමන ලද ප්‍රමාණය | ආරම්භ කරනලද ප්‍රමාණය | ආරම්භ කිරීමට නියමිත ප්‍රමාණය | අවලංගු කරනල ප්‍රමාණය |
|---|---|---|---|---|
| කළමනාකරණය | 18 | 10 | **-** | 08 |
| මානව ශාස්ත්‍ර | 16 | 05 | **-** | 11 |
| ව්‍යවහාරික විද්‍යා | 04 | 02 | **-** | 02 |
| වෛද්‍ය විද්‍යාව | 02 | 01 | | 01 |

ආචාර්ය උපාධිය සඳහා 2019 දෙසැම්බර් 31 දක්වා කරන ලද මුළු ගෙවීම - මිලියන 38 කි

**3.** තෙවන ප්‍රතිඵල ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම

මෙම ප්‍රතිඵල ක්ෂේත්‍රයේ අරමුණ වන්නේ විශ්වවිද්‍යාල තුළ පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමයි. මෙම ප්‍රතිඵල ෂේත්‍රය යටතේ විශ්වවිද්‍යාල ප්‍රදාන වර්ග තුනක් ලැබීම සඳහා සුදුසුකම් ලබයි. පර්යේෂණ හා නවෝත්පාදන වාණිජකරණ (RIC) ප්‍රදානය යටතේ ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් රුපියල් මිලියන 45 ක ප්‍රදානයක් ද, සංවර්ධනාභිමුඛ පර්යේෂණ (DOR) ප්‍රදානය යටතේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය විසින් රුපියල් මිලියන 10 ක ප්‍රදානයක් ද, වෛද්‍ය විද්‍යා පීඨය විසින් තරඟකාරී කාණ්ඩය යටතේ රු. මිලියන 35 ක ප්‍රදානයක් හා නවෝත්පාදන වාණිජකරණ වැඩිදියුණු කිරීමේ (ICE) ප්‍රදානය යටතේ ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් රුපියල් මිලියන 40 ක් වටිනා ප්‍රදානයක් ද දිනා ගන්නාලදි.

| ප්‍රදානය | ගිවිසුම්ගත දිනය | ප්‍රතිපාදනය | තථ්‍ය වියදම් | උපයෝජනය% | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|
| ප. හා න.වා.ප්‍ර. (ව්‍ය.වි.පී.) | 2018 නොවැ.12 | මිලියන 45 | මිලියන 33.9 | 75% | ක්‍රියාත්මකයි |
| සං.ප.ප්‍ර.(වානිජ) | 2018 දෙසැ.10 | මිලියන 10 | මිලියන 2.8 | 28% | ක්‍රියාත්මකයි |
| සං.ප.ප්‍ර.(වෛද්‍ය) | 2019 මැයි 21 | මිලියන 35 | මිලියන 8.8 | 25% | ක්‍රියාත්මකයි |
| න.වා.වැ.ප්‍ර. ( ව්‍ය.වි.පී.) | 2018 සැප්.29 | මිලියන 40 | මිලියන 10.4 | 26% | ක්‍රියාත්මකයි |
| වි.ව්‍යා.සං. | 2018ජුලි 17 | මිලියන 15 | මිලියන 3.4 | 23% | ක්‍රියාත්මකයි |
| එකතුව | | මිලියන 145 | මිලියන 59.3 | 41% | |

**2019 දෙසැම්බර් 31 දිනට අනුමත කරන ලද, ලැබුනු සහ උපයෝගී කරන ලද ප්‍රදානයන්හි සමස්ත තත්ත්වය පහත වගුවේ දැක්වේ.**

| පීඨය / ප්‍රදාන | ප්‍රතිපාදනය | 2019 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | උප යෝජ නය % |
|---|---|---|---|
| ප්‍රතිඵල ක්ෂෙත්‍රය 1 | | | |
| වෛද්‍ය විද්‍යා පීඨය (STEM) | 187,000,000 | 29,880,101.58 | 16% |
| තාක්ෂණ පීඨය (STEM) | 490,000,000 | 459,839,117.38 | 94% |
| ප්‍රතිඵල ක්ෂෙත්‍රය 2 | | | |
| ELTA-ELSE ප්‍රදාන - මා.ශා.හා ස.වි.පීඨය | 120,000,000 | 4,122,995.88 | 03% |
| ELTA-ELSE ප්‍රදාන -ව්‍ය.වි.පීඨය | 120,000,000 | 631,285.10 | 01% |
| ELTA-ELSE ප්‍රදාන -ක.අ.හා.වා.පීඨය | 120,000,000 | 4,196,084.92 | 03% |
| ELTA–ELSE මානව විද්‍යා අධ්‍යයනාංශය | 18,000,000 | 622,357.88 | 03% |
| ELTA-ELSE භූගෝල විද්‍යා අධ්‍යයනාංශය | 18,000,000 | 215,144.10 | 01% |
| ELTA-ELSE තීරණ විද්‍යා අධ්‍යයනාංශය | 18,000,000 | 679,815.10 | 04% |
| ELTA-ELSE කළමනාකරණ අධ්‍යයනාංශය | 18,000,000 | 148,915.78 | 01% |
| ELTA-ELSE ක්‍රීඩා විද්‍යා අධ්‍යයනාංශය | 18,000,000 | Just Started | |
| ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව | 243.581,000 | 38,014,195.09 | 16% |
| ප්‍රතිඵල ක්ෂෙත්‍රය 2 | | | |
| ප. හා න.වා.ප්‍රදාන – විද්‍යා පීඨය | 45,000,000 | 33,923,025.79 | 75% |
| න.වා.වැ.ප්‍රදාන – විද්‍යා පීඨය | 40,000,000 | 10,439,024.82 | 26% |
| සං.ප.ප්‍රදාන – කළමනාකරණ පීඨය | 10,000,000 | 2,836,856.50 | 28% |
| සං.ප.ප්‍රදාන – වෛද්‍ය පීඨය | 35,000,000 | 8,794,507.67 | 25% |
| වි.ව්‍යා.සංග. ඒකකය | 15,000,000 | 3,375,874.05 | 23% |
| මුළු එකතුව | **1,515,581,000** | **597,719,301.64** | **40%** |

# තිරසාර සංවර්ධනය පිළිබඳ අනාගත අපේක්ෂාවන් 2019

**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය**


## අ ප ගේ  දැ ක්ම

අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යමත් කිරීම

## අ ප ගේ  මෙ හෙ ව ර

අපගේ අධ්‍යාපන සම්ප්‍රදාය තුළින් තිරසාර අනාගතයක් උදෙසා සංස්කෘතික උරුමයෙන් හා ප්‍රඥාවෙන් ප්‍රබෝධමත් වූ ගෝලීය ප්‍රවීණත්වයෙන් යුතු පුරවැසියන් බිහි කිරීම

තිරසාර අනාගතයක් සඳහා ඉදිරි දශකය තුළ අපගේ උපායමාර්ගික අධ්‍යාපන ප්‍රවේශය පදනම් වී ඇත්තේ අපගේ අද්විතීය 4-H ආකෘතිය මත වන අතර එමඟින් අවස්ථාව සැකසෙනුයේ ● විචාරශීලිව සිතීමට ● සදාචාරාත්මකව දැනීමට ● තරඟකාරී ලෙස ක්‍රියා කිරීමට ● නිරෝගීව සිටීමට සහ ● මිනිසුන් ● ග්‍රහලෝකය ● සෞභාග්‍යය පිළිබඳ ගැඹුරු ලෙස සිතා බැලීමට 3 - P මොඩියුලය




තිරසාර අනාගතයක් සඳහා අධ්‍යාපනය


3 - P මොඩියුලය - ● මිනිසුන් ● ග්‍රහලෝකය සහ ● සෞභාග්‍යය:

තිරසාර අනාගතයක් උදෙසා ඉදිරි දශකය තුළ අපගේ අධ්‍යාපන ප්‍රවේශය

තිරසාරභාවය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව විශ්වීය වශයෙන් එකඟ වූ අර්ථකතනයක් ඇත. එය කුමක්ද සහ එය සාක්ෂාත් කරගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව විවිධ අදහස් ඇත. තිරසාරභාවය පිළිබඳ අදහස පැන නගිනුයේ තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පයෙන් වන අතර 1992 දී රියෝ නුවර පැවති ලොව ප්‍රථම පෘථිවි සමුළුවේදී එය පොදු මාතෘකාවක් බවට පත් විය. පරිසරය හා සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසමේ

බ්‍රන්ට්ලන්ඩ් වාර්තාවේ (1992) දක්වා ඇති පරිදි තිරසාර සංවර්ධනය යනු අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාවට හානියක් නොවන අයුරින් වර්තමාන අවශ්‍යතා සපුරාලන සංවර්ධනය "යන්නයි. "අපේ ලෝකය පරිවර්තනය කිරීම: 2030 එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය" මගින් 2015 වර්ෂයේදී හඳුන්වා දුන් තිරසාර සංවර්ධන අරමුණු 17 අනුව ක්‍රියාත්මක වීමට අප එකඟවී තිබේ. මෙම න්‍යාය පත්‍රය. මිනිසුන්, අපගේ ග්‍රහලෝකය සහ සෞභාග්‍යය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මකි (6 රූපසටහන ).

1) මිනිසුන් - සමාජ ගැටළු (සියළු ජනතාවගේ යහපැවැත්ම වැඩි දියුණු කිරීම)
2) ග්‍රහලෝකය - පාරිසරික ගැටළු (පාරිසරික පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රකෘතිමත් කිරීම)
3) සෞභාග්‍යය – ආර්ථික ගැටළු (ආර්ථික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම)




**3-Ps –** (මිනිසුන්, ග්‍රහලෝකය සහ සෞභාග්‍යය)

තිරසාර විශ්ව විද්‍යාලයකට පරිවර්තනය වීම

තිරසාර හෝ හරිත විශ්ව විද්‍යාලයකට ඵලදායි ලෙස පරිවර්තනය වීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය පහත සඳහන් ප්‍රධාන කරුණු පහ අත්‍යවශ්‍ය යැයි සලකනු ලැබේ ; ඉහළ කළමනාකාරිත්වයේ කැපවීම, අධ්‍යාපනික යෙදවුම්, විශ්ව විද්‍යාල පර්යේෂණ ප්‍රයත්නයන්, දේශීය ප්‍රජාවගේ ආධාර සහ මධ්‍යම සම්බන්ධීකරණ මධ්‍යස්ථානය




ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය තිරසාර විශ්ව විද්‍යාලයක් බවට පත් වීමට

**1.** ඉහළ කළමනාකාරිත්වයේ කැපවීම– පරිපාලනමය බලපෑම

තිරසාරභාවය සඳහා විශ්ව විද්‍යාලයේ ඉහළ කළමනාකාරිත්වයේ කැපවීම ආරම්භයේදී සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. ඔවුන් ගන්නා ප්‍රධාන තීරණ අතරට නව ගොඩනැගිලි සැලසුම්, ප්‍රතිසංස්කරණ හා නවීකරණ ව්‍යාපෘති, ගොඩනැගිලි මෙහෙයුම් සහ නඩත්තු, බලශක්ති කළමනාකරණ

ප්‍රසම්පාදන පිළිවෙත්, භූමි අලංකරණය, විවිධ මට්ටම්වල ප්‍රතිචක්‍රීකරණය, අපද්‍රව්‍ය කළමනාකරණය, ප්‍රවාහනය, ආහාර සේවා සහ භෝජන මෙහෙයුම් සහ නේවාසිකාගාර මෙහෙයුම් ආදිය ඇතුළත් වේ.

## 2. අධ්‍යාපනික යෙදවුම් - අධ්‍යාපන පීඨයේ සහ සිසුන්ගේ කාර්යභාරය (අධ්‍යයන දෙපාර්තමේන්තු)

අධ්‍යාපනික පැතිකඩ ද වැදගත් වන අතර එය වෙනස් ආකාරවලින් විය හැකිය. අනාගත තිරසාරභාවය සඳහා මෙය ආයෝජනයකි. විෂයමාලා හා විෂය බාහිර ක්‍රියාකාරකම් වල නිරතවීම් ඔස්සේ තිරසාරභාවය පිළිබඳ අධ්‍යාපනය ඔස්සේ සිසුන්ට එම විෂයයන් වලට අදාළව දිගු කාලීන ප්‍රතිලාභ සහ යම් යම් කෙටි කාලීන ප්‍රතිලාභද ලබා දෙනු ඇත. අවසානයේදී ප්‍රජාවේ නායකයින් බවට පත්වීමට ඔවුනට හැකියාව ලැබෙන අතර ඒ ඔස්සේ තිරසාරභාවය පිළිබඳ දැනුම ඔවුනට ප්‍රායෝගිකව භාවිතා කිරීමට හැකිවනු ඇත. සිසුන්ට අවශ්‍ය විෂයමාලා ඉගෙන ගැනීමට විවිධ ඉගැන්වීම් ක්‍රම මඟින් ඉඩ සැලසීම තුළින් සැබෑ ලෝකයේ ගැටළු වලට ඔවුන් ඉගෙනගත් දෑ වලින් විසඳුම් ලබා ගැනීමට හැකි වේ. මෙම ඉගෙනුම් ආකෘතිය විශ්ව විද්‍යාල පරිසරයට ඉතා හොඳින් ගැලපෙන අතර එය දේශීය අවශ්‍යතා සහ යෙදුම් සමඟ දැනුම ඒකරාශී කර ගැනීමේ මාර්ගයකි. ස්වභාවය අනුව මෙය ක්ෂණික ප්‍රතිලාභයක් ලබා දෙන්නක් විය හැකිය. එසේම, තිරසාර සංවර්ධනය, වැඩමුළු සහ පුහුණුව මෙන්ම දුරස්ථ හෝ විද්‍යුත් ඉගෙනුම් ක්‍රම ආශ්‍රිත පාඨමාලා සංවර්ධනය කිරීම සමඟ තවදුරටත් අධ්‍යාපන අවස්ථා විහිදී පවතී. එක්සත් ජාතීන්ගේ සංවිධානය (http://www.un.org/sustainabledevelopment/takeaction/) තිරසාර සංවර්ධනය සඳහා බලපෑමක් ඇති කිරීම සඳහා කළ හැකි බොහෝ දේවලින් කිහිපයක් පමණක් ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, අපගේ එදිනෙදා ජීවිතයට අනුව අපට අනුගමනය කළ හැකි ඉතා පහසු දේවල් කිහිපයක් තිබේ. , සැවොම එක්ව ක්‍රියාකළ හැකි නම්, විශාල වෙනසක් සිදු කළ හැකිය . අපගේ ප්‍රයත්නයන් තුළ, සුවිශේෂී වශයෙන් සලකා බලනුයේ ;

- අපගේ පුටුවේ වාඩිවී සිට අපට කළ හැකි දේවල්
- අපගේ නිවසේ සිට අපට කළ හැකි දේවල්
- අපගේ නිවසෙන් පිටත සිට අපට කළ හැකි දේවල්

## 3. පර්යේෂණ ප්‍රයත්නයන්

විශ්ව විද්‍යාලයේ පර්යේෂණ කවුන්සිලය එහි කෙටි කාලීන හා දිගු කාලීන බලපෑම් සම්බන්ධයෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. පාරිසරික වාසස්ථාන සහ අනෙකුත් පාරිසරික ගැටළු, සමාජ ගැටළු සහ ආර්ථික ගැටළු පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති දැනටමත් ක්‍රියාත්මක කර තිබේ. මෙහිදී මහා පරිමාණ කොම්පෝස්ට් සංචිත ඇති කිරීම් , නිෂ්පාදන ක්‍රම, විකල්ප බලශක්ති ප්‍රභවයන් සහ ගොඩනැගිලි සැලසුම්, ඉදිකිරීම්, මෙහෙයුම් සහ නඩත්තු පිළිවෙත් ආදිය පර්යේෂණ සඳහා වූ විෂය ක්ෂේත්‍රවලට ඇතුළත්ව තිබේ.

## 4. දේශීය ප්‍රජාවගේ ආධාර

විවිධ මට්ටමේ සම්පත් ලබා දෙමින් සහ සහභාගී වීම තුළින් විශ්ව විද්‍යාලීය දේශිය ප්‍රජාවටද තිරසාර ප්‍රයත්නයන් වලට සහයෝගය ලබාදිය හැක. මේ සඳහා ආදි සිසුන්, ව්‍යාපාරික ප්‍රජාව, උපයෝගිතා සැපයුම්කරුවන්, වෙළෙන්දන්, වෙනත් සේවා සපයන්නන්, ප්‍රජා සංවිධාන සහ වෘත්තිකයන්ගේ සංගම් වල සහාය ලබා ගත හැක.

**5.** මධ්‍යම සම්බන්ධීකරණ මධ්‍යස්ථානය

තිරසාරභාවය සඳහා වන මධ්‍යස්ථානය හරහා සමස්ත තිරසාර ප්‍රයත්නයන් කේන්ද්‍රීයව සංවිධානය කළ යුතුය. මෙම මධ්‍යස්ථානය හරහා සියළුම සැලසුම්වල ආරම්භය , ව්‍යාපෘති, ජාලකරණය සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම් වලට අදාළව වැඩසටහනේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම ආදිය සිදු වේ. අනාගත වැඩසටහන් සඳහා සැලසුම් සකස් කිරීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීම සහ ගැටළු හා සංකල්ප අවබෝධ කර ගැනීම වැඩසටහන් ආරම්භයේ දී අත්‍යවශ්‍ය වේ. මෙහිදී සෑම අධ්‍යයන පීඨයක්, දෙපාර්තමේන්තුවක්, මධ්‍යස්ථානයක් සහ ඒකකයක් සතුවම සැලකිය යුතු කාර්යභාරයක් පවතී.

**4-H** ප්‍රතිඥාව **:**

විශ්ව විද්‍යාලයට සෑම දෙනාගේම කැපවීම අවශ්‍ය බැවින්, 4- H ප්‍රතිඥාව සිදු කරනු ලැබේ.

“මම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රැඳී සිටින කාලය තුළ සහ ඉන්පසුව පවා පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් වන බවට ප්‍රතිඥා දෙමි ”;

“මම, මගේ විශ්ව විද්‍යාලය, මගේ සමාජය, මගේ රට සහ මගේ ලෝකය වෙනුවෙන්

මගේ **හිස** විචාරශීලිව සිතීමට**,**

මගේ **හදවත** සදාචාරාත්මකව දැනීමට**,**

මගේ **දෙඅත්** තරඟකාරීව ක්‍රියා කිරීමට**,**

මගේ **සෞඛ්‍යය** නිරෝගීව ජීවත් වීමට”

**මූලික වටිනාකම්**

හවුල් වටිනාකම් යනු වැඩ කටයුතු සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය ප්‍රජාව විසින් කරන ලද කැපවීම් ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය අපගේ වටිනාකම් වනුයේ:

- අධ්‍යයන විශිෂ්ටත්වය සහ කාර්ය සාධනය
- සර්වසම ආදර කරුණාව සහ අනුකම්පාව
- නිහතමානිබව සහ අඛණ්ඩතාව
- සමාජ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම
- බුද්ධිමය චින්තනයේ නිදහස සහ නිර්මාණශීලීත්වය
- වගවීම සහ සමාජ වගකීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය දැක්ම, මෙහෙවර සහ මූලික සාරධර්ම මානව ප්‍රාග්ධනයේ සංවර්ධනය තුළින් තිරසාරත්වයේ පුළුල් විෂය පථය සමඟ පැහැදිලිවම පෙළ ගැසී ඇත. මෙම අදාළත්වය ආයතනික සැලැස්ම 2017-2021 හි විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

අරමුණු

තිරසාරබවට සිය දායකත්වය ලබාදීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් සුවිසල් ප්‍රවේශයත් සහිත පුළුල් ඉලක්ක හතක් යටතේ අරමුණු සහ උපාය මාර්ග සකස් කර ඇත;

1. ඉගෙනුම සහ අධ්‍යාපනය: තිරසාරබව උදෙසා විචාරශීලිව සිතීමට, සදාචාරාත්මකව දැනීමට සහ තරඟකාරීව ක්‍රියා කිරීමට
2. පර්යේෂණ සහ සංවර්ධනය : පර්යේෂණ, ප්‍රකාශන, පොදු කටයුතු, නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදන
3. පුද්ගලයන්: අධ්‍යයන පීඨය සහ කාර්ය මණ්ඩලය
4. යටිතලපහසුකම් : සංවිධාන ව්‍යුහයන්, සම්පත් පරිපාලනය සහ සංවර්ධනය (ප්‍රතිරූප ගොඩනැංවීම සහ උසස් වීම් ද ඇතුළුව)
5. මූල්‍යකරණය
6. දීප්තිමත් ශිෂ්‍යයන්ගේ අත්දැකීම්: හොඳින් සිටීම
7. සජීවී ප්‍රජාව, සමාජ වගකීම, ජාතික සංවර්ධනය සහ ගෝලීය / කලාපීය බලපෑම (ප්‍රතිඵල)

උපාය මාර්ගික ඉලක්ක ආශ්‍රිත ප්‍රදේශ

| ප්‍රදේශ | පොදු අරමුණු වල ක්ෂේත්‍ර |
|---|---|
| **1. ප්‍රධාන ලෙස අවධානය යොමු කිරීම** | 1. ඉගෙනුම සහ අධ්‍යාපනය: තිරසාරබව උදෙසා විචාරශීලිව සිතීමට, සදාචාරාත්මකව දැනීමට සහ තරඟකාරී ලෙස ක්‍රියා කිරීමට |
| | **2.** පර්යේෂණ සහ සංවර්ධනය : පර්යේෂණ, ප්‍රකාශන, පොදු කටයුතු, නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදන |
| **2. පහසුකම් සපයන්නන්** | **3.** පුද්ගලයන්: අධ්‍යයන පීඨ සහ කාර්ය මණ්ඩලය |
| | **4.** යටිතලපහසුකම් : සංවිධාන ව්‍යුහයන්, සම්පත් පරිපාලනය සහ සංවර්ධනය (ප්‍රතිරූප ගොඩනැංවීම සහ උසස් වීමද ඇතුළුව) |
| | **5. මූල්‍යකරණය** |
| **3. උපායමාර්ගික සම්බන්ධතා** | **6.** දීප්තිමත් ශිෂ්‍යයන්ගේ අත්දැකීම්: තෘප්තිමත් ලෙස ජීවත් වීම |
| | **7.** සජීවී ප්‍රජාව, සමාජ වගකීම, ජාතික සංවර්ධනය සහ ගෝලීය / කලාපීය බලපෑම (ප්‍රතිඵල) |

## තිරසාර සංවර්ධන අරමුණු

පහත වගුවේ දැක්වෙන්නේ 2017 සිට 2021 දක්වා කාලය සඳහා ප්‍රකාශයට පත් කරන ලද සංයුක්ත සැලැස්මේ සඳහන් තිරසාර සංවර්ධන අරමුණු හතක් ළඟාකර ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ක්‍රියාමාර්ග සැලසුම් කර ඇති ආකාරයයි.

| තිරසාර සංවර්ධන අරමුණු | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය සංයුක්ත සැලැස්ම 2017 - 2021 මඟින් ආවරණය කිරීම | | | |
|---|---|---|---|---|
| | සටහන් | ඉලක්ක | අරමුණ (ණු) | උපාය මාර්ග |
| 1. දුප්පත්කම නැති කිරීම | මේවා දැක්ම , මෙහෙවර සහ වටිනාකම් මගින් පැහැදිලිව ආවරණය කරනු ලැබේ | ඉලක්ක 1 | 1.3<br>2.1 | 1.2.4<br>1.3.2<br>2.1.3<br>2.4.1 |
| 2. කුසගින්න නැති කිරීම | | ඉලක්ක l 1 | 1.3<br>2.1 | 1.2.4<br>1.3.2<br>2.1.3<br>2.4.1 |
| 3. නිරෝගී බව සෞඛ්‍යමත්ව සිටීම සහ යහපැවැත්ම | දැක්ම මගින් පිළිබිඹු වේ | ඉලක්ක 1 | 1.1<br>2.1<br>2.4<br>6.5 | 1.1.4<br>2.1.3<br>2.4.1<br>6.5.1<br>6.5.2 |
| 4. ගුණාත්මක අධ්‍යාපනය | දැක්ම , මෙහෙවර සහ වටිනාකම් මගින් පිළිබිඹු වේ | ඉලක්ක 1 සහ 2 | ඉලක්කය 01 හි සියළුම අරමුණු<br>2.2 | ඉලක්කය 01 හි සියළුම උපායමාර්ග<br>2.2.1 |
| 5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය | වටිනාකම් සමඟ පෙළ ගැසී ඇත | ඉලක්ක 2 සහ 3 | 2.1<br>2.4<br>3.1 | 2.1.1<br>2.1.3<br>2.4.1<br>3.1.4 |
| 6. පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව | දැක්ම , මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 2 සහ 7 | 2.1<br>2.4<br>7.3 | 2.1.1<br>2.1.3<br>2.4.1<br>7.3.3<br>7.3.5 |
| 7. දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය | මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 2 සහ 7 | 2.1<br>2.4<br>7.3 | 2.1.1<br>2.1.3<br>2.4.1<br>7.3.3 |
| 8. සුනිත කාර්යයන් සහ ආර්ථික වර්ධනය | මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 1, 2 සහ 7 | 1.3<br>2.1<br>2.4<br>7.4 | 1.3.2<br>2.1.1<br>2.1.3<br>2.4.1<br>3.1.1<br>7.4.1 |
| 9. කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් | | ඉලක්ක 1, 2 සහ 7 | 2.3<br>2.4<br>2.6 | 2.3.3<br>2.3.4<br>2.4.1<br>2.4.2<br>2.4.3<br>2.6.1<br>2.6.2<br>2.6.3<br>2.6.5 |
| 10. අසමානතාවය අඩු කිරීම | වටිනාකම් | ඉලක්ක 1, 2 සහ 7 | 1.2<br>2.1 | 1.2.2<br>2.1.3 |

| | | | | |
|---|---|---|---|---|
| | | | 2.4<br>3.1<br>3.2<br>3.3<br>ඉලක්කය 07 හි සියළුම අරමුණු | 2.4.3<br>3.1.1<br>3.1.4<br>3.2.1<br>ඉලක්කය 07 හි සියළුම උපායමාර්ග |
| 11. තිරසාර නගර සහ ප්‍රජාවන් | දැක්ම , මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 1, 2, 6 සහ 7 | 2.1<br>2.4<br>6.3<br>7.3<br>7.5 | 2.1.3<br>2.4.1<br>6.3.1<br>7.3.1<br>7.3.2<br>7.3.3<br>7.5.2 |
| 12. වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදනය | ඉලක්ක 1,2 සහ 7 | ඉලක්ක 1, 2 සහ 7 | 1.8<br>2.1<br>2.2<br>2.4<br>3.2<br>3.3<br>4.1<br>4.2<br>5.1<br>5.2<br>5.4<br>7.3 | 1.8.1<br>1.8.2<br>2.1.3<br>2.2.1<br>2.2.2<br>2.2.3<br>3.2.1<br>3.3.1<br>ඉලක්කය 04 හි සියළුම උපායමාර්ග<br>5.1.2<br>5.1.3<br>5.2.1<br>5.4.1<br>7.3.3 |
| 13. දේශගුණික ක්‍රියාකාරිත්වය | වටිනාකම් | ඉලක්ක 1, 2 සහ 7 | 1.1<br>2.1<br>2.4<br>7.3 | 1.1.4<br>2.1.3<br>7.3.1<br>7.3.3 |
| 14. ජලය යට ජීවිත | දැක්ම | ඉලක්ක 1 සහ 2 | 1.1<br><br>2.1<br>2.4 | 1.1.4<br>2.1.3 |
| 15. ගොඩබිම ජීවිත | දැක්ම සහ මෙහෙවර | ඉලක්ක 1 සහ 2 | 1.1<br>2.1<br>2.4 | 1.1.1<br>2.1.3 |
| 16. සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන | දැක්ම , මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 1 සහ 2 | 1.1<br>1.2<br>1.3<br>1.8<br>2.1<br>2.2<br>3.1<br>3.2<br>3.3<br>5.3<br>5.5 | 1.1.1<br>1.2.2<br>1.3.1<br>1.3.2<br>1.8.1<br>1.6.1<br>1.6.2<br>1.8.1<br>1.8.2<br>2.1.1<br>2.1.3<br>3.1.1<br>3.1.2<br>3.1.4<br>3.2.1<br>3.3.2<br>3.3.3<br>5.3.2<br>5.5.1<br>5.5.2 |

| | | | | |
|---|---|---|---|---|
| 17. ඉලක්ක ලඟා කර ගැනීම සඳහා හවුල්කාරිත්වයන් | මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක | 1.3<br>2.3<br>2.4<br>6.2<br>6.6 | 1.2.5<br>1.3.1<br>2.1.3<br>2.3.3<br>2.3.4<br>2.4.1<br>2.4.2<br>2.4.3<br>2.6.1<br>2.6.2<br>2.6.3<br>2.6.4<br>2.6.5<br>6.2.1<br>6.6.1 |

**උපාය මාර්ගික අරමුණු අංක 1 : ඉගෙනුම සහ අධ්‍යාපනය**

**පුරෝගාමී, නවෝත්පාදක අදහස් ඇති සහ ස්වාධීන පෞරුෂයකින් හෙබි දක්ෂ ගෝලීය පුරවැසියන් ලෙස වර්ධනය වීමට සිසුන් පෙළඹවීම**

මෙම අරමුණ මගින් සෑම තරාතිරමකම සිටින අපගේ සිසුන්ගේ පුළුල් බව, නොවෙනස් ගුණාත්මකභාවය සහ අධ්‍යාපනයේ අදාළත්වය අවධාරණය කෙරේ.

මෙම අරමුණ සමඟ සම්බන්ධ වනුයේ :

- දීප්තිමත් ශිෂ්‍යයන්ගේ අත්දැකීම්
- සමාජ වගකීම්
- ජාතික සංවර්ධනය
- ගෝලීය බලපෑම්

ප්‍රධාන අරමුණු :

පළමු අරමුණ ළඟාකර ගැනීම සඳහා අප විසින් :

1.1 අපගේ අද්විතීය අභ්‍යන්තර උපාධි, පශ්චාත් උපාධි සහ වෙනත් උපාධි පාඨමාලා තුළින් සිසුන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමටත් එය ඔවුන්ගේ සැබෑ ජීවිතයට අදාළ කර ගැනීමටත් පහසුකම් සැලසීම, මග පෙන්වීම සහ සහාය දීම.

1.2 විමසීම් සහ ක්‍රියාකාරී ඉගෙනුම් ප්‍රවේශයන් තුළින් ඉගෙන ගැනීමට එක් එක් ශිෂ්‍යයාගේ හැකියාව වර්ධනය කිරීම.

1.3 අපගේ සිසුන් ගෝලීය වශයෙන් තරඟකාරී කොට ශක්තිමත් කිරීම සඳහා උපාධිධාරී ගුණාංග සහ සේවා නියුක්තියේ නිපුණතා ඇතුළත් අපගේ විෂය මාලාව නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම

1.4 ව්‍යාප්ත වූ සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම සහ දිරිගැන්වීම මෙන්ම හිතකර සාමූහික ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.

1.5 සිසුන්ගේ පෞරුෂත්වය සහ මෘදු කුසලතා, එනම් සන්නිවේදන නිපුණතා, ව්‍යවසායකත්වය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා වර්ධනය කිරීම

1.6 කාලෝචිත හා සවිස්තරාත්මක ඇගයීම් ප්‍රතිපෝෂණ අත්දැකීම් කැටුව යන ඵලදායි ඉගෙනුම් ආරක්ෂණ පද්ධතියක් (effective assurance of learning) පවත්වා ගැනීම

1.7 අධ්‍යාපනයේ සෑම අංශයකම ගුණාත්මකභාවය සහතික කිරීම සහ ලෝක මට්ටමේ පිළිගැනීමක් ලබා ගැනීම

1.8 සදාචාරාත්මක හැසිරීම සහතික කිරීම සහ ගෝලීයව පිළිගත් හොඳම භාවිතයන් අනුගමනය කිරීම.

උපායමාර්ග :

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

1.1.1 විවිධ ප්‍රවේශ සහ පිටවීමේ ස්ථාන හඳුන්වා දීමෙන් අපගේ විෂය මාලාව නම්‍යශීලී කිරීම.

1.1.2 උපාධි පාඨමාලා වල කොටසක් වශයෙන් ක්ෂේත්‍ර වැඩ, ස්වේච්ඡා සේවය, වෘත්තිය හා ජාතික හෝ ජාත්‍යන්තර පුහුණුවීම් හා ඉගෙනුම් පාඨමාලා ඔස්සේ විදේශීය අවස්ථා ලබා ගැනීමට අපගේ සිසුන් පෙළඹවීම.

1.1.3 අපගේ පර්යේෂණ නිපුණතා සහ සොයාගැනීම් මත පදනම්ව පර්යේෂණ ප්‍රමුඛ ඉගැන්වීම් සහ ඉගෙන ගැනීම් දිරිමත් කිරීම.

1.1.4 විවිධ ක්ෂේත්‍ර ඒකාබද්ධ වූ සංයුක්ත පාඨමාලා සහ වැඩසටහන් හඳුන්වා දීම

1.2.2 අපගේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් පරාසය සහ ඊට අදාළ පහසුකම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම

1.2.4 සෑම සිසුවෙකුගේම අධ්‍යයන සැලැස්ම සහ අධ්‍යාපන ප්‍රගතිය වෙනුවෙන් මඟ පෙන්වීම සඳහා ‘උපදෙස් උපදේශක’(Consulting Tutor) ප්‍රවේශය හඳුන්වා දීම, ඔවුන්ගේ ඉගෙනීමේ හා සංවර්ධනයේ හිමිකාරිත්වය ලබා ගැනීමට සහ ඔවුන්ගේ අනාගත වෘත්තීන් සැලසුම් කිරීමට සහාය වීම

1.2.5 පර්යේෂණ ක්‍රියාකාරකම් හා දැනුම හුවමාරු කර ගැනීම තුළින් අපේ සිසුන්ට ඉගෙනීමේ අවස්ථාව ලබා දීම

1.3.1 අපගේ උපාධි වැඩසටහන් වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූලව ක්‍රියා කරන බව සහතික කිරීම සඳහා වෘත්තීය සංවිධාන, කර්මාන්ත, ආදි ශිෂ්‍යයින් සහ වෙනත් පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කිරීම

1.3.2 ආර්ථික හා සමාජීය වශයෙන් වටිනා ගුණාංග, විශේෂඥතාව සහ ප්‍රායෝගික දැනුම සහිත උපාධිධාරීන් බිහිකිරීම සඳහා විෂයමාලා සකස් කිරීම

1.6.1 දැනට පවතින ඇගයීම් ක්‍රමය වැඩිදියුණු කිරීම සහ වෙනස්කම් වලට භාජනය කිරීම

1.6.2 ඵලදායි සහ විනිවිදභාවයෙන් යුතු ඇගයීම් ක්‍රමවේදයන් භාවිතා වන බවට සහතික වීම

1.8.1 වෙනස් කළ හැකි හා නම්‍යශීලී පුද්ගලයන් සංවර්ධනය කිරීම සඳහා නිවැරදි ආකල්ප, සාරධර්ම, වෘත්තීයභාවය සහ ජීවිතය පිළිබඳ නිවැරදි දැක්ම අපගේ වැඩසටහන් වලට ඇතුළත් කිරීම

1.8.2 ඉගැන්වීම හා ඉගෙනීම සඳහා චර්යාධර්ම සංග්‍රහ සහ හොඳම භාවිතයන් හඳුන්වා දීම.

**උපාය මාර්ගික අරමුණු අංක 2: පර්යේෂණ සහ සංවර්ධනය: පර්යේෂණ, ප්‍රකාශන, මහජන සහභාගීත්වය, නිර්මාණශීලීත්වය සහ නව්‍යකරණය**

**ශ්‍රී ලංකාව, ආසියාව සහ ගෝලීය ප්‍රජාවන්ගේ තිරසාර සංවර්ධනය සඳහා විවිධ විෂය ක්ෂේත්‍රයන්හි නව දැනුම හා මෙවලම් නිර්මාණය, ගවේෂණය සහ ව්‍යාප්තිය සඳහා ප්‍රාණවත් , සාර්ථක හා අන්තර්ක්‍රියාකාරී පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම.**

මෙම අරමුණ සවිමත් වනුයේ අපගේ පර්යේෂණයේ පෘථුලභාවය හා ගුණාත්මකභාවය ඒකරාශී කර ගනිමින් වන අතර එයට උපාධි හා පශ්චාත් උපාධි පර්යේෂණ යන දෙයංශයද ඇතුළත් වේ. ගැඹුරින් මුල් බැසගත් අපගේ දැනුම පර්යේෂණ මඟින් ඉස්මතු වන අතර කුසලතා අපගේ කාර්යයන්හි විශිෂ්ටත්වය දැක්වීමට උපකාරී වේ.

මෙම අරමුණ සමඟ සම්බන්ධ වනුයේ:

- ඉගෙනුම සහ අධ්‍යාපනය
- ගෝලීය බලපෑම
- සජීවී ප්‍රජාව

ප්‍රධාන අරමුණු :

දෙවන අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

2.1 සාම්ප්‍රදායික සීමාවන් ඉක්මවා නව හා නැගී එන පර්යේෂණ ක්ෂේත්‍ර ගවේෂණය කිරීමෙන් වඩා සාර්ථක පර්යේෂණ න්‍යාය පත්‍රයක් සකස් කිරීම

2.2 ගුණාත්මක පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා පර්යේෂකයන්ගේ පර්යේෂණ හැකියාවන් සහ නිපුණතාවන් වැඩි දියුණු කිරීම

2.3 පර්යේෂණ හා නව්‍යකරණය ඔස්සේ ජනනය කර ගනු ලබන දැනුම ප්‍රකාශයට පත් කිරීම, ජනප්‍රිය කිරීම, වාණිජකරණය කිරීම සහ භාවිතයේ යෙදවීම

2.4 පර්යේෂණ සාර්ථකත්වය සහ ඒවායේ බලපෑම සෙසු පිරිස් අතර බෙදා හැරීම සහ ප්‍රසිද්ධියට පත් කිරීම

2.6 පර්යේෂණ කටයුතු සහ ඒ ආශ්‍රිත අරමුදල් සපයා ගැනීම සඳහා කර්මාන්ත, ජාතික සහ ජාත්‍යන්තර ආයතන සමඟ ඵලදායි ලෙස සහයෝගීතාවයක් පවත්වා ගෙන යාම

උපායමාර්ග

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

2.1.1 ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අදාල පර්යේෂණ න්‍යාය පත්‍රයක් සකස් කිරීම සහ වැදගත් පර්යේෂණ ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛත්වය ලබාදීම

2.1.3 උග්‍රව පවතින දේශීය, කලාපීය හා ගෝලීය ගැටළු විසඳීම සඳහා නායකත්වය සැපයීම.

2.2.1 අපගේ පර්යේෂණ ශක්තීන්ගේ පෘථුලභාවය, ගුණාත්මකභාවය සහ හැකියාවටට අදාළ පූර්ණ ශක්‍යතාවය අවබෝධ කර ගැනීම

2.2.2. ජාතික හා ජාත්‍යන්තර පුහුණු අවස්ථා සහ සහයෝගීතාවයන් තුළින් අපගේ පර්යේෂණ නිපුණතා සංචිතය වැඩි දියුණු කිරීම.

2.2.3 උපකරණ සහ මෘදුකාංග ආදියේ කාර්යක්ෂම සහ තිරසාර භාවිතය සම්බන්ධයෙන් ජනතාව දිරි ගැන්වීම

2.3.3 කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ අදහස් වාණිජමය වශයෙන් යථාර්ථයක් බවට පත් කිරීම සඳහා සුදුසුම මාධ්‍යයන් ගවේෂණය කිරීම

2.3.4 අධ්‍යයන ක්ෂේත්‍රයන්ගේ වෘත්තිකයන්ගේ දැනුම හුවමාරු කර ගැනීම තුළින් බුද්ධිමය දේපල හඳුනා ගැනීම සහ ප්‍රාග්ධනීකරණය කිරීම සහ බුද්ධිමය දැනුම සමාජය වෙත ප්‍රවේශය සැලසීම

2.4.1 අපගේ පර්යේෂණ සාර්ථකත්වය ආර්ථික, පාරිසරික, සෞඛ්‍ය හා අවසානයේ සමස්ත සමාජයේ යහපත වෙනුවෙන් යෙදවීම

2.4.2 දැඩි කථාබහක් සහිත මාතෘකා සම්බන්ධ දැනුම හුවමාරුව, මහජන සහභාගීත්වය සහ උපදේශනය වැඩි දියුණු කිරීම සඳහා පෙළඹවීම

2.4.3 ඉලක්කගත හා ක්‍රියාශීලී මැදිහත් වීමක් තුළින් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් සමඟ දිගු කාලීන, තිරසාර සම්බන්ධතා වර්ධනය කිරීම

2.6.1 පර්යේෂණ අරමුදල් සපයන්නන් සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයක් සුරක්ෂිත අයුරින් පවත්වා ගැනීම

2.6.2 කැපී පෙනෙන කලාපීය හා ගෝලීය පර්යේෂණ සහයෝගීතා දිරිගැන්වීම ඇතුළුව බහු න්‍යායාත්මක පර්යේෂණ සඳහා නව ප්‍රවේශයන් සංවර්ධනය කිරීම

2.6.3 නවෝත්පාදනයන්ට සහාය වීම සඳහා ව්‍යාපාරික හා මූල්‍ය ප්‍රජාව සමඟ සම්බන්ධතා වර්ධනය කිරීම.

2.6.4 විදේශ අරමුදල් සුරක්ෂිත කිරීම වෙනුවෙන් අපගේ ප්‍රවේශය වෘත්තීයකරණය සහ අරමුදල් ලබා ගැනීම සඳහා සාර්ථක ලෙස තරග වැදීමට අපගේ පර්යේෂණ ස්ථානගත කිරීම

2.6.5 හවුල්කරුවෙකු ලෙස හවුල්කාරිත්ව කර්තව්‍යයන් වලට අවස්ථාවක් ලබා ගැනීම සඳහාත් සහ නව සමාගම්, ව්‍යාපෘති, නිෂ්පාදන සංවර්ධනය සහ නිර්මාණය සඳහා විශාල වශයෙන් ආධාර ලබාදෙන ආධාරකරුවෙකු ලෙස අපගේ කීර්තිය භාවිතා කිරීම.

පහසුකම් සපයන්නන් **:**

**උපාය මාර්ගික අරමුණු අංක 3: මිනිසුන්**

**විශ්වවිද්‍යාලීය පරිසරය වැඩ කිරීමට පහසු සහ උත්තේජක ස්ථානයක් බවට පත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ හැකියාවන් සියල්ල අගය කිරීම, සහාය දීම, සංවර්ධනය කිරීම සහ ඒවා ඵලදායි ලෙස උපයෝගී කර ගැනීම**

අපගේ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ සාර්ථකත්වය මුළුමනින්ම රඳා පවතින්නේ අපගේ සියළුම අධ්‍යයන පීඨ හා කාර්ය මණ්ඩලයේ කැපී පෙනෙන ක්‍රියාකාරිත්වය සහ දායකත්වය මත ය

මෙම පහසුකම් සපයන්නා සමඟ සම්බන්ධ වනුයේ **:**

- **සමානාත්මතාවය**
- **සජීවී ප්‍රජාව**
- **සමාජ වගකීම්**
- **ජාතික සංවර්ධනය**

ප්‍රධාන අරමුණු **:**

තුන්වන අරමුණ ළඟාකර ගැනීම සඳහා අප විසින්:

3.1 ලොව වටා සිටින දක්ෂ පුද්ගලයන් වෙත ප්‍රවේශ වෙමින් එවැනි පුද්ගලයින් ආකර්ෂණය කර ගනිමින් ඔවුනට ප්‍රතිලාභ ලබා දීම

3.2 ගුණාත්මකභාවයෙන් යුතු පර්යේෂණ හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම ඉහල නැංවීම සඳහා අපගේ සමස්ත කාර්ය මණ්ඩලයේ දැනුම, හැකියාවන් සහ කුසලතා වැඩි දියුණු කිරීම

3.3 අභිමානය, ගෞරවය, විවිධත්වය, සෞඛ්‍යය සහ යහපැවැත්මට අනුබල දෙන සහායක සහ සාමූහික පරිසරයක් නිර්මාණය කිරීම.

උපාය මාර්ග

අපගේ අරමුණු ළඟාකර ගනුයේ පහත අයුරින් වේ :

3.1.1 කලාපීය හා ගෝලීය වශයෙන් වැදගත් ආයතනයක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ නව කාර්ය මණ්ඩල සාමාජිකයින්ට වඩාත් ඵලදායී කිරීමට සහාය වීම.

3.1.2 විශිෂ්ටත්වයට හා සාර්ථකත්වයට විවිධාකාරයෙන් ප්‍රතිලාභ ලබා දීම

3.1.4 අපගේ අනාගත අභියෝගාත්මක අවශ්‍යතා සපුරාලන තිරසාර කාර්ය මණ්ඩල පැතිකඩක් පවත්වා ගැනීම

3.2.1 වෘත්තියභාවය, වෘත්තීය සංවර්ධනය සහ දියුණුව සඳහා සහාය වීම තුළින් විවිධ කුසලතා සකස් කිරීම , පාලනය කිරීම සහ මෙහෙයවීම සඳහා දිරිගැන්වීම සහ සුදානම් කිරීම පිණිස අපගේ කාර්ය මණ්ඩලය තුළ උපායමාර්ගිකව ආයෝජනය කිරීම.

3.3.1 නම්‍යශීලී, අන්තර් ක්ෂේත්‍ර (අධ්‍යයන), කණ්ඩායම් වැඩ සහ එකඟතා ප්‍රවේශයන් තුළින් සමබර වැඩ-ජීවිතය ප්‍රවර්ධනය කිරීම

3.3.2 ආරක්ෂිත, ප්‍රවේශ විය හැකි හා ප්‍රසන්න සේවා පරිසරයක් සැපයීම

3.3.3 ඵලදායි සේවක නියුක්ත වීම සහ සවිබල ගැන්වීම, විනිවිදභාවය සහ සාර්ථක සන්නිවේදනය තුළින් සාමූහිකත්වය, ඉවසීම, දයානුකම්පාව සහ ශක්තිමත් ආචාර ධර්ම වලින් සවිමත් අපගේ සංස්කෘතියේ ගුණාංග වැඩිදියුණු කිරීම.

**උපාය මාර්ගික අරමුණු අංක 4: යටිතල පහසුකම්**

**ඉතා උසස් අධ්‍යයන සහ උපකාරක ක්‍රියාකාරකම් පවත්වා ගැනීම සඳහා අති නවීන, කාර්යක්ෂම හා උත්තේජක ඉගෙනුම් හා වැඩ කරන පරිසරයක් සැපයීම.**

අපගේ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට උසස් තත්වයේ යටිතල පහසුකම් යනු යතුරකි.

මෙම පහසුකම් සපයන්නා සමඟ සම්බන්ධ වනුයේ:

- ඉගෙනුම සහ අධ්‍යාපනය
- මිනිසුන්
- සමාජ වගකීම්

ප්‍රධාන අරමුණු :

සිවුවැනි අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

4.1 හරිත සංකල්පය සැලකිල්ලට ගනිමින් අපගේ භෞතික, පුස්තකාල, තොරතුරු තාක්ෂණය සහ අනෙකුත් යටිතල පහසුකම්වල සියළු අංග හරහා ගුණාත්මකභාවය සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම

4.2 පවත්නා අවකාශය කළමනාකරණය කරන අතරම අපගේ උරුමයේ ප්‍රධාන අංගයක් වන පෞරාණික ගොඩනැගිලි ඇතුළු නව වැදගත් පහසුකම් ගොඩනගමින් අප පරිශ්‍රයේ වටිනාකම හා තිරසාර බව ඇගයීම.

උපාය මාර්ග

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

4.1.1 විවිධ අදහස් ඇති පුද්ගලයන්ගෙන් සැදී කාර්ය මණ්ඩලයේ, ශිෂ්‍යයන්ගේ සහ පුළුල් ප්‍රජාවේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා අපගේ යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම

4.1.2 සම්පත් පරිභෝජනය ප්‍රශස්ත කිරීම සඳහා ඔරොත්තු දීමේ හැකියාව ඇති තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය පද්ධතියක් ස්ථානගත කිරීම

4.1.3 විශ්ව විද්‍යාලය සතු වටිනාකමක් සහිත විවිධ සම්පත් සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

4.1.4 අපගේ සමස්ත යටිතල පහසුකම් සැලසුම් ක්‍රියාවලිය තුළ තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම් සහ ප්‍රධාන උපකරණ ප්‍රසම්පාදනය ඵලදායි ලෙස ඒකාබද්ධ කිරීම (අනාගත තාක්‍ෂණික සංවර්ධනය හඳුනා ගැනීම සහ මේවාට ක්ෂණිකව හා නම්‍යශීලීව ප්‍රතිචාර දැක්වීමට ක්‍රියා කිරීම )

4.1.5 ඉගෙනීම, ඉගැන්වීම, පර්යේෂණ කිරීම සහ ඵලදායී තීරණ ගැනීම සඳහා සහාය වීම සඳහා තත්‍ය කාලීන සහ මාර්ගගත තොරතුරු පද්ධති ඇති කිරීම (අපගේ සම්පත් අත්පත් කර ගැනීම, නිර්මාණය කිරීම, රඳවා තබා ගැනීම, ගබඩා කිරීම, ඉදිරිපත් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් ගැනීම)

4.2.1 කාර්යක්‍ෂම සහ වේගවත් ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

4.2.2 අවශ්‍ය අවස්ථාවන්හිදී ව්‍යාපෘති ඒකාබද්ධ කිරීම සහ නැවත සකස් කිරීම.

4.2.3 අනාගත ඉල්ලීම් සඳහා නව ඉඩක් ලබා ගැනීම සහ පවතින අවස්ථාව උපරිම අයුරින් භාවිතා කිරීම

4.2.4 අපගේ අවකාශය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සඳහා මුදල් යෙදවීම සහ මුදල් සඳහා වැඩි වටිනාකමක් ලබා දීම (මෙය අපගේ කාලසටහන් ප්‍රතිපත්තියේ දිගුකාලීන අරමුණු ඉටු කිරීම, කුඩා ගොඩනැගිලි වැඩි ප්‍රයෝජනයක් ගැනීම සහ අධ්‍යයන පීඨ අතර අවකාශය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මනා සන්නිවේදනයක් පවත්වා ගැනීම ).

**උපාය මාර්ගික අරමුණු අංක 5: මූල්‍යකරණය**

**තිරසාර තරඟකාරී තත්ත්වයක් ගොඩනැගීම සඳහා සමස්ත මූල්‍ය ශක්තිය පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම**

විශ්ව විද්‍යාලයේ සියළුම උපාය මාර්ගික අරමුණු හා අභිමතාර්ථ ලඟා කර ගැනීම අපගේ සමස්ත මූල්‍යමය හැකියාව මත රඳා පවතී

ප්‍රධාන අරමුණු **:**

පස්වැනි අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

5.1 සුරක්ෂිත දිගුකාලීන මූල්‍ය ශක්‍යතාවයක් පවත්වා ගැනීම

5.3 වගවීම, විනිවිදභාවය, අඛණ්ඩතාව සහ මූල්‍ය පාලනය පිළිබඳ ඉහළ ප්‍රමිතීන් සහතික කිරීම

5.4 අපගේ සියලු ක්‍රියාකාරකම් කාර්යක්ෂමව හා නිසි වේලාවට ක්‍රියාත්මක කිරීම

5.5 මනා විශ්ව විද්‍යාල යහපාලනයක් සහතික කිරීම

උපායමාර්ග

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

5.1.1 ආර්ථික හා අරමුදල් සපයන පරිසරය සක්‍රියව අධීක්ෂණය කිරීම සහ සියළු ප්‍රධාන තීරණ වල දිගුකාලීන මූල්‍ය සබඳතා තක්සේරු කිරීම මගින් අපගේ සම්පත් උපාය මාර්ගික ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීම

5.1.2 අපගේ දිගුකාලීන මූල්‍ය අනාවැකි නිතිපතා යාවත්කාලීන කිරීම සහ තීරණ ගැනීමේදී මේවා මාර්ගෝපදේශ ලෙස භාවිතා කිරීම.

5.1.3 අපගේ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමට සහ නව තිරසාර ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමට අපගේ අරමුදල් සුරක්ෂිත කිරීම සහ කළමනාකරණය කිරීම

5.2.1 වරින් වර අපගේ මූල්‍ය උපායමාර්ග සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සහ අපගේ මූල්‍ය තිරසාරභාවය පිළිබඳ වාර්ෂික තක්සේරුවක් ලබා ගැනීම.

5.4.1 මූල්‍යමය වශයෙන් තිරසාර අධ්‍යාපනයේ පුළුල් පරාසයක් සහ නැවත ආයෝජනය සඳහා අතිරික්තයක් ජනනය කරන වාණිජ ක්‍රියාකාරකම් තුළින් අපේ ආදායම වර්ධනය කිරීම හා විවිධාංගීකරණය කිරීම

5.5.1 අපගේ ආයෝජන හා භාණ්ඩාගාර උපාය මාර්ග ඔස්සේ විශ්ව විද්‍යාලයට උපරිම මූල්‍ය ප්‍රතිලාභ ලැබීම සහතික වීම සහ අදාළ ක්‍රියාකාරකම් සඳහා උපරිම මූල්‍ය ආධාර සැපයීම.

5.5.2 තීරණ ගැනීම සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා අපගේ විශ්ව විද්‍යාල පාලන රාමුව වැඩි දියුණු කිරීම.

**උපාය මාර්ගික සම්බන්ධතා:**

**උපාය මාර්ගික අරමුණු අංක 6: විශිෂ්ඨ ශිෂ්‍ය අත්දැකීම්**

**තම අධ්‍යයනවලින් ඔබ්බට යමින් ජීවිතය සඳහා සූදානම් වීමට සිසුන්ට සුවිශේෂී හා ගුණාත්මක අත්දැකීමක් ලබා ගැනීමට අවස්ථාව නිර්මාණය කිරීම**

මෙම පහසුකම් සපයන්නා සමඟ සම්බන්ධ වනුයේ:

- ඉගෙනුම සහ අධ්‍යාපනය
- පර්යේෂණ සහ සංවර්ධනය
- සජීව ප්‍රජාව
- සමාජ වගකීම්

ප්‍රධාන අරමුණු :

හයවන අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

6.2 අපගේ අධ්‍යයන හා මානුෂික ආධාරක රාමුව පුනර්ජීවනය කිරීම .
6.3 ඉගෙනුම් ප්‍රජාවක කොටස් කාරයන් වීම පිළිබඳ අපගේ සිසුන් හා ආදි ශිෂ්‍යයින් තුළ සැබෑ හැඟීමක් ඇති කිරීම.
6.5 සිසුන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යය, යහපැවැත්ම සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම .
6.6 කලාපීය හා ගෝලීය සහභාගී වීම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

උපාය මාර්ග

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

6.2.1 සිසුන්ට අත්දැකීම් ලබා ගැනීම පහසු කිරීම සඳහා අපගේ සබඳතා වැඩිදියුණු කිරීම

6.3.1 අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා ආදි ශිෂ්‍යයන් සමඟ දීර්ඝකාලීන සම්බන්ධතා ඇති කර ගැනීම සහ අපගේ ශිෂ්‍යයන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීම.

6.5.1 සියළු ආකාරයේ මානසික හා ශාරීරික සෞඛ්‍යය, යහපැවැත්ම සහ ආරක්ෂිත කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශ්ව විද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම.

6.5.2 සිසුන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සහතික කරමින් ශිෂ්‍ය සුභසාධන පහසුකම් වැඩි දියුණු කිරීම.

6.6.1 අපගේ උපාධිධාරීන්ට කලාපීය හා ගෝලීය ප්‍රජාව තුළ ඔවුන්ගේ පූර්ණ හැකියාවන් ළඟා කර ගැනීමට අවශ්‍ය විශේෂඥතාව හා ගුණාංග වලින් සවිමත් පහසුකම් සැලසීම.

**උපාය මාර්ගික අරමුණු අංක 7: සජීවී ප්‍රජාව , සමාජ වගකීම් , ජාතික සංවර්ධනය සහ ගෝලීය / කලාපීය බලපෑම්**

**සජීවී ප්‍රජාව නඟා සිටුවීම සහ පාර්ශවකරුවන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතා තුළින් ජාතික, කලාපීය සහ ගෝලීය සංවර්ධනයට දායක වීම**

මෙම උපාය මාර්ගික කාර්යයන් හා සම්බන්ධ වනුයේ:

- ඉගෙනීම් සහ අධ්‍යාපනය
- පර්යේෂණ සහ සංවර්ධන යටිතල පහසුකම්

ප්‍රධාන අරමුණු :

හත්වන අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

7.1 අපගේ සම්පත් සහ විශේෂඥතාව පූර්ණ ලෙස ලබා ගත හැකි අයුරින් සකස් කිරීම සහ වගකිවයුතු සහ බලගතු උපදේශකයෙකු, අසල්වැසියෙකු හා සේවා යෝජකයෙකු ලෙස ක්‍රියා කිරීම

7.2 ජීවිත කාලය පුරාම සම්බන්ධතා පැවැත්වීම තුළින් ආදි ශිෂ්‍යයින්ගේ සහ ආශ්‍රිත ජාලයන්හි දැනුවත්, නියැලී සිටින සහ සහාය දක්වන ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවක් ගොඩනැගීම.

7.3 ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සහ අපගේ ප්‍රජාවට පහසුකම් සැලසීම සඳහා ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ කොන්දේසි නිර්මාණය කිරීම සහ විශ්ව විද්‍යාලය තුළ සහ ඉන් ඔබ්බට සමාජ වගකීම් සහ තිරසාරභාවය සඳහා දායක වීමට පෙළඹවීම

7.4 අපගේ කාර්යයන් වලට අදාලව ජාතික සංවර්ධනය සඳහා උපරිම දායකත්වය ලබාදීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ජාතික ආයතන සමඟ ශක්තිමත් සහයෝගීතාවයක් ඇති කිරීම සහ එමඟින් වෙනසක් ඇති කිරීමට ක්‍රියා කිරීම

7.5 අපගේ අභිලාෂයන් තුළින් සමස්තයක් ලෙස විශ්ව විද්‍යාලයේ සහ සමාජයේ යහපත සඳහා ගෝලීය වශයෙන් ක්‍රියා කිරීම

උපාය මාර්ග

අපගේ අරමුණු ළඟාකර ගනුයේ පහත අයුරින් වේ :

7.3.3 අපගේ ප්‍රධාන සමාජ, පාරිසරික හා ආර්ථික බලපෑම් නිරූපණය කිරීම.


7.3.5 නැවත භාවිතා කිරීම, අපද්‍රව්‍ය අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය උපරිම කිරීම, පුනර්ජනනීය බලශක්තිය (ජෛව වායු / සූර්ය) භාවිතා කිරීම සහ විශ්ව විද්‍යාලය තුළ සහ ඉන් පිටත වනාන්තරකරණය සඳහා හරිත සංකල්ප ප්‍රවර්ධනය කිරීම.

7.4.1 මහජන කටයුතුවල නියැලීම අපගේ අරමුණෙහි ප්‍රධාන අංගයක් බවට අපගේ මතය ඉදිරිපත් කිරීම සහ පර්යේෂණ වල හිතකර බලපෑම් ඔස්සේ මෙම ක්ෂේත්‍රයේ සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම, හඳුනා ගැනීම සහ සැමරීම

# 2019 වර්ෂයේ වාර්ෂික ගිණුම් වාර්තා

## පුනරාවර්තන වියදම් විස්තරය 2019

| විෂය | 2019 |
|---|---:|
| සේවක වැටුප් හා දීමනා | 3,875,309 |
| ගමන්වියදම් | 30,504 |
| සැපයීම් | 142,706 |
| නඩත්තු වියදම් | 28,070 |
| කොන්ත්‍රාත්තු සේවා | 652,018 |
| වෙනත් | 548,739 |
| මූලධන ආධාර - පුනරාවර්තන වියදම් | 414,833 |
| මුළු එකතුව | 5,692,179 |



## මුල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 2019 පීඨ වශයෙන් එක් ශිෂ්‍යයකු සඳහා වන වියදම (අභ්‍යන්තර උපාධි අපේක්ෂ)

| පීඨය | මුලු වියදම (රු.) | 2019 වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාව | එක් ශිෂ්‍යයකු සඳහා වියදම (රු.) |
|---|---|---|---|
| අ) ව්‍යවහාරික විද්‍යා | 1,097,647,886 | 2334 | 470,286 |
| ආ) මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | 1,114,268,151 | 3473 | 320,837 |
| ඇ) වෛද්‍ය විද්‍යා | 838,009,168 | 941 | 890,552 |
| ඈ) කළමනාකරණ හා වාණිජ විද්‍යා | 1,468,014,997 | 4793 | 306,283 |
| ඉ)ඉංජිනේරු | 241,425,659 | 351 | 687,822 |
| ඊ)තාක්ෂණ | 359,982,338 | 947 | 380,129 |
| උ)සම සෞඛ්‍ය | 116,057,395 | 296 | 392,086 |
| | **5,235,405,595** | **13,135** | |

## මූලධන වියදම් විස්තරය 2016-2019 (රු.'000)

| විෂය | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|
| අ) දේපල අත්පත්කරගැනීම | 239,151 | 542,137 | 724,950 | 300,926 |
| ආ) ගොඩනැගිලි හා සැලසුම් අත්පත් කර ගැනීම | 658,309 | 269,169 | 1,395,075 | 787,141 |
| ඇ)පුස්තකාල පොත් | 13,962 | 33,337 | 30,914 | 21,304 |
| ඈ) දැනුම වර්ධන අරමුදල් | - | - | - | - |
| ඉ) මානව මූලධන සංවර්ධන ව්‍යාපෘති | 121,084 | 1,650 | 9,253 | 12,937 |
| ඊ) බලගැන්වුම් පර්යේෂණ | 137,341 | 146,417 | 369,062 | 168,857 |
| උ) අනෙකුත් ( පුනරුත්තාපන) | 126,343 | 142,472 | 127,597 | 234,210 |
| එකතුව | **1,296,190** | **1,135,182** | **2,656,851** | **1,525,375** |

## මූල්‍ය කාර්යසාධන පිළිබඳ පුනරාවර්තන වියදම් – 2019 රු. ( '000)


| විෂය | නියමය | එක් ශිෂ්‍යයකුට වියදම් |
|---|---|---|
| අ) එක් ශිෂ්‍යයකු සඳහා වන පුනරාවර්තන වියදම්(පුන.වි) | පුන.වි/ශිෂ්‍යාන් ගණන | 433 |
| ආ) එක් ශිෂ්‍යයකු සඳහා වන ප්‍රාග්ධන වියදම් (ප්‍රාග්.වි) | ප්‍රා.වි/ශිෂ්‍යාන් ගණන | 116 |

## පසුගිය වසර 5 ක කාලය තුළ මූල්‍යමය තත්වය ( අගයන් රු.'000 වශයෙන්)

| විෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| 1. සේවක වැටුප් හා දීමනා | 1,938,192 | 2,181,660 | 2,384,967 | 2,989,044 | 3,875,309 |
| 2. ගමන් වියදම් | 27,594 | 46,122 | 32,170 | 41,015 | 30,504 |
| 3. සැපයීම් | 95,291 | 105,859 | 117,133 | 126,643 | 142,706 |
| 4. නඩත්තු සේවා | 96,239 | 129,262 | 35,884 | 74,378 | 28,070 |
| 5. කොන්ත්‍රාත් සේවා | 280,647 | 350,182 | 496,041 | 577,564 | 652,018 |
| 6. වෙනත් | 319,590 | 313,821 | 385,306 | 377,922 | 547,760 |
| 7. පර්යේෂණ හා සංවර්ධන | 44,341 | 945 | 293 | 1,682 | 979 |
| 8. විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘති හා අනෙකුත් | 62,115 | 114,359 | 259,834 | 391,920 | 414,833 |
| එකතුව | 2,864,009 | 3,242,210 | 3,711,628 | 4,580,168 | 5,692,179 |


## පසුගිය වසර 5ක කාලයේ දී මූල්‍ය තත්වය ( අගයන් රු.'000)

| විෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| මුලධන ආධාර | 875,000 | 1,297,200 | 1,139,312 | 2,653,700 | 1,510,156 |
| පුනරාවර්තන අධාර | 2,360,000 | 2,537,702 | 2,907,750 | 3,590,000 | 4,589,000 |



පසුගිය වසර 5ක කාලයයේ දී මූල්‍ය ප්‍රතිපාදනයන්හි තත්වය (අගයන් රු.'000)

| විෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| මුලධන වියදම් | 887,793 | 1,296,190 | 1,135,182 | 2,656,851 | 1,525,375 |
| පුනරාවර්තන වියදම් | 2,864,009 | 3,242,210 | 3,711,628 | 4,580,168 | 5,692,179 |



## 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශය

| | | *2019 දෙසැ: 31 දිනට* | *2018 දෙසැ: දිනට (ගැලපු)* |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | සටහන | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරිටක හා උපකරණ | 6 | 9,910,769,599 | 9,342,136,008 |
| පුස්තකාල පොත් සහ උපාධි ලේඛ | 7 | 57,276,878 | 51,025,615 |
| කෙරීගෙන යන වැඩ | 8 | 2,614,067,646 | 1,393,602,358 |
| ආයෝජන | 9 | 23,643,797 | 19,543,268 |
| මූල්‍ය වත්කම් | 10 | 2,048,104,499 | 1,612,763,872 |
| | | **14,653,862,420** | **12,419,071,121** |
| **ජංගම වත්කම්** | | | |
| ගබඩා තොගය | 11 | 56,664,388 | 40,058,196 |
| සන්ඩ්රි ණය ගැතියන් සහ ලැබිය යුතු දේ | 12 | 130,435,842 | 138,010,552 |
| වත්මන් මූල්‍ය වත්කම් | | | |
| සේවක අත්තිකාරම් | 13 | 745,468 | 970,758 |
| අත්තිකාරම් සහ පෙරගෙවුම් | 14 | 235,390,373 | 490,537,100 |
| මුදල් සහ මුදල් සමානතා | 15 | 93,513,344 | 70,432,850 |
| | | **516,749,415** | **740,009,456** |
| **වත්කම් එකතුව** | | **15,170,611,835** | **13,159,080,574** |

| | 2019.දෙසැ:31 දිනට | | 2018.දෙසැ:31 දිනට |
|---|---|---|---|
| | (රු) | | (රු) |
| ස්කන්ධය හා වගකීම් | | | |
| | | | |
| ස්කන්ධ ප්‍රාග්ධනය | | | |
| මූලධන ආධාර | 6,337,961,992 | | 5,804,452,314 |
| මූලධන ආධාර - වෙනත් | 966,321,412 | | 430,580,383 |
| ත්‍යාග හා ප්‍රදාන | 490,212,514 | | 30,075,835 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 5,245,641,447 | | 5,123,774,169 |
| රඳවා ගත් ඉපයීම් | (1,421,832,744) | | (488,764,645) |
| | **11,618,304,621** | | **10,900,118,057** |
| | | | |
| සංචිත හා අරමුදල් | | | |
| අභ්‍යන්තර විශේෂිත අරමුදල් | 722,059,096 | | 583,279,328 |
| මූලධන සංචිත | 1,574,237 | | 1,574,237 |
| අනුස්මරණ අරමුදල් | 31,969,905 | | 29,932,386 |
| විවිධ පර්යේෂණ අරමුදල් | 140,089,224 | | 110,712,440 |
| විලම්භිත ආදායම් - ස්වයං මූල්‍ය හා ව්‍යාපෘති | 590,026,671 | | 445,860,667 |
| | **1,485,719,132** | | **1,171,359,059** |
| | | | |
| ජංගම නොවන වගකීම් | | | |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වෙන්කිරීම් | 1,312,962,990 | | 506,796,798 |
| | **1,312,962,990** | | **506,796,798** |
| | | | |
| ජංගම වගකීම් | | | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 32,728,127 | | 20,225,125 |
| උපචිත හා වෙනත් ගෙවිය යුතු වියදම් | 720,896,961 | | 560,581,535 |
| | **753,625,088** | | **580,806,660** |
| | | | |
| **ස්කන්ධය හා වගකීම් වල එකතුව** | **15,170,611,835** | | **13,159,080,574** |
| | | | |
| | | | |
| මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත. | | | |
| | | | |
| | | | |
| කේ.එස්.ටී.එස්. ජයසූරිය | | | කේ.ජී. බ්‍රිටෝ |
| වැඩ බලන මූල්‍යාධිකාරී | | | ලේඛකාධිකාරී |
| | | | |
| | | | |
| පාලක සභාව වෙනුවෙන් අත්සන් කළේ: | | | |
| | | | |
| මහාචාර්ය සම්පත් අමරතුංග | | | ටී. ධර්මරාජ |
| උපකුලපති | | | පාලක සභා සාමාජික |

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

( ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත)

| | 2019 | 2018 |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | රු: | රු: |
| රජයේ ආධාර - පුනරාවර්තන | 4,589,000,000 | 3,590,000,000 |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | 394,188,677 | 387,926,049 |
| අභ්‍යන්තර ආදායම් | 817,429,736 | 606,609,357 |
| රජයේ ආධාර සහ පරිත්‍යාග ක්‍රමක්ෂය | 708,820,644 | 545,661,575 |
| මහපොළ ශිෂ්‍යත්ව | 72,373,750 | 453,492,500 |
| ශිෂ්‍යාධාර | 53,482,100 | 65,561,600 |
| **මුළු ආදායම** | **6,635,294,907** | **5,649,251,082** |
| | | |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වැටුප් හා දීමනා | 3,875,309,550 | 2,989,043,825 |
| ගමන් වියදම් | 30,504,296 | 41,014,803 |
| සැපයීම් | 142,706,205 | 126,642,848 |
| නඩත්තු සේවා | 28,070,295 | 74,378,113 |
| කොන්ත්‍රාත් සේවා | 652,018,404 | 577,563,951 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 548,738,657 | 379,604,040 |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් | 85,776,849 | 33,225,295 |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභ සහ පාඩු | 714,907,070 | 8,963,789 |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මත පොලී පිරිවැය | 55,747,648 | - |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීම් පාඩු | 269,444 | 540,359 |
| මූලධන ආධාර - පුනරාවර්තන වියදම් | 414,832,945 | 391,919,826 |
| ක්ෂය වීම් | 826,318,757 | 660,576,278 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 5,559,806 | 6,693,709 |
| මහපොළ ශිෂ්‍යත්ව | 72,373,750 | 453,492,500 |
| ශිෂ්‍යාධාර | 53,482,100 | 65,561,600 |
| **මුළු වියදම්** | **7,506,615,777** | **5,809,220,936** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ඌනතාවය/ අතිරික්තය** | **(871,320,870)** | **(159,969,855)** |

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|
| | දිනට | දිනට |
| | (රු:) | (රු:) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් (ඌනතාවය) /අතිරික්තය | (871,320,870) | (159,969,855) |
| | | |
| ගැලපීම් | | |
| ක්ෂය කිරීම | 826,318,757 | 660,576,278 |
| ණය හානිකරණය | - | 222,895 |
| ආයෝජන පොලී | (179,656,131) | (114,879,276) |
| විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම | 85,776,849 | 33,225,295 |
| නිර්වචිත ප්‍රතිලාභ බැදීම් මත පොලී පිරිවැය | 55,747,648 | - |
| නිර්වචිත ප්‍රතිලාභ බැදීම් මත ආයුගණක ලාභ සහ පාඩු | 714,907,070 | 8,963,789 |
| රජයේ ආධාර සහ පරිත්‍යාග ක්‍රමක්ෂය | (708,820,644) | (545,661,575) |
| වත්කම් ඉවත් කිරීම් ලාභ සහ පාඩු | 269,444 | 540,359 |
| පුනරුත්තාපන වියදම් සඳහා මාරු කිරීම | - | 2,336,090 |
| අස්පෘශ්‍ය වත්කම් ක්ෂය | 5,559,806 | 6,693,709 |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | (394,188,677) | (387,926,049) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **(465,406,747)** | **(495,878,340)** |
| | | |
| ගබඩා තොගය (වැඩිවීම/අඩුවීම) | (16,606,192) | 812,710 |
| ණයගැතියෝ සහ ලැබියයුතු දෑ (වැඩිවීම/අඩුවීම) | 16,706,678 | (26,815,476) |
| සේවක ණය හා අත්තිකාරම් (වැඩිවීම/අඩුවීම) | 225,290 | (429,350) |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් (වැඩිවීම/අඩුවීම) | 255,146,727 | (166,149,726) |
| උපචිත හා වෙනත් ගෙවිය යුතු වියදම් (වැඩිවීම/අඩුවීම) | 160,315,425 | 160,564,237 |
| ආපසු ගෙවියයුතු තැන්පත් (වැඩිවීම/අඩුවීම) | 12,503,002 | 6,914,290 |
| විස්තිරණ පාඨමාලා සඳහා විලම්භිත ආදායම් (වැඩිවීම/අඩුවීම) | 144,166,003 | 179,871,509 |
| කාරක ප්‍රාග්ධන වෙනස ගැලපීමෙන් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ව ශුද්ධ මුදල් ප්‍රවාහය | **107,050,187** | **(341,110,145)** |
| පාරිතෝෂික ගෙවීම | (50,265,375) | (34,243,329) |
| ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරි මුදල් ප්‍රවාහය | **56,784,812** | **(375,353,474)** |

| | 2019.12.31 දිනට | | 2018.12.31 දිනට |
|---|---|---|---|
| | (රු:) | | (රු:) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | (100,722,642) | | (793,851,739) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමේ ක්‍රියාවලිය | 1,945,753 | | 1,723,097 |
| ආයෝජන පොලී | 170,524,163 | | 102,524,210 |
| කෙරීගෙන යන වැඩ | (1,288,713,884) | | (1,381,053,340) |
| වසර තුළ ආයෝජනය කළ මුදල් | (519,215,725) | | (459,222,948) |
| ආයෝජන ලැබීම් | 75,645,063 | | 89,614,478 |
| සේවක ණය ගෙවීම් | 8,230,034 | | 2,279,476 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,652,307,238)** | | **(2,437,986,766)** |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | | |
| මූලධන ආධාර | 1,510,156,076 | | 2,653,700,000 |
| අනුස්මරණ මුදල් භාවිතය | 2,037,519 | | 1,372,844 |
| බාහිර අරමුදල් භාවිතය | (61,747,229) | | (22,178,370) |
| විශේෂිත අරමුදල් | 138,779,768 | | 186,520,485 |
| පර්යේෂණ අරමුදල් | 29,376,784 | | 15,918,471 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,618,602,919** | | **2,835,333,430** |
| | | | |
| මුදල් හා ආසන්න මුදලින් සදුව ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | 23,080,492 | | 21,993,190 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් වලට සමානයන් | 70,432,850 | | 48,439,662 |
| කාලපරිච්ඡේදය වර්ෂ අවසානයේ දී මුදල් වලට සාමනයාා | **93,513,344** | | **70,432,850** |

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**මූල්‍ය ප්‍රකාශන 2019**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශනය**

| විස්තරය | පොදු සංචිතය | ප්‍රත්‍යාගණන අතිරික්තය | ප්‍රාග්ධන ප්‍රතිපාදන | | | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | | | වැය කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන (රු) | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන (රු) | පරිත්‍යාග හා අනෙකුත් අරමුදල් | |
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | **(488,764,645)** | **5,123,774,169** | **5,802,154,894** | **2,297,420** | **460,656,220** | **10,900,118,057** |
| වෙක්පත් අවලංගු කිරීමේ බලපෑම | | | (13,000,000) | 13,000,000 | | - |
| වර්ෂය තුළ දී වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | | | 1,525,375,820 | (1,525,375,820) | | - |
| වසර තුළ ලද අරමුදල් | | | | 1,480,460,000 | | **1,480,460,000** |
| AHEAD ව්‍යාපෘතියෙන් ලද අරමුදල් | | | | 29,696,076 | | **29,696,076** |
| මෝටර් වාහන ප්‍රත්‍යාගණන අතිරික්තය | | 121,867,278 | | | | **121,867,278** |
| උපයාගත් අරමුදලින් ප්‍රාග්ධනයට වන දායකත්වය | | | | | 14,459,696 | **14,459,696** |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | | | (394,188,677) | | | **(394,188,677)** |
| වර්ෂය තුල ලද ප්‍රදාන | | | | | 1,107,780,933 | **1,107,780,933** |
| ප්‍රාග්ධන අරමුදල් හා ත්‍යාග ක්‍රමක්ෂය | | | (582,457,723) | | (126,362,921) | **(708,820,644)** |
| අරමුදල් - ශිෂ්‍යත්ව හා බැඳුම්කර කඩවීම් | (24,964,785) | | | | | **(24,964,785)** |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත/(ඌනතාවය) | (871,320,870) | | | | | **(871,320,870)** |
| සංවර්ධන අරමුදල් වලට බැර කරන ලද පොලී ආදායම | (36,782,444) | | | | | **(36,782,444)** |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(1,421,832,744)** | **5,245,641,447** | **6,337,884,314** | **77,678** | **1,456,533,927** | **11,618,304,621** |
| | | | | | | - |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගනු ලැබූ වැදගත් ගිණුම් ප්‍රත්පත්ති පිළිබඳ සාරාංශය - 2019

**1. වාර්තාකරණ අස්ථිත්වය**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ස්ථාපනය කොට ඇති අතර එහි ප්‍රධාන පරිපාලන පරිශ්‍රය නුගේගොඩ ගංගොඩවිල පිහිටා ඇත. නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වේ.

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත දිනය</u>**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා පාලක සභාව විසින් 2020 පෙබරවාරි 26 වැනි දින අනුමැතිය ලබා දෙන ලදී.

**1.2 <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>**

විශ්වවිද්‍යාලයේ වාර්තාකරණ කාලපරිච්ඡේදය 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වේ.

**2. අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය**

**2.1 <u>අනුකූලතා ප්‍රකාශනය</u>**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං. රා. ගි. ප්‍ර.) අනුකූලව පිළියෙළ කොට ඉදිරිපත් කර ඇත. කෙසේවෙතත් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත භාවිතයේ නොමැති අවස්ථා වල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ද භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අඩංගුවේ.

**2.2 <u>මිනුම් කිරීමේ පදනම</u>**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව උපචිත පදනම මත පිළියෙළ කර ඇත. සාධාරණ වටිනාකම මත මනිනු ලබන දේපල පිරියත හා උපකරණ හැර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිඳු වෙනස් කිරීමක් කර නොමැත.

## 2.3 සංසන්දනාත්මක තොරතුරු

විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරන ලද සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්ති පූර්ව වර්ෂයේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුකූල වන පරිදි යොදාගෙන ඇති අතර ප්‍රවර්තන වර්ෂයේ සංඛ්‍යා පිළියෙළ කිරීමේ දී පෙර වර්ෂවල ශේෂයන් අවශ්‍ය අවස්ථාවල වෙනස්කම්වලට අනුකූල වන පරිදි ගලපනු ලැබ ඇත.

## 2.4 ප්‍රමාණවත්භාවය සහ රාශීකරණය

සෑම සමාන වැදගත් අයිතම පංතියක්ම මූල්‍ය ප්‍රකාශන තුළ වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වරූපයේ හෝ අසමාන ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම නොවැදගත් නොවන අවස්ථාවල හැර වෙනම ඉදිරිපත් කොට ඇත.

## 2.5 හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති යටතේ අවශ්‍ය වන්නේ නම් හෝ අවසර දී ඇත්නම් හැර වත්කම් සහ බැරකම් හා ආදායම් සහ වියදම් හිලව්කර නොමැත.

## 2.6 අඛණ්ඩ පැවැත්ම

විශ්වවිද්‍යාලය එහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ශක්‍යතාවය තහවුරු කරගැනීම සඳහා විශ්වවිද්‍යාලය පිළිබඳව සහ එහි වත්කම් පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර ආයතනයක් වශයෙන් බොහෝ කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සම්පත් පවතින බවට විශ්වවිද්‍යාලය සෑහීමට පත්වී ඇත. තවද අඛණ්ඩව ආයතනයක් වශයෙන් පවත්වාගෙන යාම සම්බන්දයෙන් වන කිසියම් ප්‍රමාණවත් සැකයක් උපදවන තරම් වන අවිනිශ්චිත තාවයක් පවතින බවට පාලක සභාව තුළ අදහසක් නොමැත. ඒ මත මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ පදනම මත පිළියෙළ කොට ඇත.

## 2.7 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

වාර්තාකරණ දිනයට පසුව සිදු වූ සියළු වැදගත් සිදුවීම් සැලකිල්ලට ගනු ලැබූ අතර අවශ්‍ය අවස්ථාවලදී උචිත ගැළපීම් සහ අනාවරණයන් මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකර ඇත.

## 2.8 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකක

විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුළ භාවිතා වන මුදල් ඒකක භාවිතා කරමින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළ පවතින අයිතම මිනුම් කරනු ලැබේ **(ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකක)**. විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඉදිරිපත් කරනු ලැබේ.

## 2.9 විදේශීය මුදල් ඒකක ගනුදෙනු

සියළුම විදේශ විනිමය ගනුදෙනු එම ගනුදෙනු සිදුවන අවස්ථාවේ පවතින විනිමය හුවමාරු අනුපාතයට අනුව, වාර්තාකරණ මුදල් ඒකක වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

## 2.10 වැටයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව වෙනත් ආකාරයකට දක්වා ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන තුළ සඳහන් සංඛ්‍යා ආසන්නතම රුපියලට වැටයීම් කර ඇත.

## 2.11 දේපළ, පිරියත සහ උපකරණ

විශ්වවිද්‍යාලයේ දේපළ, පිරියත සහ උපකරණ තුළ ඉඩම්, ගොඩනැගිලි, රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ, කාර්යාලීය උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම්, පුස්තකාල පොත් සහ වාර සඟරා, මෝටර් රථ, උපාධි ලෝගු, ක්‍රීඩා උපකරණ හා අනෙකුත් වත්කම් යන අයිතමයන් ඇතුළත්වේ.

### (අ) හඳුනාගැනීමේ පදනම

අයිතමයේ ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රථිලාභ ආයතනය තුළට ගලා ඒනම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකිනම් එවිට දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනී**.**

### (i) මූලික හඳුනාගැනීම

දේපල, පිරියත සහ උපකරණ මුලින් හඳුනාගෙන ඇත්තේ මිලදී ගැනීමේ පිරිවැය ද ඇතුළුව වත්කම් එහි සේවා කොන්දේසි සපුරා ගැනීම සඳහා වන ඕනෑම අමතර සිදුවීමක් සමඟ ය. හඳුනාගැනීමේ දිනට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය ලෙස අයිතමයක මිල හෝ සාධාරණ අගය යොදා ගනී.

**(ii) පවත්නා දේපළ, පිරියත සහ උපකරණ මත වන පසුකාලීන පිරිවැය**

පහත සඳහන් නිර්නායක සපුරන්නේ නම් ස්ථාවර වත්කම් සඳහා දරණ වියදම් මත ප්‍රාග්ධනිත කළ හැකි අතර ක්ෂය කළ යුතුය. එසේ නොවන අවස්ථාවල ස්ථාවර වත්කම් මත වන පිරිවැය එම පිරිවැය දරනු ලබන කාලපරිච්ඡේදයේ දී කාර්ය සාධන ප්‍රකාශනයට ගනු ලැබේ.

- ස්ථාවර වත්කම්වල වෙළඳපොළ අගය ඉහළ යාම.
- අයිතමයේ ධාරිතාවය ඉහළ යාම.
- නිමවුමේ ගුණාත්මකභාවේ වර්ධනය හෝ මෙහෙයුම් පිරිවැයේ පහළයාම.
- අලුත්වැඩියා සහ නඩත්තු මගින් සහතික කරන ලද වත්කමේ ආයුකාලයේ සැලකියයුතු මට්ටමේ වැඩිවීම.
- තක්සේරු කරන ලද කාර්යසාධනයේ ප්‍රමිතියෙන් අපේක්ෂා කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පත් කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම, වියදමක් ලෙස හඳුනා ගැනේ.

**(iii) හඳුනාගැනීමෙන් පසු ගණනය කිරීම්**

**පිරිවැය ආකෘතිය**

ඉඩම්, ගොඩනැගිලි, මෝටර්රථ,රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ, ක්‍රීඩා උපකරණ, කාර්යාලීය උපකරණ, අනෙකුත් උපකරණ සහ ගෘහභාණ්ඩ සහ සවිකිරීම් පංති හැර සියලු දේපළ, පිරියත සහ උපකරණ ඒවා හඳුනා ගැනීමෙන් පසු සමුච්චිත ක්ෂය අඩුකරන ලද එහි පිරිවැයට ගණනය කරනු ලැබේ.

**ප්‍රත්‍යාගණන ආකෘතිය**

පහත සඳහන් දේපළ, පිරියත සහ උපකරණ පංති මූලික හඳුනාගැනීමෙන් අනතුරුව විශ්වසනීය ලෙස ගණනය කළ හැකි සාධාරණ අගය ප්‍රත්‍යාගණිත දිනය වන විට කිසියම් පසුකාලීන සමුච්චිත ක්ෂයවීමක් හෝ පසුකාලීන හානිකරණ පාඩුවක් වේනම් එය අඩුකරන ලද ප්‍රත්‍යාගණිත අගයට ධාරණය කරනු ලැබ ඇත. ඉඩම, ගොඩනැගිලි, මෝටර් රථ, කාර්යාලීය උපකරණ, රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම, ක්‍රීඩා උපකරණ, අනෙකුත් වත්කම්.

දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම රැගෙන යාම එක් එක් වාර්තාකරණ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. වත්කමක් රැගෙන යා හැකි මුදල එහි අයකර ගත හැකි මුදල ඉක්මවා ගියහොත් හානියක් නැතිවීමක් ලෙස හඳුනා ගැනේ. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ දුර්වලතා අඩුපාඩු හඳුනාගෙන ඇත.

**(iv) පුස්තකාල පොත් සහ උපාධි ලෝගු**

පුස්තකාල පොත් සහ උපාධි ලෝගුවල පිරිවැය වසර 5 ක කාලයක් පුරා සරල මාර්ග පදනම මත ලියාහරිනු ලැබේ.

**(v) අස්පෘශ්‍ය වත්කම්**

වත්කම් වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යවසායයට ගලා යා හැකි අතර වත්කම්වල පිරිවැය විශ්වසනීයව මැනිය හැකි විට පරිගණක මෘදුකාංග සහ මාර්ගගත ජ'නල අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන තිබේ. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැය අඩු සමුච්චිත ක්‍රමක්ෂය සහ හානිකරණය ලෙස සඳහන් වේ. මෙම පිරිවැය ඔවුන්ගේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය මත ක්‍රමක්ෂය කර ඇත.

(ආ) **ක්ෂයවීම්**

මූල්‍යප්‍රකාශන තුළ සින්නක්කර ඉඩම හැර දේපළ, පිරියත සහ උපකරණ සෑම අයිතමයක්ම සරල මාර්ග පදනම මත ක්ෂය කිරීම හඳුනා ගනී. වත්කමක් භාවිතය සඳහා පවතින විට ක්ෂය කිරීම ආරම්භ වන අතර එය විකිණීම සඳහා වර්ග කර ඇති මුල් දිනයේ දී සහ වත්කම හඳුනාගැනීම අවසන් වන දිනයේ දී ක්ෂයවීම අවසාන වේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ.

| **වත්කම් භාණ්ඩය** | **ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය** |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 යි. |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | වසර 10 යි |
| රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ | වසර 05 යි |
| කාර්යාලීය උපකරණ | වසර 05 යි |

| | |
|---|---|
| මෝටර්රථ | වසර 2-5 දක්වා |
| පරිගණක සහ උපාංග | වසර 05 යි |
| ක්‍රීඩා උපකරණ | වසර 05 යි |
| අනෙකුත් වත්කම් (ජලය, දුරකථන සහ විදුලි යෝජනා ක්‍රම ඇතුළුව) | වසර 10 යි |
| අභ්‍යන්තර කොටස් නිර්මාණය | වසර 05 |
| භූ දර්ශනයන් කිරීම | වසර 05 |

වත්කම් ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි ප්‍රමාණයට වඩා වැඩි නම්, එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී වත්කමේ ධාරණ අගය එහි අයකර ගත හැකි මුදලට වහාම ලියා තබනු ලැබේ. බැහැර කිරීම්වල ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ ලැබෙන ආදායම ධාරණ අගය හා සංසන්දනය කිරීමෙන් වන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන්හි ලාභ අලාභ හඳුනා ගැනේ.

(ඇ) **හඳුනාගැනීම ඉවත් කිරීම**

දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය ඒවා අපහරණය කිරීමේ දී හෝ එහි භාවිතයෙන් ඉවත් කිරීම හෝ අපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවයේ යෙදවීමක් විභවතා අපේක්ෂා නොකරන විට දී හඳුනා ගැනීම අවසන් වේ. අයිතමය හඳුනානොගැනීමේ දී එසේ හඳුනානොගැනීම හේතුකොටගෙන සිදුවන ලාභය හෝ අලාභ අතිරික්තයට හෝ ඌනතාවයට ඇතුළත් කළ යුතුය.

## 2.12 <u>මූල්‍ය වත්කම්</u>

**ආයෝජනයන්**

ස්ථාවර තැන්පතු හා ඉතුරුම් ගිණුම්වල ආයෝජනය කරයි. මෙම ආයෝජන SLFRS 9 ට අනුව ආයෝජනය කර ඇත. SLFRS 9 විසින් නියම කරනු ලබන පරිදි ඵලදායී පොලී අනුපාත භාවිතා කිරීමෙන් සාධාරණ වටිනාකමක් ගණනය කරනු ලබන අතර සාධාරණ වටිනාකම අඩු පිරිවැයකින් ගණනය කරනු ලැබේ.

**කාර්ය මණ්ඩල ණය**

මාණ්ඩලික ණය සඳහා ආපදා ණය, පරිගණක ණය, ප්‍රකාශන ණය, වාහන ණය සහ වෙනත් කාර්ය මණ්ඩල ණය ඇතුළත් වේ. SLFRS 09 ට අනුව කාර්ය මණ්ඩල ණය ක්‍රමවත් පිරිවැයකින් මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

## 2.13 <u>කෙරීගෙනයන ප්‍රාග්ධන වැඩ</u>

වාර්තාකරන දිනය වන විට සම්පූර්ණ කර නොමැති දරණ ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දැක්වේ. කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයයන් භාවිතය සඳහා සුදානම්වූ විට දේපළ, පිරියත සහ උපකරණවලට මාරු කළ හැකිය.

## 2.14 <u>ජංගම වත්කම්</u>

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වර්ග කර ඇති ජංගම වත්කම් වනුයේ උපලබ්ධි වීමට අපේක්ෂිත හෝ විකිණීම හෝ ආයතනයේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලියේදී යොදා ගැනෙන හා ප්‍රයෝජනය ගැනෙන බවත් වාර්තාකරන දිනෙන් පසු මාස 12 ක් ඇතුලත උපලබ්ධි වීම අපේක්ෂා කරන වත්කම් හෝ මුදල් හෝ මුදල් සමාන දෑ වේ.

## 2.15 <u>තොග</u>

නැවත විකිණීමේ පරමාර්ථයෙන් තොරව පරිභෝජනය සඳහා භාණ්ඩ තොග වශයෙන් හඳුන්වන අතර පළමු ගැනුම් පළමු නිකුතු පදනම මත තොග නිකුත් කරනු ලැබේ.

## 2.16 <u>කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් සහ ලැබිය යුතු දෑ</u>

කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් සහ ලැබිය යුතු දෑ යන්නට උත්සව අත්තිකාරම් හා පොත් දීමනාව ඇතුලත් වේ.

## 2.17 <u>මුදල් සහ මුදල් සමාන දෑ</u>

මුදල් සහ මුදල් සමාන දෑ යන්න අතැති මුදල් සහ ඉල්ලුම් තැන්පතු සහ අගයේ සැලකිය යුතු තරම් නොවන වෙනස්වීමේ අවධානයකට භාජනය වන සහ දන්නා මුදල් ප්‍රමාණයකට වහා පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන වශයෙන් නිර්වචනය කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යයන් සඳහා අතැති මුදල් සහ බැංකු තැන්පතු මුදල් සහ මුදල් සමාන දෑ ලෙස සලකනු ලබන අතර අත්පත් කර ගැනීම සඳහා හය මාසයකට අඩු කාලයක් පවතින කෙටි කාලීන පරිණතියක් සහිත ආයෝජන ද මුදල් සමාන දෑ

ලෙස සලකනු ලැබේ. වක්‍ර ක්‍රමය මත පදනම්ව මුදල් ප්‍රවාහ ප්‍රකාශ වාර්තා කරනු ලැබේ.

## 2.18 ප්‍රාග්ධන වියදම් සඳහා වන රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම

### 2.18.1 <u>පුනරාවර්තන ප්‍රදාන</u>

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ පුනරාවර්තන ප්‍රදාන මුදල් පදනම මත හඳුනාගනී. ස්ථාවර වත්කම් පුනරුත්තාපනය සඳහා වන පිරිවැය සහ ඉදිකිරීම් සහ නව කාර්යයන් සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන අවශ්‍ය පරිදි කෙරීගෙන යන වැඩ හෝ ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනාගනී.

### 2.18.2 <u>ප්‍රාග්ධන වැය සඳහා බාහිර ප්‍රදානවලින් දරන දායකත්වය</u>

ප්‍රාග්ධන වැය සඳහා බාහිර ප්‍රදානවලින් දරන දායකත්වය යන්නට උපයාගත් අරමුදල් සහ විවිධ ව්‍යාපෘති අරමුදල්වලින් සිදු කරන ලද දේපළ, පිරියත සහ උපකරණ මිලදීගැනීම් දැක්වේ.

### 2.18.3 ප්‍රාග්ධන ප්‍රදාන

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති නොමැතිවීම හේතුකොටගෙන මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 20 අනුව ඉදිරිපත්කොට ඇත. ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල විලම්භිත ආදායමක් ලෙස හඳුනාගෙන ඇති අතර වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය පුරාවට ක්‍රමක්ෂය කර ඇත.

### 2.18.4 අභ්‍යන්තර වශයෙන් සීමා කරන ලද ශුද්ධ වත්කම්

නිශ්චිත කාර්යයක් සඳහා වෙන් කරන ලද අරමුදල් අභ්‍යන්තර වශයෙන් සීමා කරන ලද ශුද්ධ වත්කම්වලට ඇතුලත් වේ. වර්ෂය අවසානයේදී වැය නොකරන ලද ශුද්ධ ශේෂයක් සහිත පීඨ / සංවර්ධන අරමුදල් පීඨ සංවර්ධන අරමුදල් නියෝජනය වේ.

### 2.18.5 පරිත්‍යාග අරමුදල්

පරිත්‍යාගවලින් උත්පාදිත විශ්වවිද්‍යාලයේ ආයෝජන ප්‍රතිලාභ හා ලද පරිත්‍යාගන් පරිත්‍යාග අරමුදල්වලට ඇතුලත් වන අතර ඒවා පරිත්‍යාගශීලීන් විසින් ස්ථාපිත විවිධ අරමුණු වලට අනුකූලව භාවිත කරනු ලැබේ.

## 2.19 සේවක ප්‍රතිලාභ

**නිශ්චිත දායක සැලසුම්**

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල (UPF) දායක මුදල්, සේවක භාරකාර අරමුදල (ETF) විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල, අදාළ තත්වයන්ට සහ රෙගුලාසි වලට අනුකූල වේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සේවක සේවිකාවන්ගේ ජීවන වියදම් දීමනා සඳහා අමතර දායක මුදල් ගෙවනු ලබන අතර තවදුරටත් මුදල් ගෙවීමට හා නීතිමය හෝ වගකිව යුතු බැදීමක් නොමැත.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(I) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/D/USJ/FA/19/3

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 ජනවාරි 11 දින

උපකුලපති

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කරන ලද වාර්තාව සමඟ එහි ඉංග්‍රීසි සහ දෙමළ අනුවාද මේ සමඟ ඉදිරිපත් කරමි.

ඩබ්ලිව්.එම්.පී.ජේ.ෆොන්සේකා

සහකාර විගණකාධිපති



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමෙ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්‍වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 76 (ඇ) ඡේදය ප්‍රකාරව වාර්තා කරන දිනෙන් පසුව මාස 12 ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂිත වත්කම් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් එකතුව රු. 298,416,940 ක් වූ කෙටි කාලීන තැන්පතු 42 ක් සහ එකතුව රු. 12,650,598 ක් වූ ඉතිරි කිරීමේ ගිණුම් 09 ක් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 02 මුදල් ප්‍රවාහ ප්‍රකාශන අනුව මුදල යන්නට අතැති හා ඉල්ලුම් තැන්පතු අයත් වේ. මේ අනුව විශ්වවිද්‍යාල ස්ථාවර තැන්පතු වල ආයෝජන පරමාර්ථයෙන් මුදල් ආයෝජනය කොට ඇති බැංකුව දෙනු ලබන පොලී අනුපාතයද සැලකිල්ලට ගෙන ඇත. කෙටිකාලීන (මාස 03) ස්ථිර තැන්පතු වල තැන්පත් කලද එම තැන්පතු අලුත් කිරීම් වලට යටත්ව ශේෂයන් අදාල අරමුණු සඳහා උපයෝජනය කරන තෙක් ආයෝජනයක් ලෙස පවත්වා ගනු ලැබේ. එමනිසා මෙම ශේෂයන් මුදල් හා සමාන දෑ යටතට නොව ආයෝජන ලෙස දක්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුස්තකාල දත්ත පද්ධතියක වාර්ෂික අළුත්කිරීම් ගාස්තු ලෙස ගෙවන ලද රු. 3,142,905 ක් දෝෂ සහගත ලෙස පුස්තකාල පොත් ගිණුමට හර කිරීම නිසා එම පුස්තකාල පොත් වටිනාකම එම ප්‍රමාණයෙන් හා වර්ෂයේ ක්ෂය රු. 70,608 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වසරේදී නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. | ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පර්යේෂණ ව්‍යාපෘති 04 ක් සඳහා මිලදී ගත් එකතුව රු. 2,236,807 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2020 වසරේදී නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. | පර්යේෂණ ව්‍යාපෘති සඳහා මිලදී ගන්නා ස්ථාවර වත්කම් සියල්ල ප්‍රාග්ධනිත කල යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රසායන විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීමේ කාර්ය කොන්ත්‍රාත්කරු අත්හැර ගොස් තිබුණු බැවින් 2012 අප්‍රේල් 25 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු. 1,764,013 ක් සමාලෝචිත වර්ෂය තුළදීද අය කර ගෙන නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 42 දෙනෙකු පශ්චාත් උපාධි ලබා ගැනීම සඳහා විදේශගත වී නැවත සේවයට නොපැමිණීම හේතුවෙන් ගිවිසුම කඩවීම මත 2020 ජුනි 30 දිනට රු. 113,714,235 ක බැඳුම්කර වටිනාකමක් අයවිය යුතුව පැවතුණි. | 2019 වර්ෂයේ රු. 24,964,784.54 අයකර ගැනීමට කටයුතු කර ඇත. | නිශ්චිත කාල රාමුවක් සහිතව සියළු බැඳුම්කර ශේෂයන් අයකර ගත යුතු අතර බැඳුම්කර කඩවීම් ඉදිරියේදී ඇති නොවීමට ගිවිසුම්වල කොන්දේසි ශක්තිමත් කිරීම කළ යුතුය. |
| (ඇ) 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂය තුළ වසර 2 සිට වසර 3 දක්වා කාල පරාසයකට අදාලව එකතුව රු.241,980 ක් හා | 2020 වසරේදී රු.217,680 ක මුදලක් අයකර ගෙන ඇත. දෙදෙනෙකු සඳහා කම්කරු | අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| වසර 3ක් හා ඊට වැඩි කාලපරාසයකට අදාළව එකතුව රු.1,145,505 ක් විය. | උසාවියේ නඩුවක් විභාග වෙමින් පවතින අතර ඉතිරි ණය මුදල අර්ථසාධක අයකිරීමේදී අයකිරීමට කටයුතු කරනු ඇත. | |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත් වැඩ 92 කට අදාළව 2013 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 116,737,289 ක් වූ රැඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙහි ඇති ඇතැම් කොන්ත්‍රාත් නීම වී ඇති අතර ඒවා අවසන් කිරීමෙන් පසු රැඳවූ මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. ඉතිරිය ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| XXIV පරිච්ඡේදයේ 3.18 වගන්තිය ප්‍රකාරව | ණය මුදල් අයකර ගැනීමට හෝ අයකර ගැනීමේ සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට හෝ කටයුතු නොකර එකතු වටිනාකම රු. 366,648 ක් වූ ආපදා ණය ලබාගෙන තිබුණු නිලධාරීන් 03 දෙනෙකුට වැටුප් රහිත නිවාඩු ලබා දී තිබුණි. | විගණන විමසුමේ සඳහන් තිදෙනාගෙන් එක් අයෙකුගේ ණය මුදල 2019 ජූනි මස සිට අයකරන අතර ඉතිරි දෙදෙනා විශ්වවිද්‍යාලයේ සේවයෙන් ඉවත්ව ඇත. ඔවුන්ගේ මුදල් අර්ථසාධක අරමුදලින් අයකිරීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371 (2) හා (5) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) තත්කාර්ය අත්තිකාරම් ලබාගත් නිලධාරියකු අදාළ කාර්යය නිමකළ විගස හෝ දින දහයක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවද එකතුව රු. 4,232,885 ක් වූ අත්තිකාරම් 84 ක් ආපසු පියවීම සඳහා දින 21 සිට දින 164 අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. | පැවතුනු සේවක වැඩවර්ජනය නිසා අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇති අතර ඒවා දැනටමත් පියවීමට කටයුතු කර ඇත. තවද සමහර අත්තිකාරම් අදාල කාර්ය නිමවීමෙන් පසු නියමිත කාලය තුල පියවීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (ii) තත්කාර්ය අතුරු අග්‍රිම රු. 100,000 ක උපරිම සීමාවක් දක්වා ලබා දිය හැකි වුවද එම සීමාව ඉක්මවා නිලධාරීන් 07 දෙනෙකුට අවස්ථා 15 ක දී රු. 102,240 ක සිට රු. 277,800 ක් දක්වා පරාසයක් තුළ අත්තිකාරම් නිකුත් කර තිබුණි. | උපකුලපති තුමාගේ අවසරය මත අත්තිකාරම් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 2014 ජනවාරි 23 දින සිට 2019 මැයි 29 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ එකතු වටිනාකම රු. 1,303,000 ක් වූ අවලංගු කරන ලද චෙක්පත් 161 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් කමිටු නිර්දේශ මත ආදායමට ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි අනුකූල විය යුතුය. |
| (ඇ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය | | | |
| XX වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කර නොතිබූ අතරම පැමිණීම පිටවීම සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් දිය යුතුය. | පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුවේ. |
| (ඈ)2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව අනුමත ඉන්ධන සීමාව ඉක්මවා විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරුන් 06 දෙනා වෙනුවෙන් රු. 856,569 ක් වටිනා අතිරේක ඉන්ධන ලීටර් 6,797 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව පාලක සභාව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අතිරේක ඉන්ධන ගෙවීම් අනුමත කර ඇත. තවද විශ්වවිද්‍යාලය සතු වාහන ඉතා පැරණි බැවින් ඒවා ඉවත් කර අලුතින් වාහන ලබා ගැනීමට ඉල්ලුම් කළද ඒ සඳහා අනුමැතිය ලබාදී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 2.8.4 | කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 100 දක්වා වූ කොන්ත්‍රාත් වලට අදාලව | කොන්ත්‍රාත් වටිනාකම අනුව නිසි ලෙස තාක්ෂණික ඇගයීම් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය |

| | | | |
|---|---|---|---|
| ප්‍රකාරව | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවල අවම වශයෙන් එක් සාමාජිකයෙක් රේඛීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්තිත්වයෙන් බාහිර අදාළ විෂයය සම්බන්ධයෙන් දැනුම ඇති අයෙකු විය යුතු වුවද රු. මිලියන 41.5 ක් වූ විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන් තිදෙනාම විශ්වවිද්‍යාලීය නිලධාරීන් වූ බව නිරීක්ෂණය විය. | කමිටුව පත්කර ඇත. | අනුව කටයුතු කළ යුතුය. |
| (ii)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 සහ 8.13.4 | අවිනිශ්චිත ප්‍රතිපාදන, ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ඉක්මවා ගිය විට කොන්ත්‍රාත් විචලන සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ අධිකාරී මට්ටම් වෙත ඉදිරිපත් කළ යුතු වුවද පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ සියයට 25 ඉක්මවූ රු. 10,557,915 ක විචලතාවය සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ගන්නා ලද තීරණයන්ට අනුව කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම නොඉක්මවන පරිදි කරන ලද අමතර වැඩ සහ විචල්‍ය අයිතමයන් සඳහා පාලක සහා අනුමැතිය ලබා ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මානව ශාස්ත්‍ර පීඨයේ ලිපිකාරිණියක විසින් පරිගණකගත තොරතුරු වෙනස් කිරීම මඟින් රු. 3,763,349 ක බාහිර කථිකාචාර්ය දීමනා වංචා කර තිබුණු අතර ඒ පිළිබඳව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර ඉන් රු.3,355,624 ක් වාරික 3 කින් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. ඉතිරි රු. 407,725 ක මුදල සහ එයට අදාළ මූල්‍යමය පිරිවැය මෙතෙක් අයකර ගෙන නොතිබුණු අතර බාහිර කථිකාචාර්ය දීමනා ගෙවීම්වලට අදාළ බලය දීම නිර්දේශය සහ අනුමැතිය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විධිමත් විමර්ශනයේ නිර්දේශයන් අනුව ඉතිරිය විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලෙන් අයකර ගැනීමට ඇයගේ කැමැත්ත ලබා ගෙන ඇත. ඇයගෙන් ලැබියයුතු ප්‍රමාණය ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රමිත අනුව මූල්‍ය වාර්තා වල පෙන්වා ඇත. මුදලින් රු.3,355,624 ක් අදාල ලිපිකාරිනිය විශ්වවිද්‍යාලයට ගෙවා ඇත. | වංචා හා වැරදි වැලැක්වීමට හා එවැනි ක්‍රියාවන් අනාවරණය කර ගැනීමටත්, ප්‍රමාණවත් හා යෝග්‍ය නව ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදීමට සහ යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 871,320,870 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 159,969,855 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 711,351,015 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවක පාරිශ්‍රමික හා පාරිතෝෂික වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නව අදහස්, සොයා ගැනීම් සහ තාක්ෂණික දියුණුවත් නව රැකියා වෙළඳපොලත් වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් නව පාඨමාලා හඳුන්වා දීම සිදු කළ යුතු වුවද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පසුගිය වර්ෂ 10 ක කාලසීමාව තුළ 2011/2012 හා 2015/2016 අධ්‍යයන වර්ෂ වලදී පමණක් පිළිවෙලින් නව පාඨමාලා එකක් සහ හතරක් පමණක් හඳුන්වා දී තිබුණි. | විශ්වවිද්‍යාලයේ ඇති සම්පත් සහ වාර්ෂික ප්‍රතිපාදන අනුව නව පාඨමාලා හඳුන්වා දී ඇත. | වාර්ෂිකව සලසනු ලබන මූල්‍ය ප්‍රතිපාදන වැඩිවීමට සමගාමීව නව රැකියා වෙළඳපල ඉලක්ක කර ගනිමින් නව පාඨමාලා හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 101 ක් යටතේ පැවති රු. මිලියන 32 කින්, අදාළ අරමුණ සඳහා උපයෝජනය කර තිබූ මුදල රු.මිලියන 5 ක් හෙවත් සියයට 15.6 ක් පමණ අඩු ප්‍රතිශතයක් වූ අතර ඉන් අරමුදල් 30 ක් යටතේ වූ රු. 20,385,955 ක් අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය නොකර අක්‍රියව පැවතුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 40,074,900 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 36 ක් වසර 04 කට වඩා වැඩි කාලයක සිට උපයෝජනය කර නොතිබුණු අතර එකතුව රු. 4,699,502 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 08 ක් හා එකතුව රු. 73,067,553 ක් වූ විශේෂ අරමුදල් 15 ක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | ශිෂ්‍යත්ව සහ ත්‍යාග අරමුදල් ආරම්භකොට ඇත්තේ විශේෂ අරමුණක් හෝ පරමාර්ථයක් සඳහාය. අදාල අරමුණ හා නිර්ණායකයන් ලභා කර ගැනීමට සමත් වුවහොත් පමණක් උපයෝජයන කරනු ඇත. | අරමුදල් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. |

### 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1994 ජුනි 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1998 වර්ෂය සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 50 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකර නොතිබුණි. | මෙතෙක් ගෙවීම් සිදු කර ඇත්තේ පවරා ගන්නා ලද කොටස් සඳහා වේ. ඉතිරි ඉඩම් ප්‍රමාණය ලබා ගැනීම සඳහා අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලබන අතර ඉක්මනින් විශ්වවිද්‍යාලයට ලබා ගැනීම විශ්වවිද්‍යාලයේද අභිප්‍රාය වේ. | පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 50 වන සංවත්සරය නිමිති කොට ගෙන, ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක් ව්‍යායාම් ශාලාවක් හා පිහිනුම් තටාකයක් සහිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා වූ රු.මිලියන 618 ක ඇස්තමේන්තුවකින් යුක්ත ව්‍යාපෘතියක් නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කරගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2014 පෙබරවාරි 13 දින ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ ශ්‍රවනාගාරය සඳහා උපදේශන ගාස්තු හා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2016 ජුනි 22 දින රු. 5,794,676 ක මුදලක් වැය කර තිබුණ ද මූලික ප්‍රසම්පාදන කටයුතු නිමකොට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම වාර්තාවේ දිනය දක්වාම සිදුකර නොතිබුණි. | මෙය ප්‍රමාදවීමට හේතුව භූමිය නොතිබීම නිසා නොවන අතර මූල්‍ය ප්‍රතිපාදන අදාල අමාත්‍යාංශ වලින් ලබා නොදීමට හේතුවී ඇත. | අදාළ කාර්යයන් ප්‍රමාදයකින් තොරව ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීම සඳහා 2016 මාර්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු. මිලියන 49.14 ක වැට් රහිත පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණු අතර මාස 10 ක් ඇතුළත සමස්ථ ඉදිකිරීම් කටයුතු නිම කළ යුතුව තිබුණි. මුල් පිරිවැය ඇස්තමේන්තුවේ අයිතම කිහිපයක් ඉවත් කර වෙන වෙනම ඇස්තමේන්තු කිරීම හේතුවෙන් ඇස්තමේන්තුව රු. මිලියන 150.4 ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා අනුමත මුල් පිරිවැය ඇස්තමේන්තුව රු. 91,619,877 කින් එනම් සියයට 186 කින් ඉක්මවා තිබූ අතර මෙම ව්‍යාපෘතිය 2020 ජුනි මස 30 දින වන විටත් අවසන් කිරීමටද නොහැකිවී තිබුණි. | ඒ ඒ වර්ෂවල විශ්වවිද්‍යාලයට ලැබෙන ප්‍රතිපාදන අනුව කොන්ත්‍රාත්තුව කොටස් වලට බෙදීම සිදුකර කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූල විය යුතුය.. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 1236 ක් ද අනධ්‍යයන කාර්ය මණ්ඩලය 1173 ක් හා අධ්‍යයන සහයක සහ පරිපාලන කාර්යය මණ්ඩලය 142 ක් ද වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 959 ක්ද, 1045 ක් හා 142 ක් ද විය. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 277 ක් ද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 128 ක් හා අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලයේ තනතුරු 37 ක් ද පුරප්පාඩුව පැවතුණි. | ඉංජිනේරු සහ තාක්ෂණ පීඨයන් අළුතින් ආරම්භ කළ පීඨ බැවින් ඒවායේ තනතුරු සඳහා බඳවා ගනිමින් පවතී. ඇතැම් විශේෂිත විෂයන් සඳහා සුදුසුකම් සහිත ආචාර්යවරුන්ගෙන් අයදුම්පත් නොලැබෙන බැවින් බඳවා ගැනීම ප්‍රමාද වී ඇත. පරිපාලන නිලධාරීන් පත් කිරීම විශ්වවිද්‍යාලය සිදු නොකරන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ එයට අදාළ ප්‍රගති වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | විගණනයට අවශ්‍ය තොරතුරු ලබාදිය යුතුය. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ සැලසුම් සැකසීමේදී මේ සම්බන්ධව අවධානය යොමු කර ඇති අතර ඉදිරි පස් අවුරුදු සැලසුමට අදාල දර්ශක ඇතුලත්ව කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2030 ඉලක්ක වලට අදාලව ආයතනයේ ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2019 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වර්තාවට අනුකූලව ගන්නාලද ක්‍රියාමාර්ග

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA


දුරකථනය
Telephone } 2802695, 2802696
2803191, 2803192

ෆැක්ස්
Fax } 2801604

E. Mail } unisj@sjp ac.lk

මගේ අංකය
My Number }

ඔබේ අංකය
You're Number } HED/D/USJ/FA/19/03

නුගේගොඩ
ශ්‍රී ලංකාව
NUGEGODA
SRI LANKA.

තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
Post office box - 6 - Nugegoda.


2020.09.30

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක HED/D/USJ/FA/19/03 හා 2020 සැප්තැම්බර් 09 දිනැති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණන වාර්තාව හා බැඳේ.

එහිදී යථෝක්ත වාර්තාවේ අදාල පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ
උපකුලපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ
උපකුලපති

ජ්‍යෙෂ්ඨ ම... සුදන්ත ලියනගේ
...ය.
ශ්‍රී ජයව...

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

| 1.2 | තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම | පිළිතුරු |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 76 (ඇ) ඡේදය ප්‍රකාරව වාර්තා කරන දිනෙන් පසුව මාස 12 ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂිත වත්කම් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් එකතුව රු. 298,416,940 ක් වූ කෙටි කාලීන තැන්පතු 42 ක් සහ එකතුව රු. 12,650,598 ක් වූ ඉතිරි කිරීමේ ගිණුම් 09 ක් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 02 මුදල් ප්‍රවාහ ප්‍රකාශන අනුව මුදල යන්නට අතැති හා ඉල්ලුම් තැන්පතු අයත් වේ. ඒ අනුව මුදල් හා සමාන දෑ යනු අගය වෙනස් වීම සම්බන්ධ නොවැදගත් තරමේ අවධානමකට යටත් වූ නිශ්චිත මුදල් වටිනාකමකට පහසුවෙන් පරිවර්තනය කල හැකි කෙටිකාලීනව ඉතා ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජනයන්ය. මේ අනුව විශ්වවිද්‍යාල ස්ථාවර තැන්පතු වල ආයෝජන පරමාර්ථයෙන් මුදල් ආයෝජනය කොට ඇති අතර ආයෝජනය කිරීමේදී ආයෝජනය කල්පිරිමේ කාලයට වඩා කාලච්ඡේද වලට බැංකුව දෙනු ලබන පොලී අනුපාතයද සැලකිල්ලට ගෙන ඇත. කෙටිකාලීන (මාස 03) ස්ථිර තැන්පතු වල තැන්පත් කලද එම තැන්පතු අලුත් කිරීම් වලට යටත්ව ශේෂයන් අදාල අරමුණු සඳහා උපයෝජනය කරන තෙක් ආයෝජනයක් ලෙස පවත්වා ගනු ලැබේ.<br>එසේම ස්ථාවර තැන්පතු කල්පිරීමට පෙර මුදල් කර ගැනීමේදී අඩු පොලී අනුපාතයක් ගෙවන බැවින්ද පාඩු සිදුවේ. එමනිසා මෙම ශේෂයන් මුදල් හා සමාන දෑ යටතට නොව ආයෝජන ලෙස දක්වා ඇත. |
| (ආ) | පර්යේෂණ ව්‍යාපෘති 04 ක් සඳහා මිලදී ගත් එකතුව රු. 2,236,807 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2020 වසරේදී නිවැරදි කිරීම සිදුකිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) පුස්තකාල දත්ත පද්ධතියක වාර්ෂික අළුත්කිරීම් ගාස්තු ලෙස ගෙවන ලද රු. 3,142,905 ක් දෝෂ සහගත ලෙස පුස්තකාල පොත් ගිණුමට හර කිරීම නිසා එම පුස්තකාල පොත් වටිනාකම එම ප්‍රමාණයෙන් හා වර්ෂයේ ක්ෂය රු. 70,608 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | 2020 වසරේදී නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. |
| 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව | | |
| නීතිරීති/ විධානයට යොමුව | විස්තරය | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| XXIV පරිච්ඡේදයේ 3.18 වගන්තිය ප්‍රකාරව | ණය මුදල් අයකර ගැනීමට හෝ අයකර ගැනීමේ සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට හෝ කටයුතු නොකර එකතු වටිනාකම රු. 366,648 ක් වූ ආපදා ණය ලබාගෙන තිබුණු නිලධාරීන් 03 දෙනෙකුට වැටුප් රහිත නිවාඩු ලබා දී තිබුණි. | විගණන විමසුමේ සඳහන් තිදෙනාගෙන් එක අයෙකුගේ ණය මුදල 2019 ජූනි මස සිට අයකරන අතර ඉතිරි දෙදෙනා විශ්වවිද්‍යාලයේ සේවයෙන් ඉවත්ව ඇත. ඔවුන්ගේ මුදල් අර්ථසාධක ආරමුදලින් අයකිරීමට කටයුතු කර ඇත. |
| (ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | | |
| (i) මුදල් රෙගුලාසි 371 (2) හා (5) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) අදාල රෙගුලාසි අනුව අග්‍රිමය නිකුත් කරන මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට පෙර අග්‍රිම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී මුදල් අංශය නිකුත් කරන ලද රු. 388,850 ක | පසුගිය වසරේ සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස වල පැවතුනු සේවක වැඩවර්ජනය නිසා අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇති අතර අදාල අත්තිකාරම් දැනටමත් පියවීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | අත්තිකාරම් 07 ක් සහ පියා හා අරමුදල් මගින් නිකුත් කළ රු. 4,653,014 ක විවිධ අත්තිකාරම් 2019 දෙසැම්බර් 31 වන විටත් පියවා නොතිබුණි. | |
| | (ii) තත්කාර්ය අත්තිකාරම් ලබාගත් නිලධාරියකු අදාළ කාර්යය නිමකළ විගස හෝ දින දහයක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවද එකතුව රු. 4,232,885 ක් වූ අත්තිකාරම් 84 ක් ආපසු පියවීම සඳහා දින 21 සිට දින 164 අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. | පැවතුනු සේවක වැඩවර්ජනය නිසා අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇති අතර ඒවා දැනටමත් පියවීමට කටයුතු කර ඇත. තවද සමහර අත්තිකාරම් අදාල කාර්ය නිමවීමෙන් පසු නියමිත කාලය තුල පියවීමට කටයුතු කර ඇත. |
| | (iii) තත්කාර්ය අතුරු අග්‍රිම රු. 100,000 ක උපරිම සීමාවක් දක්වා ලබා දිය හැකි වුවද එම සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 07 දෙනෙකුට අවස්ථා 15 ක දී රු. 102,240 ක සිට රු. 277,800 ක් දක්වා පරාසයක් තුළ අත්තිකාරම් නිකුත් කර තිබුණි. | සිසුන් විශාල ප්‍රමාණයන් සහභාගීවන ක්‍රීඩා කටයුතු වලදී, පර්යේෂණ කටයුතු වලදී, ක්ෂේත්‍ර චාරිකා වන්හිදී, වරින් වර පැමිණ අත්තිකාරම් ලබා ගැනීමට නොහැකි වීම යන විශේෂ අවස්ථා සලකා උපකුලපති තුමාගේ අවසරය මත.අත්තිකාරම් ලබා දී ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 2014 ජනවාරි 23 දින සිට 2019 මැයි 29 දින දක්වා කාලපරිච්ඡේදය තුළ අවලංගු | මුදල් කමිටු නිර්දේශ මත ආදායමට ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. |

| | | |
|---|---|---|
| | කරන ලද වටිනාකම රු. 1,303,000 ක් වූ චෙක්පත් 161 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | |
| (iii) මුදල් රෙගුලාසි 396 (ඇ) | විශ්වවිද්‍යාලයට අයත් ජංගම ගිණුම් 03 ක මාස 06 කට වැඩි නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ එකතුව රු. 165,877 ක් වටිනා චෙක්පත් 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල චෙක්පත් අවලංගු කොට ආදායමට ගෙන ඇත. |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය | | |
| XX වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කර නොතිබූ අතරම පැමිණීම පිටවීම සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙය විශ්වවිද්‍යාල පද්ධතියටම බලපාන කරුණක් වන බැවින් මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් දිය යුතුය.<br>මෙම කරුණ පෙර වර්ෂ වලදීද පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ සාකච්ඡාවට භාජනය විය. |
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2015 සැප්තැම්බර් | චක්‍රලේඛ ප්‍රකාරව අනුමත ඉන්ධන සීමාව ඉක්මවා විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරුන් 06 දෙනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය | චක්‍රලේඛ ප්‍රකාරව පාලක සභාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අතිරේක ඉන්ධන ගෙවීම් අනුමත කර ඇත. තවද විශ්වවිද්‍යාලය සතු වාහන ඉතා පැරණි බැවින් ඒවා ඉවත් කර අලුතින් |

| | | |
|---|---|---|
| 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | තුළදී රු. 856,569 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 6,797 ක් නිකුත් කර තිබුණි. | වාහන ලබා ගැනීමට ඉල්ලුම් කළද ඒ සඳහා අනුමැතිය ලබාදී නොමැත. |
| (ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 06.05.1 ඡේදය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර 2017 සහ 2018 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටද කටයුතු කර නොතිබුණි. | 2017 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට භාරදී ඇති අතර 2018 වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය වෙත භාරදී ඇත. |
| (ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| (i) රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 2.8.4 ප්‍රකාරව | කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 100 දක්වා වූ කොන්ත්‍රාත් වලට අදාලව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවල අවම වශයෙන් එක් සාමාජිකයෙක් රේඛීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර අදාළ විෂයය සම්බන්ධයෙන් දැනුම ඇති අයෙකු විය යුතු වුවද රු. මිලියන 41.5 ක් වූ විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල | කොන්ත්‍රාත් වටිනාකම අනුව නිසි ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර ඇත. |

| | | |
|---|---|---|
| | විස්තාරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන් තිදෙනාම විශ්වවිද්‍යාලීය නිලධාරීන් වූ බව නිරීක්ෂණය විය. | |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 සහ 8.13.4 | අවිනිශ්චිත ප්‍රතිපාදන, ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ඉක්මවා ගිය විට කොන්ත්‍රාත් විචලන සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ අධිකාරී මට්ටම් වෙත ඉදිරිපත් කළ යුතු වුවද පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ සියයට 25 ඉක්මවූ රු. 10,557,915 ක විචලනාවය සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ගන්නා ලද තීරණයන්ට අනුව කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම නොඉක්මවන පරිදි කරන ලද අමතර වැඩ සහ විචල්‍ය අයිතමයන් සඳහා පාලක සභා අනුමැතිය ලබා ගෙන ඇත. |
| • 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව. | | |
| (අ) විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීම සඳහා 2016 මාර්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු. මිලියන 49.14 ක වැට් රහිත පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණු | | ඒ ඒ වර්ෂවල විශ්වවිද්‍යාලයට ලැබෙන ප්‍රතිපාදන අනුව කොන්ත්‍රාත්තුව කොටස් වලට බෙදීම සිදුකර කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | අතර මාස 10 ක් ඇතුළත සමස්ථ ඉදිකිරීම් කටයුතු නිම කළ යුතුව තිබුණි. මුල් පිරිවැය ඇස්තමේන්තුවේ අයිතම කිහිපයක් ඉවත් කර වෙන වෙනම ඇස්තමේන්තු කිරීම හේතුවෙන් ඇස්තමේන්තුව රු. මිලියන 150.4 ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා අනුමත මුල් පිරිවැය ඇස්තමේන්තුව රු. 91,619,877 කින් එනම් සියයට 186 කින් ඉක්මවා තිබූ අතර මෙම ව්‍යාපෘතිය 2020 ජූනි මස 30 දින වන විටත් අවසන් කිරීමටද නොහැකිවී තිබුණි. | |
| (ආ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 50 වන සංවත්සරය නිමිති කොට ගෙන, ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක් ව්‍යායාම් ශාලාවක් හා පිහිනුම් තටාකයක් සහිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා වූ රු.මිලියන 618 ක ඇස්තමේන්තුවකින් යුක්ත ව්‍යාපෘතියක් නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කරගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2014 පෙබරවාරි 13 දින ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ ශ්‍රවනාගාරය සඳහා උපදේශන ගාස්තු හා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2016 ජූනි 22 දින රු. 5,794,676 ක මුදලක් වැය කර තිබුණ ද මූලික ප්‍රසම්පාදන කටයුතු නිමකොට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම වාර්තාවේ දිනය දක්වාම සිදුකර නොතිබුණි. | මෙය ප්‍රමාදවීමට හේතුව භූමිය නොතිබීම නොවන අතර ප්‍රතිපාදන ලබා නොදීම ප්‍රමාදවීමට හේතුවී ඇත. |
| (ඇ) | රසායන විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීමේ කාර්ය කොන්ත්‍රාත්කරු අත්හැර ගොස් තිබුණු බැවින් 2012 අප්‍රේල් 25 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු. 1,764,013 ක් | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

<table>
<tr><td></td><td>කාර්යසාධන බැඳුම්කරයෙන් අයකරගෙන නොතිබුණු අතර එම මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද නොහැකිව පැවතුණි.</td><td></td></tr>
<tr><td>3.</td><td>අනෙකුත් විගණන නිරීක්ෂණ</td><td></td></tr>
<tr><td>(අ)</td><td>නව අදහස්, සොයා ගැනීම් සහ තාක්ෂණික දියුණුවත් නව රැකියා වෙළඳපොලත් වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් නව පාඨමාලා හඳුන්වා දීම සිදු කළ යුතු වුවද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පසුගිය වර්ෂ 10 ක කාලසීමාව තුළ 2011/2012 හා 2015/2016 අධ්‍යයන වර්ෂ වලදී පමණක් පිළිවෙලින් නව පාඨමාලා එකක් සහ හතරක් පමණක් හඳුන්වා දී තිබුණි.</td><td>විශ්වවිද්‍යාලයේ ඇති සම්පත් සහ වාර්ෂික ප්‍රතිපාදන අනුව නව පාඨමාලා හඳුන්වා දී ඇත.</td></tr>
<tr><td>(ආ)</td><td>විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 42 දෙනෙකු පශ්චාත් උපාධි ලබා ගැනීම සඳහා විදේශගත වී නැවත සේවයට නොපැමිණීම හේතුවෙන් ගිවිසුම කඩවීම මත 2020 ජුනි 30 දිනට රු. 113,714,235 ක බැඳුම්කර වටිනාකමක් අයවිය යුතුව පැවතුණි.</td><td>2019 වර්ෂයේ රු. 24,964,784.54 අයකර ගැනීමට කටයුතු කර ඇත.</td></tr>
<tr><td>(ඇ)</td><td>ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට 2012 වර්ෂයේදී 2758 වන ස්ථානය ලැබී තිබුණද, වසර 07 ක් ගතවීමෙන් පසු සමාලෝචිත වර්ෂය වන විට එම ස්ථානය 2960 දක්වා පසුබැස තිබුණි. ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලදී පර්යේෂණ සහ උපුටා ගැනීම් වෙනුවෙන් සියයට 60 ක ලකුණු ප්‍රමාණයක් ලබා දෙන බැවින් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රගතිය වැඩි දියුණු නොකිරීම ඒ සඳහා හේතු වී තිබුණි.</td><td>Webometrics ක්‍රමය අනුව ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ප්‍රගතියක් අත්කර ගෙන ඇති බව පෙන්නුම් කරයි.<br><table><tr><th>Year (In the Month of July)</th><th>World Ranking</th><th>Sri Lankan Ranking</th></tr><tr><td>2015</td><td>4282</td><td>5</td></tr><tr><td>2016</td><td>3045</td><td>6</td></tr><tr><td>2017</td><td>3365</td><td>6</td></tr><tr><td>2018</td><td>3071</td><td>6</td></tr><tr><td>2019</td><td>2960</td><td>6</td></tr><tr><td>2020</td><td>2362</td><td>5</td></tr></table></td></tr>
</table>

| | | |
|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 1236 ක් ද අනධ්‍යයන කාර්ය මණ්ඩලය 1173 ක් හා අධ්‍යයන සහයක සහ පරිපාලන කාර්යය මණ්ඩලය 142 ක් ද වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 959 ක්ද, 1045 ක් හා 142 ක් ද විය. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 277 ක් ද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 128 ක් හා අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලයේ තනතුරු 37 ක් ද පුරප්පාඩුව පැවතුණි. | ඉංජිනේරු සහ තාක්ෂණ පීඨයන් අළුතින් ආරම්භ කළ පීඨ බැවින් ඒවායේ තනතුරු සඳහා බඳවා ගනිමින් පවතී. ඇතැම් විශේෂිත විෂයන් සඳහා සුදුසුකම් සහිත ආචාර්යවරුන්ගෙන් අයදුම්පත් නොලැබෙන බැවින් බඳවා ගැනීම් ප්‍රමාද වී ඇත. පරිපාලන නිලධාරීන් පත් කිරීම විශ්වවිද්‍යාලය සිදු නොකරන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ. |
| (ඉ) | කොන්ත්‍රාත් වැඩ 92 කට අදාළව 2013 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 116,737,289 ක් වූ රඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙහි ඇති ඇතැම් කොන්ත්‍රාත් නිම වී ඇති අතර ඒවා අවසන් කිරීමෙන් පසු රඳවූ මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. ඉතිරිය අදායමට ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ඊ) | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂය තුළ වසර 2 සිට වසර 3 දක්වා කාල පරාසයකට අදාලව එකතුව රු.241,980 ක් හා වසර 3ක් හා ඊට වැඩි කාලපරාසයකට අදාළව එකතුව රු.1,145,505 ක් විය. | 2020 වසරේදී රු.217,680 ක මුදලක් අයකර ගෙන ඇත. මීට අමතරව දෙදෙනෙකු සඳහා කම්කරු උසාවියේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් අදාල කාර්ය නිමවූ පසු අයකිරීමට කටයුතු කෙරේ. ඉතිරි ණය මුදල අර්ථසාධක අයකිරීමේදී අයකිරීමට කටයුතු කරනු ඇත. |
| (උ) | 1994 ජුනි 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1998 වර්ෂය සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 50 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකර නොතිබුණි. | මෙතෙක් ගෙවීම් සිදු කර ඇත්තේ පවරා ගන්නා ලද කොටස් සඳහා වේ.ඉතිරි ඉඩම් ප්‍රමාණය ලබා ගැනීම සඳහා අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලබන අතර ඉක්මනින් විශ්වවිද්‍යාලයට ලබා ගැනීම විශ්වවිද්‍යාලයේද අභිප්‍රාය වේ. |

| | | |
|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 101 ක් යටතේ පැවති රු. මිලියන 32 කින්, අදාළ අරමුණ සඳහා උපයෝජනය කර තිබූ මුදල රු.මිලියන 5 ක් හෙවත් සියයට 15.6 ක් පමණ අඩු ප්‍රතිශතයක් වූ අතර ඉන් අරමුදල් 30 ක් යටතේ වූ රු. 20,385,955 ක් අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය නොකර අක්‍රීයව පැවතුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 40,074,900 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 36 ක් වසර 04 කට වඩා වැඩි කාලයක සිට උපයෝජනය කර නොතිබුණු අතර එකතුව රු. 4,699,502 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 08 ක් හා එකතුව රු. 73,067,553 ක් වූ විශේෂ අරමුදල් 15 ක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | ශිෂ්‍යත්ව සහ ත්‍යාග අරමුදල් ආරම්භකොට ඇත්තේ විශේෂ අරමුණක් හෝ පරමාර්ථයක් සඳහාය. අදාල අරමුණ හා නිර්ණායකයන් ලඟා කර ගැනීමට සමත් වුවහොත් පමණක් උපයෝජයන කරනු ඇත. |
| (එ) | මානව ශාස්ත්‍ර පීඨයේ ලිපිකාරිණියක රු. 3,763,349 ක බාහිර කථිකාචාර්ය දීමනා පරිගණකගත තොරතුරු වෙනස් කිරීම මඟින් වංචා කර තිබුණු අතර ඒ පිළිබඳව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර ඉන් රු.3,355,624 ක් වාරික 3 කින් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. ඉතිරි රු. 407,725 ක මුදල සහ එයට අදාළ මූල්‍යමය පිරිවැය මෙතෙක් අයකර ගෙන නොතිබුණු අතර බාහිර කථිකාචාර්ය දීමනා ගෙවීම්වලට අදාළ බලය දීම නිර්දේශය සහ අනුමැතිය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විධිමත් විමර්ශනයේ නිර්දේශයන් අනුව ඉතිරිය විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලෙන් අයකර ගැනීමට ඇයගේ කැමැත්ත ලබා ගෙන ඇත. ඇයගෙන් ලැබියයුතු ප්‍රමාණය ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රමිත අනුව මූල්‍ය වාර්තා වල පෙන්වා ඇත.<br>මුදලින් රු.3,355,624 ක් අදාල ලිපිකාරිනිය විශ්වවිද්‍යාලයට ගෙවා ඇති අතර ඇයගෙන් ලැබුණු මුදල බාහිර කථිකාචාර දීමනා ගිණුමට බැර කිරීම නිසා එහි වියදම අඩුවී නොමැති අතර දෙවතාවක් ගෙවීම් සිදු වී ඇති අවස්ථා හා නොගෙවූ දීමනා ගෙවීම් කිරීමෙන් පසු නැවත අයකර ගන්න ලද මුදල අදාළ ගිණුමට බැර කර තව දුරටත් කථිකාචාර්යවරුන් සඳහා ගෙවිය යුතුව ඇති දීමනා සඳහා වෙන් කිරීම් සිදු කර ඇත. |

| | | |
|---|---|---|
| (ඒ) | විශ්වවිද්‍යාලයේ වැටුප් වාර්තාකරණ පද්ධතියෙහි පැවති අඩුපාඩු 11 ක් හේතුවෙන් පද්ධති විගණනයක් සිදුකර මෘදුකාංගයේ අඩුපාඩු හඳුනාගෙන නව පරිගණක පද්ධතියක් හඳුන්වා දීමට 2016 අගෝස්තු මාසයේ දී පාලක සභාව තීරණය කර තිබුණ ද 2020 ජුනි 30 දින වන විටත් නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. | අදාල විගණන වාර්තා වලින් පෙනවා දෙන ලද මෘදුකාංගයේ පවතින අඩුපාඩු මේ වන විටත් නිවැරදි කර ඇති අතර ව්‍යාපාර සම්පත් සැලසුම් කිරීමේ මෘදුකාංගයක් (ERP) මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. |
| (ඔ) | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ සැලසුම් සැකසීමේදී මේ සම්බන්ධව අවධානය යොමු කර ඇති අතර ඉදිරි පස් අවුරුදු සැලසුමට අදාල දර්ශක ඇතුලත්ව කටයුතු කිරීමට සැලසුම් කර ඇත. |

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ
උපකුලපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ
උපකුලපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.